

# සුගතවිදත්ථි විධානය.

# සුගත විදත්ථි විධානය.

සියලු බෝධිසත්වයින් දැනගත යුතුවූ
බුද්ධරාජාණන් වහන්සේගේ
ශරීරප්‍රමාණයහා වියත් ප්‍රමාණාදීන්ද මෙහි ප්‍රකාශිතයි

සියම්රට
රතනකොසින්ද මහා නගරයෙහි
පවරනිවෙස විහාරාධිපතිව වැඩවිසූ
**ප්‍රවරෛශ්වර්‍ය්‍යශීලාලඞ්කාරණ මහාසංඝරාජ ස්වාමිපාදයන්**
වහන්සේ විසින් සඞ්ගෘහීතයි.

දෙඩන්දූවෙ
ශෛලබිම්බාරාමයෙහි නිවාසී
**ආචාර්‍ය්‍ය ශීලක්ඛන්ධාභිධාන ස්ථවිරයන් වහන්සේ විසින්**
ලියනලද භාවසන්නයෙන් යුක්තයි.

**ඩී. බී. ශ්‍රීවර්ධන විසින්**
අම්බලම්ගොඩ
විද්‍යාප්‍රකාශමුද්‍රායන්ත්‍රාලයෙහි
මුද්‍රණයකරවනලදී.

ශ්‍රීබුද්ධවර්ෂ
2438

# SUGATA VIDATTHI VIDHANA.

## A DESCRIPTION OF THE SIZE OF LORD BUDDHA'S BODY

BY

**THE VENERABLE PRAWARAIS WARYALANKARNA.**

SANGHARAJA

OF THE PAVARANIVESA VIHARA,

AT BANGKOK

SIAM

WITH A PARAPHRASE

BY

**THE REV. C. A. SEELAKKHANDHA**

OF SAILABIMBARAMA VIHARA.

DODANDUWA

CEYLON

PRINTED BY

D. B. SIRI WARDHANA

AT THE VIDYAPRAKASAPRESS

AMBALAMGODA

1894

# INTRODUCTION.

THIS valuable treatise "Sugatavidatthividhāna" was compiled in the year 2388 A. B. or 50 years ago by the Venerable Paññā. Agga of Pawaraiswarayālankarana Sangha Rāja, a famous scholar well-versed in Buddhist Law as well as in literature and science, who flourished in the Royal monastery "Pawara Niwēsa" at Bangkok in Siam, at the request of the Rev. Kakusanda Sthavira. It is also mentioned here that the compilation of this work was done with the assistance of the author's teacher, His Imperial Majesty Maha Mongkut, the late King of Siam, who was himself a scholar of world-wide renown, a fact which carries great weight with the book, while the approbation it has received from three of the most eminent scholars and famous Buddhist monks of Siam, viz: Ṇānarakkhita, Amaramōli, and Sirivisuddhiwaṁsa, is also worthy of notice these scholars having been known to the majority of the leading Ceylonese for some time. It is hardly necessary here to dwell at length upon the value and usefulness of this little volume, as the reader will find no difficulty in observing them.

This gives a description of the size of Our Lord (Gautama) Buddha's body, and a comparison of the carpenter's measurements with those of the human hand. Suffice it to say that the reader will obtain more information in this respect from this book than can be had from any other similar treatise, with illustrations of several facts by means of numerous examples both scientific and religious. Those who are desirous of making themselves acquainted with the size of the Lord Buddha's body will find this book well adapted to the purpose, and should, therefore, make a careful perusal of it.

There have been several opinions expressed with regard to this question: some saying that Our Lord was eighteen cubits (!) in height (that being, according to them, the height of an ordinary human being those days), while others say that He was not taller than a man of the present day. This diversity of opinion has existed even among the European students and the educated classes of this country. A correct solution of this important problem will

be found in this book with passages quoted from the Buddhist Pitakas and their commentaries as an authority. There may be some points which the reader might not be able to grasp on the first reading, but a second or third perusal will enable him to understand them thoroughly.

Also this book can be successfully utilized as a guide to the measurements of length, &c. as expressed by Lord Buddah in the Vinaya Pitaka.

The author, with the benevolent expectation of making his work useful to the world, says at the conclusion: "yō imaṁ passati, (he) who sees this book; sō maṁ passati, sees me; yō imaṁ paññāya vicārēti, (he) who peruses it; sō mayā saddhiṁ kathā sallāpaṁ karōti, converses with me," &c.

With a view to make this book useful to those who are not acquainted with the Pāli language also, I have written a paraphrase in Sinhalese, which is here printed together with the original Pāli text.

C. A. SEELAKKHANDHA.

"Sailabimbārāma"
Dodanduwa,
16th July, 1894.

# විඥාපනය.

සුගතවිදත්ථිවිධානය නම්වූ මෙම ශාස්ත්‍රීය ධර්මප්‍රකරණය මීටඅවුරුදු 50 කටපමණ පූර්වයෙහි හෙවත් ශ්‍රීබුද්ධවර්ෂ 2388 වෙනි සංවත්සරයෙහිදී සියම්රටනගරකොසින්ද මහානගරයෙහි පවරනිවෙසනම් රාජකාරාමයෙහි වැඩවිසූ ධර්මවිනයෙහිහා ශබ්දශාස්ත්‍රයෙහි පරිචිත විපුලතර බුද්ධියක්ඇති න්‍යායවෛශෙෂිකාදි අන්‍යශාස්ත්‍රයන්හිද නිපුණවූ අනෙකගුණගණාඪ්‍ය සඞ්ඝනාමූ පක්ඛුඅගගායන අපරනාමොපලක්ඛිත ප්‍රවරෙරශ්මියශීලධිකාරණ මහාසඞ්ඝරාජ මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් කාශ්‍යපසඳනාම් එක්තරා ස්ථවිර කෙනෙකුගේ ආරාධනාවෙන් කරණලද්දේය.

මේප්‍රකරණය තමන්වහන්සේගේ ආචාර්ය්‍යවූ සියමේ බැන්කොක් නුවර රාජාභිපදප්‍රාප්ත දෙශදෙශාන්තරයෙහි පතළ මහත්කීර්ති ප්‍රතාපාලඞ්කෘත ප්‍රශස්තපණ්ඩිතවරයෙක්වූ පණ්ඩිතශිරොමණීභූත පරමෙශ්‍ර මහාමකුට සමමත වජිරඤාණ මහරජතුමන්ගෙ මහා උපදෙශයක්ඇතිවකලබව මෙහිමසඳහන්ව තිබෙනනිසා ග්‍රන්ථගෞරවසට ඒඅතිශය කාරණයකි. එසේම ධර්මවිනයෙහිහා නානාශාස්ත්‍රයෙහි පටුතරබුද්ධිප්‍රභාවවූ සද්ධර්මරක්ඛිත අමරමෞලි සිරිවිපුලවංස යන සියම්රටේ ප්‍රසිද්ධපණ්ඩිතමහාස්ථවිර තුන්නමක් විසින් මේපොත සෑදීමට උපස්ථම්භකවීතිබෙන එකත් ග්‍රන්ථගෞරවය සඳහා සැලකියයුතු තවත්වැදගත් කරුණකි, මෙකී මහාස්ථවිරවරු ලොක්දිව වැදගත් බොහෝදෙනා කලකසිට දැනහැඳින සිටිනනිසා මේපොත ගැණ මෙහිදී බෙහෙවින් වර්ණනා නොකළාට පොත කියවා බලන සිහිඇතිකාටත් මෙහිඅගය මනාසේ වැටහෙනවාඇත.

මේපොතේ අපගෞතම බුදුරජානන් වහන්සේගේ ශරීරප්‍රමාණයහා රියන් වියත් අඟල් ප්‍රමාණගැණද මධ්‍යමපුරුෂයාගේ රියන් වියත් අඟල් ප්‍රමාණගැණද වඩුවන්ගෙ රියන්වියත්අඟල්ප්‍රමාණ ගැණද අන්‍යකොයි පොතකවත් නොකීතරම් නොයෙක් ආගමයුක්ති උදාහරණාදිය පෙන්වීමෙන් ඉතාවිස්තර වශයෙන් විශෙෂවිභාගදක්වා සලිත්අපගෞතම බුදුරජානන්වහන්සේගෙ ශරීරප්‍රමාණය විනිශ්චය කරතිබෙනරහ ඉතාප්‍රශංසනීයයි, මේකාරණය දැනගන්ටකැමති හැමදෙනාවිසින් මේපොත ආදරයෙන් කියවියයුතුයි, මෙබඳුපොතකින් මේකාලේදී ලොකයාටඇති ප්‍රයොජනය ඉතාමහත්ය, එනම්අප ගෞතම බුදුරජානන්වහන්සේගේ උසප්‍රමාණයගැණ මෙකල පණ්ඩිතාපණ්ඩිත නොයෙක් දෙනාඅතර තැන්තැන්වල නිතරවාදවිවාද පවතියි, එසේ පැවැත්මට ඇති හෙතුව නම් සමහරකෙනෙකුන්ගේ මතවලහැටියට ගෞතම බුදුරජාන්-

වහන්සේගේ උසප්‍රමාණ දහඅට රියනක්යයිද, සමහර කෙනෙක් ඔයතරම්වියනොහැකියයිද සමහරකෙනෙක් ප්‍රකෘති මනුෂ්‍යයන්ට වඩා උස්නොවිය හැකියයිද මෙසේ නොයෙක්ලෙස එකිනෙකට විරුඬව කියනමේ කිමුයි.

යුරෝපාදි රටවල උගතුන්ගේද අපරට යුරෝපියශාස්ත්‍ර භාවිතා කරන්නන්අතරේද මේගැණවෙනත් නොයෙක්විරුඬමත ඇතුවතිබේ, බොහෝදෙනඅතර නොයෙක් විරුඬමත ඇතුව තිබෙන දනගැණීමට ඉතාමඕනෑකරණ මෙතරම් වැදගත් කාරණයක් නිශ්චය වශයෙන් දැනගැණීමට සෑහෙනතරම් පෙල අටුවා ටීකාදි සාරවත් නොබිඳියහැකි වැදගත් කියමන්රාශියක් ඇතුලත්කොට මේ පොත කරතිබෙනරඟ සියලුදෙනාටම තේරුම්ගැණීමට ඉතාපහසුයි, ඇතැම්තැන පෙලඅටුවාටීකා පාඨවලඅදහස්එකට දක්වීම නිසා වහා නොවැටහෙන තමුත් නැවත නැවත බැලීමෙන් ඒද තේරුම් ගන්ටහැකිවෙයි.

තවද විනයපිළිබඳ ශික්ෂාපදකීපයකම ප්‍රකාශවතිබෙන දනගැණීමට පවා දුෂ්කරවූ සුගත්වියත්අඟුල්ප්‍රමාණාදිය ගැනත්වදනඉගෙණ විනයෙහිනියමයලෙස පිළිපදිනුකැමැත්තන්ටත් මෙපොතෙන් ඉතාමහත් ප්‍රයොජනයක් අත්පත්කරගන්ටහැකිය.

මේපොතේකතෘවරයා තමන්ගෙපොත ආදරයෙන්නිතර භාවිතාකරවා එයින්ලොකයාට වැඩක්සාදවාදෙන කරුණාඩ්‍යාසයෙන් පොතඅවසානයේදී 'යොඉමංපස්සති' යමෙක් මේපොතදක්ද 'සොමංපස්සති' ඔහුමාබලයි 'යොඉමංපොත්ථකංවිචාරෙති' යමෙක් මේ පොත භාවිතකින්සොයාද, 'සොමයාසද්ධිංකථාසල්ලාපංකරොති' ඔහු මාහාසම්ග කතාබස්කරයි යනාදීන් දක්වාතිබේ.

මේආදි කියනොහැකි අනන්තප්‍රයොජන මේපොතෙන් මේකාලේදී ලබන්ට හැකිවතිබෙනනිසා පාලිභාෂාව තේරුම්ගන්ට නොහැකිඅයට මේපොතෙන් ප්‍රයොජනගැණීම ආපුලුවන්බැවින් කාටත් තේරුම්ගැණීමට පහසුවනපරිද්දෙන් සිංහල භාෂාවෙන් ඊට භාවසන්නයක්ලියා සන්නසහිතව මුද්‍රණයකරවිමු.

මේපොත රැගෙණ සමාදරයෙන් කලක් පරිශීලනය කරණ යමෙකුට මෙයින්ලැබියහැකි විපුලප්‍රයොජනගැණ මෙහිදී වැඩියමක් කියන්ට ඕනෑනැත.

C. A. SEELAKKHANDHA,

වර්ෂ 1894 ක්වූ ජුලිමස
16 වෙනිදිනදීය.

# සුගතවිදත්ථිවිධානය

**නමො තසස**
**භගවතො අරහතො සමමා සමබුඩසස.**

නමො තසසා රහනතසස  භගවනතසස තාදිනො,
සමමා සාමං විබුද්ධසස  ධමෙම විභජජවාදිනො.

නමො තසෙසව ධමමසස  නිය්‍යාණිකසස වටටතො,
පභෙද නවවිධසස  සු අකඛාතසස සචචතො.

නමො අරිය සංඝසස  සකඛිභූතසස සත්‍ථුනො,
කිලෙසානුසයෙ සබෙබ † පහාය පටිපතතියා.

---

ප්‍රකරණකරණයෙහි සමාරාධිතවූ මේ ආචාර්‍ය්‍යයෝ තමන්විසින් ප්‍රාරබ්ධග්‍රන්ථයාගෙ අවිඝ්න පරිසමාප්තිය පිණිසත් ශ්‍රොතෘජනයාගෙ ඓහලෞකික පාරලෞකිකාර්ථ සිද්ධිය සුවසේ කරවනුපිණිසත් ග්‍රන්ථාරම්භයෙහි පළමුකොට රත්නත්‍රයට ප්‍රණාමදක්වූහ.

ඒ කෙසේයත්?

පාපකරණයෙහි රහොභාවාදි අර්ථයෙන් අර්හත්වූද භාග්‍යවන්ත තාදි අර්ථයෙන් භගවත්වූද ඉෂ්ටයෙහි හා අනිෂ්ටයෙහි එකස්වරූප වූද අප්‍රතිහත ඥානාචාරයෙන් මනාකොට පරොපදෙශ රහිතව ස්වයම්භූඥානයෙන් තමන්වහන්සේ විසින්ම විශෙෂ විභාග පරිකල්පනාවශයෙන් චතුඃසත්‍යාව බොධයකළාවූද හීන ප්‍රණීතාදි භෙද භින්න සර්වධර්මයන් විභාගකොට දෙශනාකරණසුළුවූද ඒ සර්වඥයන් වහන්සේට (මාගේ කායාදි ද්වාරත්‍රයෙන් සකසා) වැඳිමයි.

සංසාරවෘත්තයෙන් හෙවත් කර්මවෘත්ත කෙලශවෘත්ත විපාකවෘත්ත යන ත්‍රිවිධවෘත්තයෙන් (සත්වයන්) එතරකරන්නාවූ ප්‍රභෙදහෙයින් නවවිධවූ සංවෘතිසත්‍ය පරමාර්ථසත්‍යවශයෙන් මොනවටවදුරණලද සර්වඥයන්වහන්සේ පිළිබඳවූම් (පය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධවශයෙන් ත්‍රිවිධවූ) ශ්‍රීසද්ධර්මයට (මාගේ) වැඳිමයි.

මනාපිළිවෙත් කරණකොටගෙණ සියලුකෙලෙසුන් හා අනුසයන් ප්‍රහීනකොට ශාස්තෘන්වහන්සේට සාක්ෂිභූතවූ අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහාසංඝයාට (මාගේ) වැඳිමයි.

---

† "පහානපටිපතතියා" සියම් පොතේ,

ඉදානි වණණයිසසාමි විදත්ථිං සුගතසසපි,
අඞගුලිඤ්ච සමාරබභ සාරත්ථ මභිකඞ්ඛතං.

යො පොසො අත්ථකාමො ච ධමමකාමො ච පෙසලො,
අත්තනො ච පරෙසඤ්ච හිතත්ථපපරියෙසකො.

විතකෙකනෙතා සමාරබභ සුගතසස විදත්ථියා,
තාගගතො තතනු සිකඛාය ඉමං සුණාතු සාධුකනති.

යො සො භගවා හිතෙසී අනුකමපකො සාවකෙ අනුකමපමානො අත්ථවසෙ පටිචචසාවකානං සිකඛාපදං පඤ්ඤපෙසි, සො කත්ථචි සුගතවිදත්ථිවසෙන පඤ්ඤපෙසි කත්ථචි සුගතඞගුලවසෙන, සො හිභගවා මනුසසයොනියං ජාතො, මනුසෙසායෙව අහොසි, පුඤ්ඤසමපදාය රූපසිරිසමපනෙනා, න යකෙඛා න පෙතො න තිරචඡානගතො, සුපපතිඨිතපාදො මුදුතලුණ හත්ථපාදොති ආදිනානයෙන දසසිත මහාපුරුසලකඛණසමපනනං යෙව මනුසසත්තභාවං අලභි.

---

සාරාර්ථයවූ නිර්වාණයදෝහෝ අර්හත්ඵල විමුක්තිය කැමතිවන්නා වුන්ට නොහොත් සාරාර්ථයවූ (සුගත්වියතපිළිබඳ) ස්ථිරකාරණය (දූනගන්ට) කැමැත්තාවූ යොගාවචරයන්ට සුගත්වියතද සුගත්අඟුලද අරබයා මේ ප්‍රස්තුතප්‍රස්තාවෙහි හෙවත් මේ කාලයෙහි (පාල්‍යර්ථකථාදිනයින්) වර්ණනාවක් කරන්නෙමි.

අර්ථකාමීවූද ධර්මකාමීවූද ප්‍රියශීලීවූද යම් පුරුෂයෙක්තෙම තම හටද පරහටද හිතවැඩසොයන්නේද,

(ඒ පුරුෂතෙම) සුගත් වියත අරබයා කල්පනාකරන්නේ ඒ සුගත්වියතපිළිබඳ කල්පනාවට පැමිණියේ ඒසුගත්වියත ඉගෙණීමපිණිස මේ වක්‍ෂ්‍යමාන ප්‍රකරණය (අර්ථව්‍යඤ්ජන සම්පූර්ණකොට) මනාව ශ්‍රවණයකරාවා.

යම් ඒ සර්වඥවරයෙක් හිතෙසීවූයේ අනුකම්පාඇත්තේ ශ්‍රාවකයන්කෙරෙහි අනුකම්පාකරමින් ඒ ඒ ප්‍රයොජනඋදෙසා ශ්‍රාවකයන්ට ශික්‍ෂාපද ප්‍රඥප්තිය කලසේක්ද, උන්වහන්සේ ඇතැම්තැන සුගත්වියත් වශයෙන්ද ඇතැම් තැන සුගත්අඟුල් වශයෙන්ද (ශික්‍ෂාපද) පැණවූසේක, ඒ භාග්‍යවත්තෙම මනුෂ්‍යයොනියෙහි උපන්නේ මනුෂ්‍යයෙක්ම වූයේය, පුණ්‍යසම්පත් කරණකොටගෙණ රූපශ්‍රීන් සමන්විතවූයේය, යක්‍ෂයෙක්නුවූයේය, ප්‍රෙතයෙක්නුවූයේය, තිර්යක්ගතයෙක් නුවූයේය, සුප්‍රතිෂ්ඨිතවූ පාදඇත්තේය, මෘදුමොලොක්වූ හසතපාද ඇත්තේය, මේ ආදී ක්‍රමයෙන් දක්වනලද මහාපුරුෂලක්‍ෂණයෙන් සමන්විතවූම මනුෂ්‍යාත්මභාවය ලැබූසේක.

සබ්බඤ්ඤුහිදං මහාපුරුසලක්ඛණං ඤාපනත්ථාය ඨපිතං සාධූහි සප්පුරිසෙහි පඤ්ඤාය අනුවිචාරෙතබ්බං, න පොරාණකානං සද්ධාය යෙව ගන්තබ්බං, න මයං පොරාණකානං මනුස්සානං දාසා, යථෙතරහි මයං භගවන්තං චිරපරිනිබ්බුතං න පස්සාම, තථෙව පොරාණකා අට්ඨකථාචරියාපි තඤ්ඤෙව භගවන්තං න පස්සිංසු.

නනු පරිනිබ්බාණ සමයෙ ආයස්මතො ආනන්දස්ස ඉමං වචනං භගවතා වුත්තං, "යොවො ආනන්ද මයා † ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා"ති"

අයම්පි පාඨො සාධූහි සප්පුරිසෙහි උපපරික්ඛිත්වා ධාරෙතබ්බො, ධාරෙත්වාච පන විචාරෙතබ්බො, සුගතවිදත්ථිචෙසා සඤ්ඤාචික සික්ඛාපද වණ්ණනාය මෙව සංවණ්ණිතා, සුගතවිදත්ථි නාම. ඉදානි මජ්ඣිමස්ස පුරිසස්ස තිස්සො. විදත්ථියො වඩ්ඪකී හත්ථෙන දියඩ්ඪො හත්ථො හොතීති.

---

මේ සියල්ලම මහාපුරුෂලක්ෂණය හැඟවීමපිණිස තබනලදී යහපත්වූ සත්පුරුෂයන් විසින් නුවණින් නැවතනැවත සෙවිය යුතුයි, පෞරාණිකයන් පිළිබඳ ඇදහීමෙන්ම අවබොධනොකොට යුතු හෝ නොයායුතුයි, අපි පුරාතන මනුෂ්‍යයන්ගෙ දාසයෝ නොවෙමු, යම්සේ මෙකල අපි පිරිනිවී බොහෝකල්ඉක්මුනු භාග්‍ය වතුන්වහන්සේ නොදක්නෙමුද, එසේම පුරාතන අටුවාචාරීහුද ඒ භාග්‍යවතුන්වහන්සේ නුදුටුවාහුය.

බුදුරජානන්වහන්සේ විසින් පිරිනිවන්පානා වේලෙහි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේට මේ වචනය වදාරණලද්දේ නොවේද? "ආනන්දය මාවිසින් තොපට යම් ධර්මයක් යම් විනයක් දෙශනාකරණලද්දේද, පණවනලද්දේද? ඒ ධර්මය ඒ විනය මගේ ඇවෑමෙන් තොපට අනුශාසක වන්නේය".

මේ පාඨයත් යහපත්වූ සත්පුරුෂයන් විසින් නැවත නැවත පරීක්ෂාකොට දැරියයුතුයි, ධාරණයකොටද සෙවියයුතුයි, මේ සුගත් වියතද සංයාචික කුටිකාර ශික්ෂාපද වර්ණනාවෙහිදීම විස්තරවශයෙන් වර්ණනාකරණලද්දීය, සුගත්වියතනම් මේ කාලයෙහි මධ්‍යම පුරුෂයාගෙ තුන්වියතෙක, වඩුරියනෙන් එක්රියන් සමාරක්ද වෙයි.

---

"නප්‍රහෘෂ්‍යති සම්මානෙ නාවමානෙ න කුප්‍යති,
නක්‍රුද්ධඃ පරුෂංබ්‍රූයා දෙතද් සාධු ලක්ෂණම්"

සම්මානකිරීමෙහිදී සතුටුනොවේද අවමන්කිරීමෙහි නොකිපේද කිපීපරුෂවචන නොකියන්නේද මේ වනාහිසාධුන්ගෙ ලක්ෂණයි.

(† "සොවොආනන්දමයාදෙසිතොපඤ්ඤත්තොධම්මොචවිනයොච"සියම් පොතේ,

උපරූපරි ආගතානං සුගතවිදත්ථි පටිසංයුත්ත සික්ඛාපදානං වණ්ණනාට්ඨානෙසු න කිඤ්චිවුත්තං තෙනෙව නයෙන තස්සා ගහෙතබ්බත්තා, සා ච වණ්ණනා න එකංසෙන සද්ධාතබ්බා හොති, සා හි ඔහීලිතා අවහීලිතා, අට්ඨකථාචරියාහි පුබ්බෙ අම්හාකං ආචරියභූතා, අනෙකෙසු සාරතො අත්ථං සංවණ්ණෙසුං, මයම්පි තෙ නිස්සාය ඉධ සාසනෙ පඤ්ඤාය වුඩ්ඪිං පත්තා, ඉමස්මිං ඔපනට්ඨානෙ අම්හෙහි න සක්කා සද්ධාය අනුපටිපජ්ජිතුං, මය්හං එවං ඛන්ති, වීමංසිත්වා ගහෙතබ්බං, සචෙ නරුච්චති නගහෙතබ්බං, සුගතවිදත්ථිනාම බුද්ධස්ස භගවතො උප්පත්තිකාලතො පට්ඨාය යාවපරිනිබ්බාණා එත්ථන්තරෙ මජ්ඣිමස්ස පුරිසස්ස හත්ථප්පමාණං, ඉදානි වඩ්ඪකීනං එකඞ්ගුලුත්තර හත්ථො හොති. වඩ්ඪකීනං පන එකකලායසහ අඩ්ඪඞ්ගුලුත්තර හත්ථො සුගතස්ස හත්ථප්පමාණො හොති.

තථාපි සුගතවිදත්ථි පමාණවසෙන ගය්හමානා වඩ්ඪකීනං වීහානුකලාහි සහ චතුරඞ්ගුලුත්තර විදත්ථිපමාණා හොතීති, වුත්තං

---

මතුමත්තෙහි ආවාවූ සුගත්වියතපිළිබඳ ශික්‍ෂාපද වර්‍ණනාකරණ තැන්වලදී කිසිවක් නොකියනලද්දේ ඒනයින්ම (නොකීසෙසුතන් හිදු) සුගත්වියත සම්බන්ධවර්‍ණනාව ගතයුතුහෙයිනි. * ඒ වර්‍ණනාව ඒකාන්තයෙන් නොඇදහිය යුතුවෙයි, ඒ වනාහි ඔහීලිත අවහීලිතද වෙයි, අටුවාචාරීහු පෙර අපගේ ආචාය්‍ර්‍යයෝවූහ, නොයෙක්තන්හී සාරවශයෙන් අර්‍ථ වර්‍ණනාද කොළෝය, අපිදු උන්වහන්සේලානිසා මේ බුදුසස්නෙහි ප්‍රඥාවගෙවැඩීමට පැමිණියෝවෙමු, මේ ස්ථානයෙහිදී (උන්වහන්සේලාගෙ කීම) අප විසින් ඇදහීමෙන් පිළිපදින්ට නොහැකිය, මගේ කැමැත්ත මෙසේය, ඒ විමසා ගතයුතුයි, ඉදින් රුචිනොවේනම් නොගතයුතුයි, සුගත්වියතනම් භගවත් සම්බුදුන්ගෙ උත්පත්ති කාලයෙහිපටන් පිරිනිවන්පාන කාලයදක්වා මේ අතර (ඇතිවූ) මධ්‍යම පුරුෂයකුගෙ රියනකප්‍රමාණය, මෙකල වඩුවන්ගෙ එක්රියන් එක්අඟුලක්වෙයි, වඩුවන්ගෙ වනාහි එක්රියන් අටඟුල් එක්කලාවක් සුගත්රියනේ ප්‍රමාණයවෙයි.

එසේද වුවත් සුගත්වියත ප්‍රමාණවශයෙන් ගනුලබනනී වඩුවින්ගෙ එක්වියත් සතරඟුල් දෙඅනුකලාවක් පමණවෙයි, "ලාමක

---

* මෙහිදී අටුවාවට දෙස්පැවරුවායයි සමහරුගරහත්නේමා ඒනොමැනවි ඒමක්නිසාදයත්? ආගමයුක්තියට විරුඬදෙයක් කවුරුන්විසින්කිවත් නොගෙන හැරදැම්මබුදුන්ගෙ නියමයක්හෙයිනි.

හෙතං අට්ඨකථාචරියෙහි, "ලාමකපරිච්ඡෙදෙන කසිණමණ්ඩලං විදත්ථිචතුරඞ්ගුලවිත්ථාරං වට්ටං කාතබ්බන්ති ච බිම්බොහනස්ස විනද්ධං කොණානං අන්තරං මිනියමානං විදත්ථිචෙව චතුරඞ්ගුලඤ්ච හොතීති ච"

තඤ්චඛො පොරාණකෙහි සංවණ්ණිතං ඉමස්මිං ඨානෙ අත්ථසාධකන්ති වෙදිතබ්බං.

අනෙකෙසුඛො ඨානෙසු ධම්මො ච විනයො ච භගවතා දෙසිතො පඤ්ඤත්තො, තත්ථතත්ථපි ආගතට්ඨානෙසු පරියෙසිතුං යුජ්ජෙය්‍ය, මයඤ්හි ධම්මඤ්ච විනයඤ්ච විනා නසක්කොම අත්තනො පතිට්ඨංකාතුං තස්මාති හමෙහහි විචාරෙතබ්බං, විනයෙඛො ඉදමාගතං, 'තෙනඛොපන සමයෙන ආයස්මා නන්දො භගවතො මාතුච්ඡා පුත්තො අභිරූපො හොති දස්සනීයො පාසාදිකො චතුරඞ්ගුලොමකො භගවතා, සො සුගතචීවරප්පමාණං චීවරං ධාරෙතීති". ඉදං නිදස්සනං.

තදාහි ආයස්මා නන්දො භගවතා චතුරඞ්ගුලඔමකො අහොසි, භගවා පිට්ඨොකං ආයස්මතා නන්දෙන උබ්බෙධකායො අහොසි, තස්මාපි සො නන්දො භගවතො සාවකොපි සමානො භගවතො චීවර

---

පරිච්ඡෙදයෙන් කසිණමණ්ඩලය එක්වියත් සතරඟුල් පුළුලවට කළයුතුය, කොට්ටයේ දෙකොණ අතරමනිනු ලබන්නේ එක්වියත් සතරඟුලක් පමණවෙයි," මේ වනාහි අටුවාචාරීන් වහන්සේලා විසින් කියනලද්දේය.

පෞරාණිකයන්විසින් වර්ණනා කරණලද ඒවර්ණනාවද මේකාරණයෙහිදී අර්ථසාධකයයි දතයුතු, නොයෙක්තැනදී ධර්මයද විනයද භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණලද්දේය, පණවනලද්දේය, ඒ ඒ ආවාවු තන්හිදු සොයන්ට යුතුවන්නේය, අපි වනාහි ධර්මයද විනයද හැර තමහට ප්‍රතිෂ්ඨාවක්කරගන්ට නොහැකිවෙමු, එසේහෙයින් මෙහිදි අපවිසින් සෙවියයුතුයි, මේ කාරණය වනාහි විනයෙහි ආයේය, "එසමයෙහි බුදුන්ගෙ කුඩාමව්වූ ප්‍රජාපතිගෞතමියගෙ පුත් ආයුෂමත් නන්දස්ථවිරතෙම අභිරූපවෙයි දර්ශනීයවෙයි ප්‍රාසාදිකවෙයි, බුදුන්ටවඩා සතරඟුලක් මිටිවෙයි, උන්වහන්සේ බුදුන්ගෙ සිවුරේප්‍රමාණ සිවුරක් දරායයි" මේ නිදර්ශනයකි.

එකල ආයුෂමත් නන්දස්ථවිරතෙම බුදුන්ටවඩා සතරඟුලක් මිටිවූ යේය, බුදුරජානන් වහන්සේත් ආයුෂමත් නන්දතෙරුන් වහන්සේට වඩා මදක්උස් ශරීරයක් ඇත්තෙක්වූයේය, එහෙයින්ද ඒ නන්දස්ථවිරතෙම බුද්ධශ්‍රාවකයෙක් වූයේනමුත් බුදුන්ගෙ සිවුරේ

සමපපමාණං චීවරං ධාරෙතුං අසකඛි, භගවා පි එකච්චසස සාවකසස චීවරං ධාරෙසි අතතනො කායසස නාති මහනතතාය, ඉදම්පි අතිදුලභතරං හොති, පුබෙබබොපනා යසමා නඥෙ කායසස අච්චුබෙබධතාය යකෙඛාවිය ච පෙතොවිය ච යෙන කෙනචිගරහි තබෙබා නාහොසි, අභිරූපො පාසාදිකො ති ආදිනා නයෙන පසංසිතො යෙවෙ සො, අය මතෙථා නෙතබෙබා.

සො පි භගවා මනුසෙසා යෙව අහොසි, පකති මනුසෙස තිධා නා තිකකාමති, සො ච යාදිසො ආයසමා නඥෙ රූපසස පටිභාගව සෙන තාදිසො හොතීති.

විනයමහා හරිතවාන එතථමාහු විචකඛණා,
සුතතානතතො අපරමපි ආහරිතවා පුනා රහෙ.

එකසමිං සමයෙ ආයසමා මහාකසසපො ආයසමනතං ආනඥං එතදවොච, 'එකදාබො ආවුසො ආනඥ ! භගවා මගගාඔකකමම යෙන අඤඤතරං රූකඛමූලං තෙනුපසඞකමි, අථඛවාහං ආවුසො පටපිලොතිකානං සංඝාටිං චතුගගුණං පඤඤපෙතවා භගවනතං

---

ප්‍රමාණසිරවූක් දරන්ටහැකිවිය, බුදුහුත් තමන්වහන්සේගෙ ශරීරය ඉතාමහත්නුවූ බැවින් සමහර ශ්‍රාවකයෙකුගෙ සිවුරක් දූරූසේක, මේ කාරණයත් ඉතා දුඞිතරවෙයි, පෙරවනාහි ආයුෂමත් නන්‍දතෙරුන්නාන්සේ ශරීරය ඉතාඋස්වූබැවින් යකෙක්මෙනැයි ප්‍රෙතයෙක් මෙනැයි යම් කිසිවකුවිසින් ගහඞ්‍ාකළ යුක්තෙක් නුවූයේය, මනාරූ ඇත්තේය, ප්‍රසාදඑළවන්නේය යනාදීක්‍රමයෙන් මේ සථවිරතෙම පසසන ලද්දේමැයි, මේ කාරණය එළවියයුතුයි.

ඒ භාග්‍යවතුන් වහන්සේ මනුෂ්‍යයෙක්මවූයේය, ප්‍රකෘතිමනුෂ්‍යයන් තුන්විදියකින් නොඉක්මවයි, ඒ බුදුරජානන් වහන්සේ යම් බඳුද ආයුෂමත් නන්‍දතෙරුන් නාන්සේ රූපප්‍රතිභාග වශයෙන් එබඳුවෙයි.

මේ සුගත්වියත පිළිබඳ කථාවෙහිදී නුවනැත්තෝ විනයපිටකයෙන් (යමක්) එළවාගෙණ කීහුද නැවත සූත්‍රපිටකයෙනුත් අනිකක් එළවාකියන්ට පටන්ගණිති.

එක් සමයෙක්හී ආයුෂමත් මහාකාශ්‍යපසථවිරතෙම ආයුෂමත් ආනන්‍දසථවිරයන්ට මෙසේ වදාළේය, "ඇවැත් ආනන්‍දය ! එක් කාලෙක්හී භාග්‍යවතුන්වහන්සේ මාර්ගයෙන්ඉවත්වී එක්තරා වෘක්‍ෂ මූලයක්කරා යම් මුගකින් යාහැකිද ඒ මගින්වැඩිසේක, ඇවැත්නි ඉක්බිති මම පටපිළියෙන්කළ සඟළසිවුර සතරපටක්කොට පණවා

එතදවොචං, එතථ භනෙත භගවා නිසීදතු යං මමසස දීඝරතත හිතාය සුඛායාති, නිසීදිඛො ආවුසො භගවාපඤඤතෙත ආසනෙ, නිසජජ ඛො මං ආවුසො භගවා එතදවොච, මුදුකා ඛො ත්‍යායං කසසප ! පටපිලොතිකානං සංඝාටිකාති, පටිගගණහාතු මෙ භනෙත භගවා පටපිලොතිකානං සංඝාටිං අනුකමපං උපාදායාති, ධාරෙසසසි පන ත්වං කසසප සාණානි පංසුකූලානීති, ධාරෙසසාමහං භනෙත භගවතො සාණානි පංසුකූලානි නිබබසනානීති, සොඛවාහං ආවුසො පටපිලොතිකානං සංඝාටිං භගවතො පාදාසිං, අහං පනසස භගවතො සාණානි පංසුකූලානි නිබබසනානි පටිපජජ නති”.

ඉදමපි නිදසසනං,

සොහි භගවා මහාකසසපසස අතතනො පංසුකූලචීවරං දත්වා තසෙසව සංඝාටිංගහෙත්වා සයමෙව ධාරෙසි, සචෙ සො භගවා උබබධතො වාදසහතෙථා භවෙය්‍ය න සො භගවා මහාකසසපසස සංඝාටිංධාරෙය්‍ය, සාචඛොසංඝාටි භගවතො අනතරවාසකො වියහුත්වා තිඨෙය්‍ය, සාපිනපහොසසති භගවතො ජානුමණඩලං පටිචඡාදෙතුං

---

භාග්‍යවතුන්වහන්සේට මෙසේ සැළකෙළෙමි, ස්වාමීන් වහන්ස ! යම් වැඩහිඳීමක් බොහෝකලක් මට හිතපිණිස වන්නේද? සැපපිණිස වන්නේද? භාග්‍යවත්තෙම මෙහි වැඩහිඳීවා, ඇවැත්නි ! භාග්‍යවතුන් වහන්සේ පණවනලද අස්නෙහි වැඩහුන්සේක්ලාය, ඇවැත්නි ! භාග්‍යවතුන්වහන්සේ වැඩහිඳගෙණ මට මෙසේ වදාළේය, කාශ්‍යපය! තොපගෙ මේ පටපිළියෙන්කළ සඟළසිවුර මොලොක්ය, ස්වාමීනි ! භාග්‍යවතුන් වහන්සේ මාගෙ පටපිළියෙන්කළ සඟළසිවුර අනුකම්පාඋපදවා පිළිගණීවා, කාශ්‍යපය ! තොපි හනින්කල පාංශුකූලසිවුර දරන්නෙහිද, ස්වාමීනී ! මම භාග්‍යවතුන්වහන්සේගෙ නිව්සනවූ හනින්කළ පාංශුකූලසිවුර දරන්නෙමිසි, ඇවැත්නි ! ඒ මම පටපිළියෙන්කල සඟළසිවුර බුදුන්ට පිදුවෙමි, මම වනාහි ඒ බුදුන්ගෙ නිව්සනවූ හනින්කළ පාංශුකූලසිවුර පිළිගත්තෙමි”.

මේත් නිදර්ශනයකි, ඒ භාග්‍යවතුන්වහන්සේ වනාහි මහාකාශ්‍යපස්ථවිරයන්ට තමන් වහන්සේගෙ පාංශුකූලසිවුරදී ඒ කාශ්‍යපස්ථවිරයන්වහන්සේගේම සඟළසිවුරගෙණ තමන්වහන්සේම දැරූසේක, ඉදින් ඒ භාග්‍යවත්තෙම උසින් දෙලොස්රියන් වන්නේනම් ඒ භාග්‍යවත්තෙම මහාකාශ්‍යපස්ථවිර යන්වහන්සේගෙ සඟළසිවුර භාග්‍යවතුන්වහන්සේට අනතරවාසකයක්මෙන් වී සිටින්නේය, බුදුන් ඉතාමහත්වූ ශරීරඇතිබැවින් ඒ සඟළසිවුර බුදුන්ගෙ දනමඩුල්ලවසන්ටවත් පොහොනේ නොවන්නේය, ඒ ආයුෂමත් මහා

තසස අතිමහනතකායතාය, නනු සො ආයසමා මහාකසසපො සරීරපපමාණ න පකති මනුසෙසහි සමපපමාණොයෙව, නාතිඋචෙචා නාතිනීචො ති පඤඤාතො, යදිභගවතො චීවරං තාවමහනතං භවෙය්‍ය, කථංහි ආයසමා මහාකසසපො භගවතො චීවරං ධාරෙය්‍යාති, ඉදං අතිදළ්හතර හොති, විඤඤූහි සපපුරුසෙහි පඤඤාය අනුවිචාරෙතබබං, විචාරෙතවා අතතනො ඤාණබලෙන පවතෙතතබබං.

අහොසි ඛො සො භගවා කදාචි සාවකසස චීවරංගහෙතවා * පරිභුඤජිතො, එකචෙචපන සාවකා භගවතො චීවරංලභිතවා අඤඤං වා තපපමාණයුතතං චීවරං කාරාපෙතවා පරිභුඤජිංසු, තෙන සො ගගවා සාවකෙහි කීච මහනෙතාභවී † ති.

අපරමපිචෙතථ සාධකං.

“අථඛො රාජාමාගධො අජාතසතතු වෙදෙහිපුතෙතා —ල— යෙන මණ්ඩලමාලසස වාරං තෙනුපසඞකමි, උපසඞකමිතවා ජීවකං කොමාරභචචං එතදවොච.

---

කාශ්‍යපස්ථවිරතෙම ශරීර ප්‍රමාණයෙන් ප්‍රකෘති මනුෂ්‍යයන්හා සමප්‍රමාණවූයේමනොවේද? ඉතාඋස්නොවීයයි, ඉතාමිටිනොවීයයි, කියා ප්‍රකටය, ඉදින් බුදුන්ගෙ සිවුර එපමණම මහත්වන්නේ නම් ආයුෂමත් මහාකාශ්‍යපස්ථවිරයන්වහන්සේ බුදුන්ගෙ සිවුර කෙසේදරන්නේද? මේ කාරණය ඉතා දෘඪතරවෙයි, නුවනැති සත්පුරුෂයන් විසින් නුවනින් නැවතනැවත සෙවියයුතුයි, සොයා තමන්ගෙ ඥානබලයෙන් පැවැත්වියයුතුයි, ඒ භාග්‍යවත්තෙම කිසිකලක ශ්‍රාවකයකුගේ සිවුරක්ගෙණ පරිභොගකරණලද්දේවූසේක, සමහර ශ්‍රාවකකෙණෙක් බුදුන්ගෙ සිවුරක්ලැබ අනික් ඒ ප්‍රමාණයුත් සිවුරක් හෝ කරවා පරිභොගකලාහ, එසේහෙයින් ඒ භාග්‍යවත්තෙම ශ්‍රාවකයන්ටවඩා කෙතෙක්මහත්වීද?.

මෙහි අතිකුදු සාධකයක් වේ.

“ඉක්බිති මගධරටටශ්‍රෙෂ්ඨවූ වෛදෙහිපුත්‍ර අජාසත්රජ—ල—මණ්ඩලමාලයේ දොරයම්තැනකද එතනට එළඹියේය, එළඹ කෞමාරභෘත්‍යවූ ජීවකයාහට මෙසේකීය,

---

“පරිභුඤජි” “භවිසසති” සියම් පොතේ

කහංපන සම්මජීවක! භගවාති, එසො මහාරාජ භගවා මජ්ජිමං ථම්භං නිස්සාය පුරත්ථාභිමුඛො නිසින්නො පුරක්ඛතො භික්ඛුසඞ්ඝස්සාති, ඉදම්පි නිදස්සනං.

සචෙ සො භගවා අත්තනො කායස්ස මහන්තත්තෙන සාවකෙ අතික්කමිත්වා ද්වාදසහත්ථුබ්බෙධකායො හුත්වා තස්ස රඤ්ඤො දූරතොව ආගච්ඡන්තස්ස පඤ්ඤායෙය්‍ය, තෙන රඤ්ඤා දූරතොව පස්සිත්වා අත්තනො මණ්ඩලමාලස්ස ද්වාරං සම්පත්තකාලෙ ජීවකො කොමාරභච්චො න පුච්ඡිතබ්බො යෙවස්ස, තස්මා ඉධ විඤ්ඤූහි සප්පුරිසෙහි සන්නිට්ඨානං ගන්තබ්බං. භගවතො සරීරං පකතිමනුස්සානං සරීරතො උබ්බෙධෙන තිගුණං හුත්වා අධිකං න හොතීති.

අපරම්පි චෙත්ථ සාධකං.

"අද්දසා ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ සසීසං පාරුතං නිසින්නං, දිස්වාන වාමෙන හත්ථෙන හව්‍යසෙසං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන කමණ්ඩලුං ගහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, අථ ඛො භගවා සුන්දරිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පදසද්දෙන සීසං විවරි, අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො මුණ්ඩො අයං භවං මුණ්ඩකො අයං භවන්ති",

---

යහලු ජීවකය! බුදුහු කොහිද? මහරජ! භික්සඟුන් විසින් පිරිවරණලදුව මධ්‍යමස්තම්භය ඇසුරුකොට පූර්වදිගට මුහුණලා වැඩහුන්මුන්වහන්සේ බුදුහුයි", මේද නිදසුනකි.

ඉදින් ඒ බුදුහු තමන්ගෙ කය මහත්බැවින් ශ්‍රාවකයන් ඉක්මවා දොළොස්රියන්උස ශරීරයක් ඇත්තෙක්වී එන්නාවූ ඒ රජහට දුරදීම පෙණෙන්නේනම්, ඒ රජවිසින් දුරදීමදැක තමන්මණ්ඩල මාලයේ දොරකඩට පැමිණිකල්හි කෞමාරභෘත්‍ය ජීවකතෙමේ නොවිචාළයුතුමවන්නේය, එසේහෙයින් මෙහිදී නුවනැති සත්පුරුෂයන්විසින් බුදුන්ගෙ ශරීරය ප්‍රකෘති මනුෂ්‍යයන්ගෙ ශරීරයටවඩා උසින්තුන්ගුණයක්ව අධිකනුවූයේයයි කියා තීන්දුවට යායුතුයි.

මෙහි අතිකුදු සාධකයක්වේ.

"සුන්දරිකභාරද්වාජනම් බ්‍රාහ්මණතෙම බුදුන් එක්තරාරුකක්මුල හිසපටන්පොරවා වැඩහුන්නා දුටුවේය, දකාවම්අතින් යාගාවශෙෂයගෙණ දකුණතින් දබරාවගෙණ බුදුන් යම්තැනකද එතනටඑළඹියේය, ඉක්බිති භාග්‍යවත්තෙම සුන්දරිකභාරද්වාජනම් බ්‍රාහ්මණයාගෙ පාශබ්දයෙන් හිසවැස්ම හළේය, ඉක්බිති සුන්දරිකභාරද්වාජනම් බමුණු මේ පින්වත්තෙම හිසමුඩුය, මේ පින්වත්තෙමහිසමුඩුවෙක්යයි.

තතොච පුන නිවතතිතුකාමො අහොසිති, ඉදමපි නිදසසනං.

සචෙ සො භගවා උබබෙධෙන චාදසහතෙථාභුතවා සසීසං පාරුතො නිසිනෙනා සුන්‍දරිකභාරචාපසස බ්‍රාහමණසස පබබතො විය පඤ්ඤායෙයය, නසො තෙන උපසඞකනෙතා අසස, න චෙචං, තදුහි සො අතතනො භණඩං ගහෙතවා පටිගගාහකසඤ්ඤාය උප සඞකමිතවා භගවතා පදසද්දංසුතවා සීසෙ විවරිතෙ තං භගවනතං දිසවා රූසිතමාන සො මුණඩාති අකෙකාසිතවා නිවතතිතුමාරබෙබා, ඉදමපිඨානං පඤ්ඤාය විචාරෙතබබං.

අපරමපි චෙතථ සාධකං

“තෙනඛො පන සමයෙන පුකකුසාතිනාම කුලපුතෙතා භගව නතං උද්දිසස සධා අගාරසමා අනගාරියං පබබජිතො, සො තසමිං කුමභකාරනිවෙසනෙ පඨමං වාසූපගතොහොති, අථඛො භගවා යෙනායසමා පුකකුසාති තෙනුපසඞකමි, උපසඞකමිතවා ආයසමනතං පුකකුසාතිං එතදවොච, සචෙ තෙභිකඛු ! අගරු විහරෙමු නිවෙස නෙ එකරතතිනති, ඔරුඩං ආවුසො ! කුමභකාරනිවෙසනං විහරතා යසමා යථා සුඛනති.

---

කියා එතනින්ම නැවතහැරී එනුකැමතිවූයේය, මේත් නිදර්ශනයකි.

ඉදින් ඒ භාග්‍යවත්තෙම උසින් දොලොස්රියන් ඇත්තෙක්ව හිසපටන් පොරවනලදුව වැඩහුන්නේ නම් සුන්දරිකභාරවාජ බමු ණුහට පර්වතයක්මෙන් පෙණෙන්නේය, හෙතෙම ඒ කාරණයකර ණකොටගෙණ නොඑළඹෙනලද්දේ වන්නේය, එසේදනොවීය, එකල්හි ඒ සුන්දරිකභාරවාජ නම් බමුණු තමන්ගෙ භාණ්ඩගෙණ ප්‍රතිග්‍රාහකසංඥවෙන් එළඹී බුදුන්විසින් පාදශබ්දයඅසා හිසවැසුම මිදූකල්හි ඒබුදුන්දැක නොසතුටුසිත්ඇතිව හිසමුඩෙක්යයි ආක්‍රොශ කොට හැරීඑන්ට ආරමභකෙළේය, මේ කාරණයත් නුවනින් සෙවි යයුතුයි.

මෙහි අනිකුදු සාධකයක්වෙයි.

“එකල්හි වනාහි පුක්කුසාති නම් කුලපුත්‍රතෙම බුදුන්උදෙසා සැදහැයෙන් ගිහිගෙයින් (නික්ම) ශාසනයෙහි පැවිදිවූයේය, හෙ තෙම කුමභකාරනිවෙස්නෙහි පළමුවාසයට එළඹියේවෙයි, ඉක්බිති භාග්‍යවත්තෙම ආයුෂමත් පුක්කුසාතිකුලපුත්‍රයා යම් තැනෙක්හිද එතනටවැඩිසේක, වැඩ ආයුෂමත් පුක්කුසාතිකුලපුත්‍රයාට මෙසේව දාළේය, ඉදින් මහණ! තොපට නොබරවීනම් එකරුයක් මේ කුමභ කාර නිවෙස්නෙහි වාසයකරමුයි, ඇවැත්නි ! කුමභකාරනිවෙස්න ඉඩතිබෙයි, ආයුෂමත්තෙම සැපවූපරිද්දකින් වාසයකෙරේවායි,

අථඛො භගවා කුම්භකාරනිවෙසනං පවිසිත්වා බහුදෙවරත්තිං නිසජ්ජාය වීතිනාමෙසි, ආයස්මාපිඛො පුක්කුසාති බහුදෙවරත්තිං නිසජ්ජාය වීතිනාමෙසි, අථඛො භගවා ආයස්මන්තං පුක්කුසාතිං එතදවොච.

කංසිත්වං භික්ඛු ! උද්දිස්ස පබ්බජිතො? කොවා තෙ සත්ථා? කස්සවා ධම්මං රොචෙසීති? අත්ථාවුසො! සමණො ගොතමො සක්‍ය පුත්තො සක්‍යකුලා පබ්බජිතො—ල—තාහං භගවන්තං උද්දිස්ස පබ්බජිතො, සොච ඛො මෙ භගවා සත්ථා, තස්සාහං ධම්මං රොචෙමීති, කහංපන භික්ඛු! එතරහි සො භගවා විහරතීති? අත්ථා සො! උත්තරෙසු ජනපදෙසු සාවත්ථිනාම නගරං, තත්ථ සො භගවා එතරහි විහරතීති, දිට්ඨපුබ්බොපන තෙභික්ඛු! සො භගවා, දිස්වාචපන ජානෙය්‍යාසීති, නඛො මෙ ආවුසො! දිට්ඨ පුබ්බො සො භගවා, දිස්වාචාහං නජානෙය්‍යන්ති, අථඛො භගවතො එතදහොසි, මමංඛො අයං කුලපුත්තො උද්දිස්ස පබ්බජිතො, යන්නූනස්සාහං ධම්මං දෙසෙය්‍යන්ති" ඉදමපි නිදස්සනං.

යදිහි සො භගවා පකතිමනුස්සානං යථා පොරාණෙහි නිද්දිට්ඨ

---

ඉක්බිති භාග්‍යවත්තෙම කුඹල්හලටවැද රෑබොහෝවේලාහිඳීමෙන් කල්යැවූසේක, ආයුෂ්මත් පුක්කුසාතිකුලපුත්‍රයාත් රෑබොහෝවේලාහිඳීමෙන් කල්යැවූයේය, ඉක්බිති භාග්‍යවත්තෙම ආයුෂ්මත් පුක්කුසාතිකුලපුත්‍රයාට මෙසේවදාළේය.

මහණ! තෝ කවරෙකුඋදෙසා පැවිදිවූයෙහිද? තටකවරෙක් අනුශාසකද? කවරක්හුගෙ ධර්මය රුස්නේද? ඇවැත්නි! ශාක්‍යපුත්‍රවූ ශාක්‍යකුලයෙන් පැවිදිවූ—ල—මහණගොයුමෙක්ඇති මම ඒපින්වත්හුඋදෙසා පැවිදිවූයෙමි, ඒ භාග්‍යවත් මට අනුශාසකවෙයි, මම ඔහුගෙ ධර්මය රුස්නෙමියි, මහණ! ඒ භාග්‍යවත්තෙම මෙකල කොතනක වාසයකෙරේදැයි, ඇවැත්නි! උත්තරජනපදයෙහි ශ්‍රාවස්තිනම් පුරයෙක්ඇති, ඒ නුවරමෙකල ඒ භාග්‍යවත්තෙම වෙසෙසි, මහණ! තොපවිසින් ඒ භාග්‍යවත්තෙම පෙරදක්නාලද්දේද, දැකත් හඳුනන්නෙහිද ඇවැත්නි! මාවිසින් ඒ භාග්‍යවත්තෙම පෙරදක්නාලද්දේ නොවේය, මම දැකත් නොහඳුනන්නෙමියි.

ඉක්බිති භාග්‍යවත්හට මෙසේ සිතක්වූයේය, මේකුලපුත්‍රයා මා උදෙසා පැවිදිවූයේය, යම්හෙයකින් මම මොහට ධර්මයක් දෙශනා කරන්නෙමියි, මේත් නිදර්ශනයකි.

ඉදින් ඒ භාග්‍යවත්තෙම ප්‍රකෘතිමනුෂ්‍යයන් සම්බන්ධව පුරාතන

මහනතපමාණෙන තාවමහනතො භවෙය්‍ය, පුකකුසාතිකුලපුතතො තංදසසනෙන සඤජානෙය්‍ය සොපන නතථා සඤජානි.

සොකිර පුකකුසාතිකුලපුතතො චිරං භගවතො ගුණංසුතවා තසමිං භගවති අතිවිය පසනනොහුතවා අතතනො සමපතතිං පහාය භගවනතං උදදිසස පබබජිතො තං භගවනතං පසසිතුකාමො අහොසි.

සොපි අපරෙන සමයෙන කුමභකාරසාලායං භගවතා සඩිං සමාගමම භගවතො දසසනෙන අසඤජානිතවා අනෙකපරියායෙන භගවතා * බහුදෙවරතතිං පුචඡිතො, තං භගවනතං යෙව රූපදසසනෙන සඤජානිතුං නාසකඛි.

අථඛො භගවා පුකකුසාතිසස අජඣාසයං විදිතවා ඡධාතු විභඞගං ධමමං දෙසෙසි, අථඛො පුකකුසාති කුලපුතතො භගවතො ධමමං සුතවා ඤාණං පෙසෙතවා භගවාච මෙදිඨො සතථාච මෙ ලඩොති සඤජානිතවා තං ඛණඤඤෙව භගවතො සනතිකෙ අචචයං දෙසෙතවා පචජා පබබජජඤව උපසමපදඤව යාචීති, ඉදමපි අති දළහතරං හොති, සාධුහි සපපුරිසෙහි සුඩුවිචාරෙතබබං.

---

යන්විසින් දක්වූලෙස මහත්ප්‍රමාණයෙන් එපමණමහත් වන්නේ නම් පුක්කුසාති කුලපුත්‍රයා දකීමෙන් ඒ බුදුන් හඳුනන්නේය, හෙතෙම එසේ නොහැඳිනීය.

ඒ පුක්කුසාති කුලපුත්‍රතෙම බොහොකල් බුදුන්ගෙ ගුණ අසා ඒ බුදුන්කෙරෙහි ඉතාමත්පැහැදී තමාගෙ සමපත් හැරපියා බුදුන් උදෙසා පැවිදිවූයේ ඒ බුදුන් දකිණු කැමතිවූයේය.

ඒ පුක්කුසාතිකුල පුත්‍රතෙමේත් මෑතකාලයෙහි කුඹල්හලෙ හිඳී බුදුන් හා එක්ව බුදුන් දකීමෙන් නොහැඳින නොයෙක් ආකාරයෙන් බුදුන්විසින් රාත්‍රි බොහොවේලා විචාරණලද්දේ ඒ බුදුන් රූපදර්ශනයෙන්ම හඳුනන්ට නොහැකිවූයේය.

ඉක්බිති භාග්‍යවත්තෙම පුක්කුසාති කුලපුත්‍රයාගේ අදහසදැන ෂට්ධාතුවිභඞ්ග ධර්මය වදාළේය, ඉක්බිත්තෙන් පුක්කුසාති කුලපුත්‍රතෙම බුදුන්ගෙ ධර්මය අසා නුවනමෙහෙයා මාවිසින් භාග්‍යවත්තෙමදක්නාලද්දේය, මාවිසින් ශාස්තෲන්වහන්සේ ලබනලද්දේයයි, හැඳින එකෙණෙහිම බුදුන්ගෙ සමීපයෙහිදී අච්චය දෙශනාකොට හෙවත් දොෂය ප්‍රකාශකොට පසුව ප්‍රවෘජ්ජාවද උපසම්පදාවද ඉල්වූයේය, මේත් ඉතාදැඩිතර කාරණයක්වෙයි, යහපත් සත්පුරුෂයන්විසින් මනාව සෙවියයුතුයි.

---

"හගවතො" සිසම් පොතේ

## අපරමපි චෙතුළු සාධක.

සොහි භගවා ධම්මං දෙසෙන්තො එවං උපමං අකාසි, "සෙය්‍යථාපි භික්ඛවෙ! යානිකානිචි ජඞ්ගලානං † පාණානං පදජාතානි සබ්බානි තානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති යදිදං මහන්තත්තෙනාති." ඉදමපි නිදස්සනං

යදි සො භගවා යථා පොරාණකෙහි කථිතපමාණෙන මහන්තකායො භවෙය්‍ය, තස්සබො පන භගවතො පාදා සබ්බෙසමපි අතිමහන්තතරා භවෙය්‍යුං.

තථාපි සො භගවා එවං ධම්මං දෙසෙය්‍ය, "සෙය්‍යථාපි භික්ඛවෙ! යානිකානිචි ජඞ්ගලානං—ල—සබ්බානි තානි තථාගතස්සපාදෙ සමොධානං ගච්ඡන්තීති."

තථාගතොහි මනුස්සත්තභාවෙඨිතො පාණෙසු ජඞ්ගලෙසු සංඛ්‍යං ගච්ඡති, යෙපන තස්ස අතිමහන්තං ඉච්ඡිංසු, අඩාතෙ භගවන්තංයෙව අභූතෙනඅසතා අබ්භාචික්ඛන්තිනාම, විරුද්ධවාදී භගවා විරුද්ධංධම්මං දෙසෙසීති ආදිනාති.

---

## මෙහි අනිකුදු සාධකයක්වෙයි.

ඒ භාග්‍යවත්තෙම ධර්මදෙශනාකරන්නේ මෙසේ උපමාවක්කෙළේය, "මහණෙනි! යම්සේ ජාඞ්ගලසත්වයන්ගෙ යම්කිසි පදසමූහයක්වේද ඒ සියල්ල හස්තිපාදයෙහි ඇතුළත්වීමට යෙති, යම් මේ ඇත්පාදය මහත්බැවින් ඔවුන්ට අග්‍රයයි කියනුලැබේ." මේද නිදසුනකි.

ඉදින් ඒ භාග්‍යවත්තෙම යම්සේ පුරාතනයන්විසින් කියනලද ප්‍රමාණයෙන් මහත්වූ ශරීරයක් ඇත්තේ වන්නේනම් ඒ භාග්‍යවත්හුගෙ පාදයෝ හැමටමවඩාත් ඉතා මහත් වන්නාහ.

එසේ හෙයින් ඒ භාග්‍යවත්තෙම මෙසේ ධර්මදෙශනා කරන්නේය, "මහණෙනි! යම්සේ යම්කිසි ජාඞ්ගලසත්වයන්ගෙ—ල—ඒ සියල්ල තථාගතයන් වහන්සේගෙ පාදයෙහි ඇතුළත්වීමට යෙතියි."

(එවිට) තථාගතයන්වහන්සේ වනාහි මනුෂ්‍යාත්මභාවයෙහි සිටියේ ජාඞ්ගලසත්වයන්කෙරෙහි ගණනටයෙයි, යම්කෙණෙක් වනාහි ඒ බුදුන්ගෙ ඉතා මහත්බව කැමැත්තාහුද, ඒකාන්තයෙන් ඔවුහු භාග්‍යවත්තෙම විරුද්ධවාදීය, විරුද්ධවූ ධර්මයක් දෙශනාකෙළේය

---

† "ජඞ්ගමාන" සිංහල.

අපිචායමෙත්ථො සබ්බඤ්ඤුවරපාදචෙතිය සම්මත පාදවලඤ්ජනෙසු නෙතබ්බො, අපරෙපනාහු යංයං චෙතියසම්මතං තංතං පූජිතුං වට්ටතීති, තම්පි යුත්තං වා නයුත්තං වාති පඤ්ඤාය විචාරණමෙව සෙය්‍යො, සොහි භගවා අනෙකෙහි ගුණෙහි පතිමණ්ඩිතො, දෙවමනුස්සෙහි සෙවිතබ්බො භජිතබ්බො පයිරුපාසිතබ්බො සක්කාතබ්බො ගරුකාතබ්බො, යදි භගවා තථාමහන්තො භවෙය්‍ය දෙවමනුස්සෙහි නසෙවිතබ්බො නභජිතබ්බො නපයිරුපාසිතබ්බො අස්ස, තෙ දූරතො භගවන්තං දිස්වා යක්ඛො නු දිට්ඨොති මඤ්ඤමානා සන්තාසං ආපජ්ජිත්වා පලායෙය්‍යුං.

එකච්චෙ විපල්ලාසං වා පටිලභෙය්‍යුං, කොනුඛො සො භගවා දෙවො වා භවෙය්‍ය මනුස්සො වාති, එවං සන්තෙ බුද්ධභාවො අනච්ඡරියො නිරත්ථකොව උපනිස්සය සම්පන්නානං කුලපුත්තානන්ති.

අම්හාකං මති සො භගවා මනුස්සයොනියං ජාතො මනුස්සොයෙව අහොසි, සුද්ධොදනො සක්කොච මායාදෙවීච රාහුලමාතාච,

---

යනාදීන් භාග්‍යවතුන්වහන්සේට නුවූවාවූ අභූතයකින් දෙස්නගා කථාකරන්නෝය.

තවද මේකාරණය හැමතැන උත්තමපාදචෛත්‍යයයි සම්මතවූ පාදවලඤ්ජනයන්හි එලවියයුතුයි, යමක් යමක් චෛත්‍යයයි සම්මතද ඒඒ පුදන්ටවටීයයි අන්‍යයෝ කියති, ඒකීමත්යුතුද අයුතුදැයි නුවනින් සෙවීමඋතුම්, ඒ භාග්‍යවත්තෙම නොයෙක්ගුණයෙන් ප්‍රතිමණ්ඩිතය, දෙවිමිනිසුන්විසින් සෙවනයකටයුතුයි, භජනයකටයුතුයි, පයුරුපාසනයකටයුතුයි, සත්කාරකටයුතුයි, ගරුකාරකටයුතුයි, ඉදින් බුදුරජානන්වහන්සේ එසේ මහත්වන්නේනම් දෙවිමිනිසුන් විසින් සෙවනය නොකටයුතුවන්නේය, භජනයනොකටයුතුවන්නේය, පයුරුපාසනය නොකටයුතුවන්නේය, ඔවුහු දුරදී බුදුන් දැක අපවිසින් යකෙක් දක්නාලද්දේයයි, සිතමින්භයපත්ව පලායන්නාහ.

ඒ භාග්‍යවත්තෙම කවරෙක්ද? දෙවියෙක් දෝහෝ නොහොත් මනුෂ්‍යයෙක්දැයි ඇතැම්කෙණෙක් (චිත්ත) විපර්‍යාසයකුදු ලබන්නාහුය, මෙසේ ඇතිකල්හී උන්වහන්සේගෙ බුදුබව ආශ්චර්‍යයනොවෙයි, උපනිශ්‍රය සම්පන්නවූ කුලපුත්‍රයන්ට වැඩක් නැත්තේදවෙයි.

අපේදැනීම ඒ භාග්‍යවත්තෙම මිනිස්යොනියේ උපන් මනුෂ්‍යයෙක්මවූයේය, සුද්ධොදනශාක්‍යරජද මහාමායාදෙවීද රාහුලමාතාවෝද

මනුස්සායෙව අහෙසුං, තෙපි නයක්ඛා නපෙතා නතිරච්ඡානගතා.

තස්මා තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස කායො තථා අතිමහන්තො නභවෙය්‍ය, තදූහි සො භගවා අත්තනො කායෙන පකති මනුස්සකායං අතිවිය අතික්කමන්තො නාහොසි, පකති මනුස්සානංයෙව කායං. තයොකොට්ඨාසෙ කත්වා අපරම්පි එකං කොට්ඨාසං පක්ඛිපිත්වා පකති මනුස්සකායතො වඩ්ඪිත චතුත්ථකොට්ඨාස පමාණයුත්තො භවිස්සති.

තස්ස ඛො පන භගවතො කායො එතරහිපි වඩ්ඪකඞ්ගුලීහි එකූනතිංසුත්තරඞ්ගුල සතුබ්බෙධො අහොසි, යාවතකවස්සකායො තාවතකවස්සව්‍යාමො, භගවතොකාලෙ ජාතමනුස්සානං පන කායො එකකලායසහ ද්වෙනවුත්‍යඞ්ගුලුබ්බෙධො අහොසි, තෙසං ව්‍යාමොතු සත්තනවුත්‍යඞ්ගුලො.

එතරහි ඛොපන තස්ස භගවතො පරිනිබ්බාණතො තිසතාධිකානං ද්විනන්නං වස්සසහස්සාන මුපරි චතුත්ථවස්ස සතබ්භන්තරෙ ජාතමනුස්සානං කායො පඤ්චසත්තත්‍යඞ්ගුලුබ්බෙධො හොති ව්‍යාමොතු අසීත්‍යඞ්ගුලො.

---

මනුෂ්‍යයෝමවූහ, ඔවුහු යක්ෂයෝ නුවූහ, ප්‍රෙතයෝනුවූහ, තිරශ්චීනයෝ නුවූහයයි කියාය.

එහෙයින් භාග්‍යවත් අහිත් සම්‍යක්සම්බුඩවූ උන්වහන්සේගෙ ශරීරය එසේ ඉතා මහත් නොවන්නේය, එකල ඒ භාග්‍යවත්තෙම තමන්ගෙ ශරීරයෙන් ප්‍රකෘති මනුෂ්‍යයන්ගෙ ශරීරය ඉතා වැඩියක් ඉක්මවන්නේනුවූයේය, ප්‍රකෘති මනුෂ්‍යයන්ගෙ ශරීරය තුන්කොට සක්කොටතවත් එකකොටසක්බහා ප්‍රකෘති මනුෂ්‍යශරීරයටවඩා සතරින්කොටසක්වැඩිවූ පමණ ඇතිවන්නේය.

ඒ බුදුන්ගෙ ශරීරයවනාහි මෙකල වඩුවන්ගෙ අඟුලෙන් එක්සිය එකූන්තිස් අඟුලක් උස්වූයේය, උන්වහන්සේගෙ ශරීරය යම් පමණද බඹයත් එපමණය බුදුන්දවස උපන් මනුෂ්‍යයන්ගෙ ශරීරය වනාහි දෙඅනූඅඟුල් එක්කලාවක්පමණ උස්වූයේය, ඔවුන්ගේ බඹයඅනූසත්අඟුලෙකි.

මෙකල වනාහි ඒභාග්‍යවත්හුගෙ පිරිනිවීමෙන් හවුරුදු දෙදහස් තුන්සියයකට මත්තෙහි සතරවන සියක් අවුරුඇඳඅතර උපන් මනුෂ්‍යයන්ගෙ ශරීරය පන්සැත්තෑ අඟුලක්උස්වෙයි, බඹවනාහි අසූඅඟුලෙකි.

එකමෙකස්ස හි වස්ස සතස්ස අතික්කමෙන මනුස්සානං කායස්ස
උබ්බෙධප්පමාණා තීහිතීහි කලාහි පරිහායති, තස්මා තෙවීසතික්ඛ
ත්තුං අතික්කන්තෙසු එකමෙකෙසු වස්සසතෙසු මනුස්සානං කායස්ස
උබ්බෙධප්පමාණං එකකලාය සහසත්තරසහි අඞ්ගුලීහි පරිහායති,
එතරහි තදහුජාත දූරකානං කායොහි එතරහියෙව මජ්ඣිමපුරි
සඞ්ගුලෙන මිනීයමානො එකකලායසහ අට්ඨාරසඞ්ගුලොහොති උ
බ්බෙධපමාණෙන, එතරහියෙව වඩ්ඪකීඅඞ්ගුලෙන පන මිනීයමා
නො තීහිකලාහි සහ පණ්ණරසඞ්ගුලො හොති උබ්බෙධපමාණෙන.

සො නෙසං කායො ජාතිතොපට්ඨාය යාවඡබ්බීසති වස්සායුක
කාලා එත්ථන්තරෙ එකමෙකවස්සා තික්කමෙන නවකලං නවකලං
උබ්බෙධපමාණෙන වඩ්ඪමානො ඡබ්බීසති වස්සායුකකාලෙ එකාය
කලායසහ චතුසත්තත්‍යඞ්ගුලුබ්බෙධො හොති, භගවතොකාලෙ
ජාතමනුස්සානං කායොපන ජාතිතොපට්ඨාය යාව තෙත්තිංස වස්සා
යුකකාලා එත්ථන්තරෙ ඉමිනාව කමෙන වඩ්ඪමානො තෙත්තිංස
වස්සායුක කාලෙවීහිකලාහිසහ චෙනවුත්‍යඞ්ගුලුබ්බෙධො අහොසි.

භගවතො පන තදහුජාතස්සාපි කායො සුගතඞ්ගුලෙනෙව
එකකලායසහඅට්ඨාරසඞ්ගුල මත්තොහුත්වා ජාතිතොපට්ඨාය

---

හවුරුදු එකඑක සියයක්හුගෙ ඉක්මීමෙන් මනුෂ්‍යයන්ගෙ
ශරීරයේ උසප්‍රමාණ තුන්තුන් කලාවක් පිරිහෙයි, එහෙයින් තෙවි
සිවරක් ඉක්මුනු එකඑක ශතවෂියෙක්හී මිනිසුන්ගෙ ශරීරයේ උස
ප්‍රමාණ සතලොස්අඟුල් එක්කලාවක් පිරිහෙයි, මෙකල එදවස්
උපන් දරුවන්ගෙ ශරීරය මෙකල්හිමවූ මධ්‍යමපුරුෂයෙකුගෙ අඟු
ලෙන්මනිනු ලබන්නේනම් උසප්‍රමාණ පසලොස්අඟුල් තුන්කලා
වක්වෙයි.

උන්ගෙ ඒශරීරය උතපතතියේපටන් සවිසිහවුරුදු කල්දක්වා
අතර එකඑක වෂියක්හුගෙ ඉක්මීමෙන් උසප්‍රමාණ නවනවකලාව
ක්වැඩෙමින් සවිසිහවිරුදු කාලයෙහි සිවුසැත්තෑඅඟුල් එක්කලාව
ක්උස්වෙයි.

බුදුන්දවස උපන් මනුෂ්‍යයන්ගෙ ශරීරය උත්පතතීයේ පටන්
තෙතිස් හවුරුදුකල්දක්වා මේ අතර මෙමක්‍රමයෙන් වැඩෙමින් තෙ
තිස්හවිරුදු වයස්කාලයෙහි දෙඅනූඅඟුල් දෙකලාවක් උසඇතිවූ
යේය.

එදවස්උපන් බුදුන්ගෙ ශරීරය සුගත්අඟුලෙන්ම අටලොස්
අඟුල් එක්කලාවක් පමණවී උත්පතතියේපටන්—

යාව තෙත්තිංසවස්සායුකකාලා එත්ථන්තරෙ එකමෙක වස්සාතික්කමෙන සුගතඞ්ගුලෙනෙව ගහිතානි චාතුකලාදිකානි නවහිනවහි කලාහි වඩ්ඪමානො තෙත්තිංසවස්සායුකකාලෙ එතරහි වඩ්ඪකඞ්ගුලීහි එකූනතිංසුත්තරඞ්ගුල සතුබ්බෙධො අහොසි, භගවතො කාලස්මිංහි ජාතමනුස්සානං වස්සසතං ආයුප්පමාණං අහොසි, එතරහි පන සත්තසත්තති වස්සානීති.

භගවාහි චතුබ්භාගො තිභාගො මජ්ඣිමො තදා
සොච එකාදසබ්භාගො නවභාගො ඉදානි පි,
එතං විසෙසතො ඤත්වා ලෙඛවිධිං පයොජයෙ.

ඉදානි යෙනකෙනචි විඤ්ඤුනා අත්ථානත්ථකුසලෙන සුගතවිදත්ථ්‍යාරම්භෙ ලෙඛවිධිං සික්ඛිතුකාමෙන අඞ්ගුලිප්පභෙදඤ්ච අඞ්ගුලි විභාගඤ්ච තාවසල්ලක්ඛෙත්වා අනුසික්ඛිතබ්බං, තත්ථ අඞ්ගුලිප්පභෙදො එවං තාව වෙදිතබ්බො.

අඞ්ගුලි අඞ්ගුලීති ඛො වුච්චති, පභෙදතො අනෙක විධා හොති සුගතඞ්ගුලීච මජ්ඣිමඞ්ගුලීච වඩ්ඪකඞ්ගුලී චාති, තත්ථ සුගතඞ්ගුලී සරූපතො පුබ්බෙවුත්තනයා එව, මජ්ඣිමඞ්ගුලී පන විධාවිභජිත

---

තෙතිස්හවුරුදු කාලයදක්වා මේ අතර එකඑක හවුරුද්දක් ඉක්මීමෙන් සුගත්අඟුලෙන්ම ගන්නාලද නවනවකලා දෙඅනුකලාවක් වැඩෙමින් තෙතිස් හවුරුදුවයස්කාලයෙහි මෙකල්හිවූ වඩුඅඟුලෙන් එක් සියඑකුන්තිස්අඟුලක් උස ඇතිවූයේය, බුදුන්දවසඋපන් මිනිසුන්ට හවුරුදුසියයක්පමණ ආයුෂවූයේය, මෙකලවනාහි හවුරුදුසත්සැත්තෑවෙකි.

බුදුහු වනාහි සතරකොටසෙකි, ඒකාලයෙහිවූ මධ්‍යමපුරුෂයා තුන්කොටසෙකි,ඒ බුදුහුද එකොළොස් කොටසෙකි, මේ කාලයෙහිදු මධ්‍යමපුරුෂ නවකොටසෙකි, මේ විශෙෂයදැන ලෙඛවිධිය යොදන්නේය.

මෙකල්හි නුවනැති අභිනවීයෙහි චතුරවූ සුගත්වියත අරබැ ලෙඛ විධිය ඉගෙණීමට කැමැතිය මි කිසිවක්හුවිසින් අඟුල් ප්‍රභෙදයද අඟුල්විභාගයද පළමුකොට සලකා නැවත නැවත ඉගෙණිය යුතුයි,එහි අඟුල්ප්‍රභෙදය පළමුව මෙසේ දතයුතුයි.

අඟුලඅඟුලයයි කියනුලැබේ, ප්‍රභෙදහෙයින් සුගත්අඟුලය මධ්‍යමපුරුෂයාගෙඅඟුලය වඩුඅඟුලයයි නොයෙක්ප්‍රකාරවෙයි, එහි සුගත්අඟුල ස්වරූපයෙන් පෙර කියනලද ක්‍රමයමැයි, මධ්‍යමපුරුෂ

බ්බා හොති බුද්ධකාලික මජ්ඣමඞ්ගුලීච ඉදානි මජ්ඣිමඞ්ගුලීචාති බුද්ධකාලිකස්ස හි මජ්ඣිමස්ස චතුත්තිංසති අඞ්ගුලියො ඉදානි වඩ්ඪකීනං එකායකලායස්සහ චතුබ්බීසති අඞ්ගුලියො හොන්ති.

එකෙකාඞ්ගුලි සත්තධඤ්ඤමාස පහොණකා හොති, සා බුද්ධකාලිකමජ්ඣිමඞ්ගුලීති වෙදිතබ්බා සත්තධඤ්ඤමාසොති චෙතං වීහීනං සාධාරණනාමවසෙන වුච්චමානං ධඤ්ඤං ධඤ්ඤන්ත්‍යෙව වුච්චති, ඉධ පන ධඤ්ඤංවා මාසොවා ධඤ්ඤමාසො, පමාණං ගණ්හන්තෙන වීසු අඤ්ඤතරං ගහෙතබ්බන්ති දස්සනත්ථං ධඤ්ඤමාසොත්‍යෙව වුත්තන්ති දට්ඨබ්බං.

ඉදානි බො මජ්ඣිමස්ස පුරිසස්ස අඞ්ගුලියො එතරහිපි නවලඤ්ජිතා හොන්ති, තස්සච හත්ථපමාණං ව්‍යාමනියමවසෙන වීසති අඞ්ගුලං හොති වඩ්ඪකඞ්ගුලෙනාපි, වඩ්ඪකඞ්ගුලියො පන ඉධයෙභුය්‍යෙන වලඤ්ජිතා, සබ්බෙහි සුවිඤ්ඤාතා හොන්ති, බුද්ධස්ස භගවතො පරිනිබ්බාණතො දියඩ්ඪසතානං සංවච්ඡරානං අච්චයෙන මජ්ඣිමස්ස අඞ්ගුලප්පමාණාති වෙදිතබ්බා.

---

යාගෙ අඟුල වනාහි බුද්ධකාලයෙහි පැවැති මධ්‍යමපුරුෂයාගෙ අඟුලය මෙකලපවත්නා මධ්‍යමපුරුෂයාගෙ අඟුලයයි දෙපරිද්දකින් බෙදියයුතුයි. බුදුන්දවසඇතිවූ මධ්‍යමපුරුෂයාගෙ සූතිස්අඟුල් මෙකලවඩුවන්ගෙ සූවිසිඅඟුල් එක්කලාවෙකි,

එකඑක අඟුල ධාන්‍යමාෂ සතක් පොහොණේවෙයි, ඒ අඟුල බුදුන්දවසපැවති මධ්‍යමපුරුෂයාගෙ අඟුලයයි දතයුතුයි, සප්තධාන්‍යමාෂයකැයි යන මේකීම වීන්ට සාධාරණ නම් වශයෙන් කියනු ලබන්නේ ධාන්‍යයධාන්‍යයයිම කියනුලැබේ, මෙහි වනාහි ධාන්‍ය හෝ යවහෝ ධාන්‍යමාෂයි, ප්‍රමාණය ගන්නාවුන්විසින් දෙකඅතුරෙන් එක්තරාඑකක් ගතයුතුයයි, දැක්වීමපිණිස ධාන්‍යමාෂයයි කියාම කියනලදැයි දතයුතුයි.

වර්තමානකාලික මධ්‍යමපුරුෂයාගෙ අඟුල් මෙකල්හිදු වලඤ්ජනය නොකරණලද්දාහු වෙතියි, ඔහුගෙරියන්ප්‍රමාණය බඹනියමයේ හැටියෙන් වඩුඅඟුලෙන්ද විසිඅඟුලක්වෙයි, වඩුඅඟුල් වනාහි මෙහි බොහෝසේ වලඤ්ජනය කරණලද්දාහ, හැමදෙනාවිසින් හොඳහැටි දන්නාලද්දාහුද වෙතියි, ඒ වනාහි බුදුන් පිරිනිවීමෙන් හවුරුදු එකසියපණසත්හුගෙ ඇවෑමෙන්වූ මධ්‍යමපුරුෂයාගෙ අඟුල් ප්‍රමාණයයි දතයුතුයි.

නානාවිධාඞ්ගු යොපි සාරත්ථෙන විනිච්ඡිතා,
විචාරෙත්වා තදත්ථිකා ධාරෙන්තු අත්ථදීපනං.

අඞ්ගුලීවිභාගොපන එවං වෙදිතබ්බො, ඉදානිස්‍යාමා එවං වලඤ්ජෙන්ති, එකෙකා වඩ්ඪකඞ්ගුලී චතුධාවිභත්තා. තත්‍රාපි එකෙකො කොඩ්ඨාසො එකෙකාකලාති පවුච්චති තස්මා එකෙකා අඞ්ගුලී චතුකලායෙව හොති, එකෙකා පන කලා චතුරානුකලා හොතීති.

වඩ්ඪකීනාඞ්ගුලී එකා විභත්තා චතුධා භවෙ,
චතුස්සු තෙසු එකෙකො කලාකලාතිවුච්චති,
තස්සා කලාය එකෙකො භාගො අනුකලාභවෙ.

තස්මාහි යායා අඞ්ගුලියො සත්තධඤ්ඤමාසපහොනකා වුත්තා පපකාරෙන පමාණයුත්තාපි තාතා බුද්ධකාලික මජ්ඣිමස්සපුරිසස්ස අඞ්ගුලියොති වෙදිතබ්බා, තඤ්ඤභියුත්තං * අභිධානප්පදීපිකායඤ්ච සම්මොහවිනොදනියඤ්ච වුත්තවචනෙනෙව සමෙති.

---

නොයෙක්ප්‍රකාර අඟුල්ද සාරවත්කාරණාවලින් විනිශ්චයකර ණලද්දූහ, ඒ අඟුලෙන් ප්‍රයොජනඇත්තෝ දක්වනලද කාරණා සොයා ධාරණයකෙරෙත්වා.

අඟුල්විභාගය මෙසේ දතයුතුයි, මෙකල සියම්රටවැස්සෝ මෙසේ වලඤ්ජනය කෙරෙත්, එකිඑකී වඩුඅඟුල සතරපරිද්දකින් බෙදනලද්දීය, එහිදු එකිඑකීකොටස එකිඑකීකලාවයයි කියනුලැ බේ, එසේහෙයින් එකිඑකීඅඟුල සතරකලාවක්වෙයි, එකීඑකීකලාව සතරඅනුකලාවක්වේයයි.

වඩුවන්ගෙ එකඅඟුලක් සතරකොටසකින් බෙදනලද්දීය, ඒ ස තරකොටස්අතුරෙහි එකිඑකී කොටස කලාවක්කලාවක්යයි කියනු ලැබෙයි, ඒ කලාවගෙ එකිඑකීකොටස අනුකලාවක්වන්නේය.

එසේහෙයින් යම්යම් අඟුල්කෙණෙක් ධාන්‍යමාෂසතක් ජොහොනා හුද කියනලද්දූවූ ප්‍රමාණයෙන් යුත්තෝද ඔව්ඔව්හු බුදුන්දවස ම ධ්‍යමපුරුෂයාගෙ අඟුල්යයි දතයුත්තාහ, ඒ වනාහී යුතුවේ, අභිධා නප්‍රදීපිකාවෙහි හා සම්මොහ විනොදනියෙහිද කියනලද කීම්සමග ගැළපෙයි.

---

* "අභිධානපදීපිකායං" සියම් පොතේ.

“ඡත්තිංස පරමාණූන † මෙකො අණූචඡත්තිංසතො,
තජ්ජාරිකාපි ඡත්තිංස රථරෙණුචඡත්තිංසතො,

ලික්ඛාතා සත්තලූකාතා ධඤ්ඤමාසොපි සත්තතො,
සත්තඞ්ගුල මමුච්චජ විදත්ථිතා ද්වෙසියුං.

රතනංතානි සත්තෙව යට්ඨිතා වීසතූසභං,
ගාවුත මුසභාසීති යොජනං චතුගාවුතනති.

තත්‍ථ පරමාණුනාම ආකාසකොට්ඨාසිකො, මංසචක්ඛුස්ස ආපාථං නාගච්ඡති, දිබ්බචක්ඛුස්සෙව ආගච්ඡති, අණුනාම භිත්තිච්ඡිද්දතාලච්ඡිද්දෙහි පවිට්ඨසු රියරංසිසු වට්ටිවට්ටාවිහුත්වා පරිබ්භමනතො පඤ්ඤායති.

තජ්ජාරිනාම ගොපථ මනුස්සපථ චක්කපථෙසු ජිජ්ජිත්වා උභොසුපස්සෙසු උග්ගන්ත්වා තිට්ඨති, රථරෙණු තත්‍ථතත්‍ථෙව අලලියති, ලික්ඛාදයො පාකටා එව.

එතෙසු පන ඡත්තිංසපරමාණවො එකස්ස අණුනොපමාණං, ඡත්තිංසඅණුනි එකාය තජ්ජාරියාපමාණං, ඡත්තිංසතජ්ජාරියො එකොරථරෙණු.

---

“පරමාණුසතිසෙක් එක්අණුයෙකි, අණුසතිසෙක් තජ්ජාරියෙකි, තජ්ජාරිසතිසෙක් රථරෙණුයෙකි, රථරෙණුසතිසෙක් ලික්ඛායෙකි, ලික්ඛාසතෙක් ඌකායෙකි, ඌකාසතෙක් ධාන්‍යමාෂයෙකි, ධාන්‍යමාෂසතෙක් අඟුලෙකි, අඟුල්දෙලොසෙක් වියතෙකි, වියත් දෙකෙක් රියනෙකි, රියන්සතක් යෂ්ටියකි, යෂ්ටිවිස්සක් ඉස්බකි, ඉස්බඅසූවක් ගව්වකි, සතරගව්වක් යොදුනෙකි.

එහි පරමාණුව නම් ආකාශගතකොටසෙකි, මාංසමයඇසට නොපෙණෙයි, දිව්‍යමයඇසට පෙණෙයි, අණුව නම් බිත්තිසිදුරුතල්පත්සිදුරුවලින් වැටුණුහිරුරැස්වල වටවටවී කරකැවෙන්නේ පෙණෙයි.

තජ්ජාරිය නම් ගවයන්යනමංවල මිනිසුන්යනමංවල රථරෝදයනමංවල සිඳී මාගීදෙපසෙහි උස්වීසිටි, රථරෙණුව එතනඑතනමඇලෙයි, ලික්ෂාදීහුප්‍රකටමැයි.

මොවුන් අතුරෙහී පරමාණුසතිසෙක් එක්අණුවක ප්‍රමාණයි, අණුසතිසෙක් එක් තජ්ජාරියකප්‍රමාණයි, තජ්ජාරිසතිසෙක් එක් රථරෙණුවකප්‍රමාණයි,

---

† “මෙකා” සියම් පොතේ.

ඡත්තිංසරථරෙණූ එකාලික්ඛා, සත්තලික්ඛා එකාඌකාසත්තඌකා එකො ධඤ්ඤමාසො, සත්තධඤ්ඤමාසප්පමාණං එකඞ්ගුලං, එතෙනඞ්ගුලෙන ද්වාදසඞ්ගුලානි විදත්ථිං ද්වෙවිදත්ථියො රතනං, සත්තරතනානි යට්ඨි, තායයට්ඨියා වීසතියට්ඨියො උසභං,අසීතිඋසභානිගාවුතං, චත්තාරිගාවුතානි යොජනන්ති. එවංඅනෙකෙහි වුත්තප්පකාරෙහි නයෙහි අඞ්ගුලිපභෙදඤ්ච අඞ්ගුලිවිභාගඤ්ච ඤත්වා යථාරුචියා ලෙඛවිධිං පයොජෙය්‍යාති.

**අඞ්ගුලි පභෙද විභාගකථා.**

---

පභෙදඤ්ච විභාගඤ්ච දස්සෙත්වාන යථා බලං,
ලෙඛාරම්භං පවක්ඛාමි සල්ලක්ඛෙත්ථ ඉමං විධිං.

සුගතවිදත්ථි ලක්ඛණස්මිංහි ලෙඛවිධිං සික්ඛිතුකාමෙන පඨමංතාව සුගතප්පමාණස්සච මජ්ඣිමපුරිසප්පමාණස්සච වඩ්ඪකීපමාණස්ස

---

රථරේණුසතිසෙක් එක් * ලීක්‍ෂාවෙක ප්‍රමාණයි, ලික්‍ෂාසතෙක් එක් † ඌකාවෙක ප්‍රමාණයි, ඌකාසතෙක් එක් ධාන්‍යමාෂයෙක ප්‍රමාණයි, ධාන්‍යමාෂ සතෙක් එක්අඟුලෙක ප්‍රමාණයි, මේ අඟුලෙන් දෙලොස්අඟුලක් වියතකි, වියත්දෙකක් රියනෙකි, රියන්සතක් යෂ්ටියෙකි, ඒ යෂ්ටියෙන් විසියෂ්ටියක් ඉස්බෙකි, ඉස්බඅසූවක් ගව්වෙකි, ගව්සතරක් යොදුනෙකියි. ‡ මෙසේ කියනලද නොයෙක්ප්‍රකාර ක්‍රමවලින් අඟුල්ප්‍රභෙදද අඟුල් විභාගද දැනකැමැති පරිද්දකින් ලෙඛවිධි යොදන්නේය.

**අඟුල් ප්‍රභෙද විභාග කථාවයි.**

---

(අඟුල්) ප්‍රභෙදවිභාගදක්වා යථාශක්තීන් ලෙඛාරම්භය කියන්නෙමි, මේවිධියදසලකාව්.

සුගත්වියත් ලක්‍ෂණයෙහිදි ලෙඛවිධිය ඉගෙණගනු කැමැත්තහුවිසින් පළමුකොට බුදුන්ගෙ ප්‍රමාණයසම්බන්ධවද මධ්‍යමපුරුෂ

---

* "ලික්‍ෂා" ලෙහෙඩියා. † "ඌකා" උකුණා.

‡ ෂට්ත්‍රිංශත් පරමාණුයෙක් එක් අණුයෙක්වෙයි, ෂට්ත්‍රිංශත්අණුයෙක් එක් තාජ්ජාරිකායෙක්වෙයි, ෂට්ත්‍රිංශත් තාජ්ජාරිකායෙක් එක් රථරේණුයෙක්වෙයි ෂට්ත්‍රිංශත් රථරේණුයෙක් එක් ලික්‍ෂායෙක්වෙයි, සප්තලික්‍ෂායෙක් එක් යූකායෙක්වෙයි, සප්තයූකායෙක් එක් යවයෙක්වෙයි, සප්තයවයෙක් එක්අඞ්ගුලයෙක්වෙයි, ද්වාදශාඞ්ගුලයෙක් එක්විතස්තියෙක්වෙයි, විතස්තිද්වයෙක් එක් අරත්නියෙක්වෙයි, සප්තාරත්නියෙක් එක් යෂ්ටියෙක්වෙයි, විංශතියෂ්ටියෙක් එක් උසභයෙක්වෙයි, අසීති උසභයෙක් එක්ක්‍රොශයෙක්වෙයි ක්‍රොශචදෂ්ටයෙක් එක්යොජනයෙක්වේ· ප්‍ර.දීපිකා,

පකති පුරිසපමාණස්සච අඞ්ගුලි විදත්ථිහත්ථව්‍යාමවසෙන පභෙදෙ යථා වුත්තනයෙනෙව සුට්ඨුඋපලක්ඛෙතබ්බො, තං යාථාවතොඤත්වා සක්කා සුඛෙන සුගතපමාණං ගහෙතුං, සුගතපමාණ උපලක්ඛණත්ථං ඉදංවිධානං විධියතෙ.

† පඨමං සුගතඞ්ගුලි ඨපෙතබ්බා, තතො ද්වාදසහි ගුණිතබ්බං, ද්වාදසඞ්ගුලියො භවන්ති, ද්වාදසාඞ්ගුලිභූතාය සුගතවිදත්ථියා එකූනතිංසුත්තර සතගුණංකත්වා ඡනවුතිහාරණං කාතබ්බං, යත්තකං ලබ්භං ලබ්භති, තත්තකං වඩ්ඪකඞ්ගුලීභවති, යත්තකං අත්ථිසෙසකං තත්තකෙසු චතුවීසතිහාරණං කාතබ්බං, යත්තකං ලබ්භං ලබ්භති, තත්තකං වඩ්ඪකීකලාභවති, යත්තකං අත්ථිසෙසකං තත්තකෙසුඡහාරණං කාතබ්බං, යංලද්ධං තං අනුකාභවතීති.

වඩ්ඪකීමජ්ඣිමානඤ්ච සුගතස්සාපි අඞ්ගුලං,
විදත්ථිඤ්ච කථෙත්වාන කොට්ඨාසිකං පුනාරභෙ.

විසෙසතො චෙත්ථ සාවජ්ජතනාධරන්තං බුද්ධස්සභගවතොදාඨංයත්ථකත්ථචිදෙසෙ ඨිතං අත්තනා අදිට්ඨපුබ්බං සවණමත්තෙනතප්පමාණං ගණ්හන්තෙනාපි එවං ලක්ඛණං අවිරාධෙත්වා පයොජෙතබ්බං.

---

ප්‍රමාණයසම්බන්ධවද ප්‍රකෘති පුරුෂ ප්‍රමාණයසම්බන්ධවද අඟුල් වියත් බඹවශයෙන් යටකියනලද ක්‍රමයෙන්ම යහපත්කොට සැලකියයුතුයි, එය තත්වූපරිද්දෙන් දැනගත්පසු පහසුවෙන් බුදුන්ගෙ ප්‍රමාණයගන්ට හැක්කේය, බුදුන්ගෙ ප්‍රමාණය සැලකීමපිණිස මේ විධියකරණුලැබේ.

පළමුකොට සුගත්අඟල තැබියයුතුයි, ඉන්පසු දෙළොසින් ගුණකලයුතුයි, (එසේ ගුණකලකල) දෙළොස්අඟුල්වෙති, දෙළොස්අඟුල්වූ සුගත්වියත එක්සියඑකුන්තිසෙන් ගුණකොට සයානූවක්හැරදැමීම කටයුතුයි, ලැබියයුතුයම්පමණක්වේද එපමණ වඩුඅඟුලවේ, යම්පමණක් සෙසවේද එපමණකින් සූවිස්සක් හැරදැමීම කටයුතුයි, ලැබියයුතු යම්පමණක්වේද එපමණ වඩුවන්ගෙ කලාවවේ, යම්පමණ ඉතිරිවේද, එපමණකින් සයක්හැරීම කටයුතුයි, යමක් ලැබේද ඒ අනුකලාවවෙයි.

වඩුවන්ගේ හා මධ්‍යමපුරුෂයාගෙද බුදුන්ගෙද අඟලදවියතද කියා නැවත කොටස්වශයෙන් කියන්ට ආරම්භකරමි.

මෙහිදී විශෙෂවශයෙන් දැක්වීමයි, අදදක්වාපවත්නාවූ බුදුන්ගෙ දළදාවහන්සේ යම්කිසි අන්‍යදෙශයක තිබෙනනමුත් තමන්විසින් ඉහත නුදුටුයේවීනමුත් ඇසූපමණින් ප්‍රමාණය ගන්නහුවිසිනුදු මෙසේ ලක්ෂණනොවරදවා යෙදියයුතුයි,

---

† “පඨලං සුගතවිදත්ථිං ඨපෙතබ්බා සියම්.

බුද්ධකාලෙච එතරහිච මනුසසානං සරීරපමාණං එවං ජානිතබබං, එතරහි මනුසසානංහි සරීරං උබෙබධෙන නවකොට්ඨාසිකං බුද්ධකාලික මනුසසානං පන එකාදසකොට්ඨාසිකං ගහෙතබබං, එතරහිචො පකති මනුසසානං දනතා අතිආයාමතො වඩ්ඪකීනං දියඩ්ඪඞ්ගුල මතතාභවනති, සමනතතො පන දියඩ්ඪායකලාය සහ එකඞ්ගුල මතතායෙව භවනති.

තථාහි, දිසසති එකසස රාමඤ්ඤථෙරසස එකා තපපමාණ යුතතාදාඨා, එකසසච මහලලකපුරිසසස තං සරිකඛකොච දනෙතා සුතො, තතෙථකාදාඨා එකිසසා මහලලකිත්ථියා එකායකලාය සහ එකඞ්ගුලමතතාහොති, එකසස පුරිසසස එකොදනෙතා අඞ්ගුලපප මාණිණො යෙව හොති, යථාලද්ධානි නානාලකඛණානි ඌනානිපි අතිරෙකානිපි සමාහරිත්වා එකතොකත්වා සමභාගො ගහෙතබෙබා.

එවං ගහිතපමාණානඤ්ච පන දනතානං සුට්ඨු උපපරිකඛණතථං ආයාමපමාණඤ්ච පරිමණ්ඩලපමාණඤ්ච නව නව කොට්ඨාසෙකත්වා පචෙචකං ඨපෙත්වා පුන වෙ කොට්ඨාසෙ පක්ඛිපිත්වා එකාදසකොට්ඨාස භූතා ගහෙතබබා, බුද්ධකාලෙකිර එතතක පමාණයුතතායෙව

---

බුද්ධකාලයෙහිද මේ කාලයෙහිද මනුෂ්‍යයන්ගෙ ශරීරප්‍රමාණය මෙසේදතයුතුයි. මෙකල්හි මනුෂ්‍යයන්ගෙ ශරීරය උසින් නවකොට්ඨාසයෙක්ද බුද්ධකාලයෙහිවූ මනුෂ්‍යයන්ගෙ එකොළොස් කොට්ඨාසයෙක් දගතයුතුයි, මෙකලවනාහි ප්‍රකෘති මනුෂ්‍යයන්ගෙ දත් ඉතාදික්වූයේ වඩුඅඟලෙන් එක්අඟල්සමාරක් පමණවෙතියි, හාත්පසින් එක් අඟල් එක්කලාසමාරක් පමණවෙති.

ඒ මෙසේමැයි, රාමඤ්ඤරට එක්තෙරකෙණෙකුගෙ ඒ ප්‍රමාණයෙන්යුත් එක් දාඨාවක්පෙණේ, එක් මහලුපුරුෂයක්හුගෙ දතක් ඒ සමානමයයි ඇසීය, එහි එක් මහලුස්ත්‍රියකගෙ එක් දාඨාවක් එක් අඟල් එක්කලාවක්පමණවේ, එක් පුරුෂයකුගෙ එක් දතක් අඟලක්පමණමවෙයි, ලැබුනුතාක් අඩුවූදවැඩිවූද නොයෙක්විදියේ ලක්ෂණඇති දත් එක්කොට සමාන දත් ගතයුතුයි.

මෙසේ ගන්නාලද ප්‍රමාණවූ දත් පිළිබඳව යහපත්ව පරීක්ෂාකරණපිණිස දිගප්‍රමාණයද වටප්‍රමාණයද නවනවකොටස්කොට වෙන්වෙන්වතබා නැවත දෙකොටසක්බහා එකොළොස්කොටසක්වූවා ගතයුතුයි, බුද්ධකාලයෙහි වනාහි මේ ප්‍රමාණයෙන්යුක්තවූයේම

මජ්ඣිමපුරිසානං දන්තොති නිට්ඨං ගන්තබ්බං, තතො බුද්ධදන්තපමාණසල්ලක්ඛණත්ථං, බුද්ධකාලික මජ්ඣිමපුරිසානං යෙව යථා වුත්තපමාණං දන්තං ගහෙත්වා තයො කොට්ඨාසෙ කත්වා පුන අපරස්ස එකස්ස කොට්ඨාසස්ස පක්ඛෙපෙනචතු කොට්ඨාසිකං ගහෙතබ්බං, යත්තකං පඨමමෙව ගුණිතං තත්තකෙන හාරණං කාතබ්බං.

එවංපන ගය්හමානෙ ලක්ඛණෙ තස්ස භගවතො දාඨාලක්ඛණං ආයාමතොච පරිමණ්ඩලතොච සුවිදිතංහොති, එත්තකපමාණයුත්තායෙවකිර භගවතො දාඨාති නිට්ඨංගන්තබ්බං, එවං භගවතො දාඨාපමාණං විදිත්වා තතො යස්මා දාඨාමුලං මහන්තතෙන තිකොට්ඨාසිකං, දාඨග්ගංපන ද්විකොට්ඨාසිකං හොති, තස්මා යථා භූතවිධිඅනුරූපතො අවිරුද්ධෙයෙව කොට්ඨාසකලාදිවසප්පවත්තනෙන ලෙඛවිධිනා ලක්ඛණෙ සුඨුපයොජිතෙ භගවතො දාඨාපමාණං පච්චක්ඛතො සුවිදිතං භවිස්සති, යාවජ්ජතනා සීහළදීපෙ දිස්සමානාය දන්තධාතුයා කිඤ්චිපි විසදිසං නහෙස්සති, ඉදම්පි සුඨුඋපධාරෙත්වා වීමංසිත්වා ගහිතං, තෙනෙවං අම්හෙහි සන්නිට්ඨානං කතං, තෙන භගවතො කායො ද්වාදසහත්ථො හොති දන්තධාතු ලක්ඛණස්ස සක්ඛිභාවෙන සුපඤ්ඤත්තන්ති.

---

මධ්‍යමපුරුෂයාගෙ දතැයි තීන්දුවටයායුතුයි, ඉක්බිති බුද්ධදන්තයන්ගෙ ප්‍රමාණ සලකණපිණිස බුද්ධකාලයෙහි ඇතිවූ මධ්‍යමපුරුෂයාගෙම කියනලද ප්‍රමාණ දතක්ගෙණ තුන්කොටසක්කොට නැවත අනික් එක් කොටසක්හුගෙ බහාලීමෙන් සතරකොටසක් ගතයුතුයි. යම්පමණක් පළමුගුණකරණලද්ද, එපමණකින් හැරදැමීමකටයුතුයි.

මෙසේ වනාහි ලක්ෂණගනුලබනකල්හි ඒ බුදුන්ගෙ දංෂ්ට්‍රාලක්ෂණය දිගින්ද පරිමණ්ඩලයෙන්ද මනාවවැටහෙයි, බුදුන්ගෙදාඨාව මෙතෙක් ප්‍රමාණයුක්තමැයි කියා තීන්දුවටයායුතුයි, මෙසේ බුදුන්ගෙ දාඨාප්‍රමාණයදැන, ඉක්බිති යම්හෙයකින් දාඨාවේමුලමහත තුන්කොටසක්හා දාඨාග්‍රයදෙකොටසක්වේද, එහෙයින් යථාභූතවිධියට අනුරූපවශයෙන් අවිරුද්ධවම කොටස් කලාදිවශයෙන් පැවැති ලෙඛවිධියෙන් ලක්ෂණ මනාකොට යෙදූකල්හි බුදුන්ගෙ දාඨාප්‍රමාණය ප්‍රත්‍යක්ෂවශයෙන් මනාවවැටහෙන්නේය, මේ කාලයදක්වා ලක්දිව දකිනුලබන දන්තධාතුවට කිසිමවෙනසක්නොවන්නේය, මේක යහපත්වසොයා විමසාගන්නාලද්දේය, එහෙයින්ම අපවිසින් තීන්දුකරණලද්දේය, බුදුන්ගෙශරීරය දොළොස්රියනක්නොවෙයි, දන්තධාතුලක්ෂණය සාක්ෂිවීමකරණකොටගෙණ ඉතා ප්‍රකටහෙයිනී.

තෙ නෙතථ පණඩිතා දෙසා යුතතකාරණ වාදිනො,
යථා වුතතානු සාරෙන සමමාදිසිං උපෙනතුවොති.

## ලෙ ඛ වි ධා න ක ථා .

ලෙඛාරමභං දසෙසතවාන යථාකායො තථාගතො,
පමාණං අනුමානෙන ගහෙතවා සුවිනිචඡයෙ.

සො භගවා අරහං සමමාසමබුධො සබබසොව පරිපුණ්ණ මහාපුරිසලකඛණො දෙවෙච මනුසෙසච අතිකකමම පුඤඤසමප දායචෙව පඤඤාවෙයයතතීයෙනච සමනනාගතො රූපසිරි සො භගගපපතෙතායෙව අහොසි, තසසඛො පන භගවතො කායො උබෙබධතො අතතනොවයාමෙන සමවයාමපපමාණො හොති, විතථාරතො හතථපපමාණො, පුථුලතො විදතථිපපමාණො, සොපන වඩඪකඩගුලවසෙන ගය්හමානො එකුනතිංසුතතරඩගුල සතුබෙබධො හොති, සීසංපන උබෙබධතො සුගතඩගුලෙන සොළසඩගුලංහොති, කෙසරුහනට්ඨානං චතුරඩගුලංහොති, තදවසෙසං තීහිකොට්ඨාසෙහි විභජිතබබං, විතථාරතො පන වෙකණ්ණානි ඨපෙතවා සබබං මුඛමණඩලං දසඩගුලංහොති, නාසිකගගං එකඩගුලමතතං හොති,

---

එහෙයින් යුතුකාරණයක්කියන නිර්දොෂපණ්ඩිතවරු යටකියනලද අනුසාරයෙන් මෙහිදී සම්‍යක්දෘෂ්ටිය හෙවත් සත්‍යය දැන ගැණීමට පැමිණෙත්වයි.

## ලෙ ඛ වි ධි ක ථා ව යි .

ලෙඛාරමභය දක්වා බුදුන්ගේ යම්ප්‍රමාණ ශරීරයක් ඇත්තේද (ඒ) ප්‍රමාණය අනුමානවශයෙන් ගෙණ යහපත්කොට විනිශ්චයකරන්නෙමි,

ඒ භාග්‍යවත් අභීත් සම්‍යක්සම්බුඩයන් වහන්සේ හැමලෙසින්ම සම්පූර්ණ මහාපුරුෂ ලක්‍ෂණ ඇත්තේ දිව්‍යමනුෂ්‍යයන් ඉක්මවා පුණ්‍යසමපතතියෙන්හා ප්‍රඥාවෛයක්තියෙන්ද සමන්විතවූයේ රූපශ්‍රී සෞභාග්‍ය ප්‍රාපතවූයේම්විය, ඒ බුදුන්ගෙ ශරීරය වනාහි උසින් තමන්ගෙ බඹයෙන් සමවූ බඹයක් පමණවෙයි, පුලුලින් රියනක්පමණවෙයි, ඝනින් වියතක් පමණවෙයි, කෙසරුහන සථානය සතරඟුලක්වෙයි, එයින් ඉතිරිහරිය තුන්කොටසකින් බෙදියයුතුයි, ඒශරීරය වනාහි වඩුඅඟුල්වසයෙන් ගනුලබන්නේ එක්සිය එකුන්තිස් අඟුලක් උස්වෙයි, හිසවනාහි උසින් සුගත් අඟුලෙන් සොලොස් අඟුලක්වෙයි, පුලුලින් දෙකණහැර සියලු මුඛමණ්ඩලය දසඅඟුලක්වෙයි, නහස්අග එක්අඟුලක් පමණවෙයි,

උච්චතො දියඩ්ඪඞ්ගුලංහොති, විත්ථාරතො එකායකලාය සහ චඞ්ගුලමත්තමෙව චක්ඛූනිපිආයාමතො චඞ්ගුලානි හොන්ති, විත්ථාරතො තිකලා, මුඛම්පි චතුරඞ්ගුලංහොති, කණ්ණානිපි විත්ථාරතො අඩ්ඪඞ්ගුලෙන සහචඞ්ගුලානිහොන්ති,ආයාමතොචඡළඞ්ගුලානිහොන්ති,දියඩ්ඪඞ්ගුලමත්තංඑකපසෙසතපත්ථානි,කණ්ඨොපිඋබ්බෙධෙනචතුරඞ්ගුලොමහොති, තිරියතො සත්තඞ්ගුලමත්තොයෙව, උභොඅංසාපි පුථුලතො ඡළඞ්ගුලාහොන්ති,උරමජ්ඣංචුද්දසඞ්ගුලංහොති.

බාහුමූලං පුථුලතො ඡළඞ්ගුලංහොති, ආයාමතො සත්තරසඞ්ගුලංහොති, කච්ඡතොපට්ඨාය යාවඅඞ්ගුලග්ගා එකචත්තාලීසඞ්ගුලානිහොන්ති. මණිබන්ධංත්‍යඞ්ගුලංහොති, හත්ථතලම්පි ඝනමණ්ඩලබ්භන්තරෙ ආයාමතො ඡළඞ්ගුලංහොති විත්ථාරතො ඡළඞ්ගුලං, අඞ්ගුට්ඨකා ආයාමතො පඤ්චඞ්ගුලාහොන්ති, සෙසාපන අඞ්ගුලියො අඤ්ඤමඤ්ඤ සමාහොන්ති, යාවහත්ථතලස්ස මජ්ඣිමට්ඨානං තාවඅට්ඨඞ්ගුලා, තාසම්පන ආයාමතො සත්තඞ්ගුලානිහොන්ති, සකලං නාභිමණ්ඩලං එකඞ්ගුලමත්ත මෙවහොති, සොණිපි සොළසඞ්ගුලාහොති, නාභිතොපට්ඨාය යාවගලම්හා එත්ථන්තරෙ අට්ඨාරසඞ්ගුලානි හොන්ති, නාභිතොපට්ඨාය යාවජාණුමණ්ඩලා එත්ථන්තරෙ සත්තවීසති අඞ්ගුලානිහොන්ති, ජාණුමණ්ඩලතොපට්ඨාය යාවපාදතලා එත්ථන්තරෙසම තිංසඞ්ගුලානි හොන්ති, පාදාපි චතුධා විභත්තාහොන්ති පාදඞ්ගුලිච පාදපිට්ඨිච ගොප්ඵකොච පණ්හිචාති, ඉමෙසුහි එකෙකො භාගො අඩ්ඪුඩ්ඪඞ්ගුලොහොති,

---

උසින් එක්අඟුල් සමාරක්වෙයි, පුලුලින් දෑඟුල්එක්කලාවක්පමණවෙයි, ඇස්දෙකත් දිගින් දෑඟුල්වෙත්, පුලුලින් තුන්කලාවෙකි, මුහුනද සතරඟුලක්වෙයි,කන්දෙකද පුලුලින් දෑඟුල්සමාරක්වෙති, දිගින් දෑඟුල්වෙති, එක්පාර්ශවයකින් එක්අඟුල්සමාරක් පමණ පුලුල්වේ, බෙල්ලද උසින්සතරඟුලක්වෙයි, සරසින් සත්අඟුලක්පමණවෙයි, දෙඅංසයද පුලුලින් සාඟුල්වෙත්, ලයමැද තුදුස් අඟුල්වෙයි.

බාහුවමුල පුලුලින් සාඟුලක්වෙයි, දිගින් සතළොස් අඟුලක්වෙයි, කිසිල්ලේපටන් ඇඟිලි කෙළවරදක්වා එක්සාළිස් අඟුල්වෙත්, මැණික්කට්ටුව තුන්අඟුලක්වෙයි, හසතතලයද ඝනමඩුලුඅතර දිගින් සාඟුලක්දවෙයි, පුලුලින් සාඟුලක්වෙයි, මාපටඇඟිලි දිගින් පසඟුල්වෙත් සෙසුඇඟිලි ඔවුනොවුන් සමවෙත්, යම්තාක්අල්ලේ මධ්‍යමස්ථානද ඒතාක් අටඟුලකි, ඔවුන්ගෙ වනාහිදිගින් සත්අඟුල්වෙත්, සියලුනැබ මඬල එක්අඟුල් පමණවෙයි, කටියද සොළොස් අඟුල්වෙයි, නාභියේපටන් ගෙලදක්වා මේඅතර අටළොස් අඟුල්වෙත්, නාභියේපටන් දනමඩලදක්වා මේඅතර සත්විසි අඟුල්වෙත්, දනමඬුල්ලේපටන් යම්තාක් පතුලදමේඅතර සමතිස් අඟුල්වෙත්,පාඇඟිලිද පාපිටද ගොප්ඇටද විලුඹදැයි කියා පාදයසතරකට බෙදනලදුහුවෙති, මෙවුන් අතුරෙහිඑකිඑකී කොටස තුන්අඟුල් සමාරක්වෙයි.

පාදතලානි ආයාමතො චුද්දසඞ්ගුලානිහොන්ති, විත්ථාරතො අඩ්ඪඞ්ගුලෙන සහ පඤ්චඞ්ගුලානි හොන්ති, පණ්හිපි තාදඞ්ගුලා හොති, යදිභගවා පල්ලඞ්කං ආභුජිත්වා නිසින්නො අස්ස, තස්ස ඛොපනභගවතො කායො උබ්බෙධෙන චඞ්ගුලුත්තර විහත්ථොහොති, තෙන තස්සඞ්ගුලෙනාපි අංසකූටතො පට්ඨාය යාව කප්පරා සත්තඞ්ගුල විදත්ථිමත්තං හොති, උච්චඞ්ගට්ඨානංපි විත්ථාරෙන ඡළඞ්ගුලුත්තර හත්ථංදියඩ්ඪ හොති, නිසදට්ඨානස්ස තිරියතො හත්ථමත්තමෙව.

ජාණුමණ්ඩලතො පට්ඨාය යාවපාදඞ්ගුල්‍යග්ගා සත්තතිංසඞ්ගුල මත්තංහොති, අථාපි සො පල්ලඞ්කෙන නිසින්නො තිරියතොච සත්තඞ්ගුලුත්තර විදත්ථිපමාණොහොති, නිසදට්ඨානතො පන යාවනාභි දසඞ්ගුලාහොති, කටිපිවිත්ථාරෙන තෙරසඞ්ගුලා හොති, කටිතොපට්ඨාය යාවජාණුමණ්ඩලා එත්ථන්තරෙ සමතිංස අඞ්ගු ලානිහොන්ති, තම්පිජාණුමණ්ඩලං ඡළඞ්ගුලමත්තං හොති, ඌරූපි පුථුලතො අඩ්ඪඞ්ගුලප්පමාණා හොන්ති, නිසින්නකාලෙපන ඡළඞ්ගුලමත්තාව හොන්ති, ඉදංපමාණං සුගතඞ්ගුල වසෙනෙව ගහිතංහොති, වීමංසිත්වා ගහෙතබ්බං.

නහිමයං තං භගවන්තං පස්සිතුං ලභිම්හ,සොචභගවා සුචිරපරිනිබ්බුතො අනුපාදිසෙසාය ඛන්ධපරිනිබ්බාණාය, කුතො අම්හාකං ආධුනිකානං සතං තස්සභගවතො සුචිරපරි නිබ්බුතස්ස දස්සනං

---

පතුල් අයමින් තුදුස් අඟුල්වෙත්, විතරින් පස්අඟුල් සමාරෙක් වෙත්,විලුඹ තුන්අඟුලෙක්වෙයි, ඉදින් බුදුරජානන්වහන්සේ පයඞ්ක බන්ධනයකොට වැඩහුන්නේනම් ඒ බුදුන්ගෙ ශරීරය උසින් දෙරියන් දැඟුලක්වෙයි, බුදුන්ගෙ ඒඅඟුලෙන්ද ජත්‍රුවේපටන් වැලමිටදක්වා එක්වියත් සත්අඟුලක් පමණවෙයි, උකුලද පුලුලින් සාඟුල්එක්රියන්සමාරක්වෙයි, පිඩිය සරසින් රියනක් පමණමැයි

දනමඬුල්ලේපටන් පාඇඟිලිඅගදක්වා සත්තිස්අඟුලක්පමණ වෙයි, එසේදවුවත් බුදුරජානන් වහන්සේ පයඞ්කයෙන් වැඩහුන්නේවීනම් සරසින් එක්වියත්සත්අඟුල්පමණවෙයි, පිඩියපටන් නාභියදක්වා දසඅඟුලක්වෙයි, කටියද පුලුලින් තෙළෙස්අඟුලක් වෙයි, කටියපටන්දනමඬුල්ලදක්වා මේඅතර සමතිස්අඟුල්වෙත්, ඒ දනමඬුල්ල සාඟුලක්පමණවෙයි, කලවද පුලුලින්අටඟුලක්පමණවෙත්, හුන්කල්හි සාඟුලක්පමණවෙත්, මේප්‍රමාණයත් සුගත් අඟුල්වශයෙන්ම ගන්නාලද්දේවෙයි, විමසාගතයුතුයි.

අපි ඒභාග්‍යවත්හු දකින්ටනොලැබීමු, ඒභාග්‍යවතුන්වහන්සේ නිරුපධිශෙෂ ස්කන්ධපරිනිර්වාණයෙන් පිරිනිවී ඉතාබොහෝ කල්ය, පිරිනිවි ඉතාබොහෝකල්වූ ඒබුදුන්ගේ දැකීමක් ආධුනිකවූ

කෙවලං පන මයං තෙනෙව භගවතා දෙසිත පඤ්ඤත්තං ධම්මඤ්ච විනයඤ්ච ආචරියඨානෙ ඨපෙත්වා ධම්මයුත්තිකගණාධිපතිස්ස ථෙරස්සචෙව අත්තනො ආචරියභූතස්ස අඤ්ඤෙසඤ්ච පඤ්ඤවන්තානං සබ්‍රහ්මචාරීනං වාදනයෙව ඨත්වා අත්තනොපිචා අනුමාන ඤාණෙන එවං පමාණං ගණ්හාම.

ඉදානිපි තස්සභගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස පත්තප්පමාණකථා සමාරභියතෙ, තස්සඛොපන භගවතො කීවමහන්තො වච්ඡිස්සති පමාණ තොතා කීවමහන්තො පමාණාතික්කන්තොති, වෙරඤ්ජකණ්ඩ ආගතපාළිනයෙන තාව ඉදංලක්ඛණං සමානෙතබ්බං, තත්‍ථහි එවමාගතං.

“තෙනඛො පන සමයෙන උත්තරාපථකා අයා. වාණිජා පඤ්චමත්තෙහි අස්සසතෙහි වෙරඤ්ජායං වස්සංවාසං උපගතා හොන්ති, තෙහි අස්සමණ්ඩලිකාසු භික්ඛූනං පත්ථපත්ථ පුලකං පඤ්ඤත්තංහොති, භික්ඛූ පුබ්බණ්හ සමයංනිවාසෙත්වා පත්තචීවර මාදාය වෙරඤ්ජායං පිණ්ඩාය පවිසිත්වා පිණ්ඩං අලභමානා අස්ස මණ්ඩලිකාසු පිණ්ඩාය චරිත්වා පත්ථපත්ථපුලකං ආරාමංහරිත්වා උදුක්ඛලෙ කොට්ටෙත්වාකොට්ටෙත්වා පරිභුඤ්ජන්ති, ආයස්මා පනා නන්දො පත්ථපුලකං සිලායං පිංසිත්වා භගවතො උපණාමෙසි, තං භගවා පරිභු ඤ්ජති,

---

අපට කොසින්ලැබේද, හුදෙක් අපි වනාහි ඒබුදුන්විසින් දෙසූපැණවූ ධම්මයද විනයද ගුරුතන්හිතබා ධම්මයුත්තිකනිකායෙහි අධිපතිවූ අපගෙ ආචාර්‍ය්‍යස්ථවිරයන්වහන්සේගේද අනිකුදුනුවනැති සබ්‍රම්සචාරීන්ගේද වාදක්‍රමයෙහි පිහිටා තමන්ගේත් අනුමාන ඥානයෙන් මෙසේප්‍රමාණයගනිම.

දැන් ඒභාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුන්ගේ පාත්‍රයේප්‍රමාණ කථාවද පටන්ගණුලැබේ, බුදුන්ගෙ කෙතෙක්මහත්වූ පාත්‍රයප්‍රමාණයුත්ව වටනේද, කෙතෙක්මහත්වූ පාත්‍රය ප්‍රමාණා ක්‍රාන්තවේදැයි, වෙරඤ්ජකාණ්ඩයෙහි ආපාලික්‍රමයෙන් පළමුකොට මේලක්ෂණය එළවියයුතුයි, එහි මෙසේආයේය.

“එකල්හිවනාහි උත්තරාපථයෙහිවූ අස්වෙළෙන්දෝ අසුන් පන්සියයක්සමග වෙරඤ්ජානම්නුවරවැසි සාරමසවිසීමට එළඹියාහුවෙති, ඔවුන්විසින් අස්මඩුල්ලෙහි භික්ෂූන්ට ඇඟිපිපතපත තබනලද්දේවෙයි, භික්ෂූහු පෙරබත්කාලයෙහි හැඳපොරවා සිවුරඅංසකූටයෙන්හා පාත්‍රයඅතින්ගෙණ වෙරඤ්ජාවට (පිණ්ඩචාරිකවතෙහි කීනයින්) පිඬුසිගාවැඩ පිඬුනොලබන්නාහු අස්මඩුල් ලෙහි පිඩුපිණ්සහැසිර ඇඟිපිපතපත විහාරයටගෙණවුත් වනේලාකොටකොටා පරිභොගකෙරෙති, ආයුෂමත් ආනන්දස්ථවිරතෙම

අට්ඨකථායං පන එවං වුත්තං පත්ථපත්ථපුලකන්ති එකමෙකස්ස භික්ඛුනො පත්ථපත්ථ පමාණං පුලකං, පත්ථො නාම නාළිමත්තං හොති එකස්ස පුරිසස්ස අලංසාපනාය, වුත්තම්පිහෙතං, "පත්ථොදනො නාලමයං දුවින්නන්ති" පුලකං නාම නිත්ථුසං කත්වා උස්සෙදෙත්වා ගහිත යවතණ්ඩුලා වුච්චන්තීති.

ටීකාචරියා පන සබ්බත්ථ එවං වදන්ති, "පකතියා චතුමුට්ඨිකං * කුඩුබං චතුකුඩුබං නාළි, තාය නාළියා සොළසනාළියො දොණන්ති වදන්තීති ධම්මපාලත්ථෙරෙන වුත්තන්ති" තංහියුත්තං, අභිධානප්පදීපිකායං වුත්තවචනෙන සමෙති.

"කුඩුබො පසතො එකො පත්ථො තෙ චතුරොසියුං,
ආළ්හකො චතුරො පත්ථා දොණං වා චතුරාළ්හකන්ති."

තස්මාහං එවං මඤ්ඤාමි, තණ්ඩුලානං සොළසමසීයො පත්ථො නාම පත්ථොදනොපි එකස්ස පුරිසස්ස පහොස්සති ජීවිකං කප්පෙතුං, වුත්තංහෙතං, පත්ථොදනො නාලමයං දුවින්නන්ති.

---

පතක්පමණඇඟිට් ගලෙහිලාසුණුකොට බුදුන්ටඑළවිය, භාග්‍යවත් තෙම ඒ ඇඟිට්වැලඳීය, අටුවාවෙහි මෙසේකියනලදී, පත්ථපත්ථපු ලකයනු එකිඑකී භික්‍ෂුවක්හට පතක්පමණඇඟිට්යි, පත්ථනම්නැ ළියක්පමණවෙයි, එක්පුරුෂයෙක්හට යැපීමටතරම්සෑහෙයි, මේ කියනලදමැයි, පත්ථොදනොනාලමයංදුවින්නංයි පතක්බත දෙදෙ නෙකුටනොසෑහෙයි යනුභාවයි, පුලකනම් පොතුහැරමදක්නාමබා ගන්නාලද යවහාල්යයි කියනුලැබෙති.

ප්‍රකෘතියෙන් සතරමිටක් උලක්කුවෙකි හෙවත් කුඩුබයෙකි කුඩුබසතරක් නැළියෙකි ඒ නැළියෙන්සොළොස්නැළියෙක් ද්‍රො ණයයිකියතියි ධම්මපාලස්ථවිරයන් වහන්සේවිසින් කියනලදූයි, මෙසේ ටීකාචාය්‍යීවරු හැමතැන්හිකියති ඒ යුතුයි, අභිධානප්‍රදීපි කාවෙහි කියනලද ක්‍රමයහාසමවෙයි.

එක් * අතලොස්සක්උලක්කුවෙකි, උලක්කුසතරපතක්වන් නාහ, පතසතරනැළියෙක, නැළිසතරද්‍රොණයෙකි."

එහෙයින් මම මෙසේසිතමි, සහල්සොළොස්මිටක් පතක්නම්වේ, පතක්බත එක්පුරුෂයෙකුගෙ ජීවිකාවටපොහෝනේයි, පත්ථො දනොනාලමයංදුවින්නං යනු මේනිසාකියනලදී, අත්‍ථයටකීනයින් දන්නේය.

---

* සියම්පොතේ "කුඩුබබ" හැමතැන.

* "පසතොපාණිකඤ්චිතොයි" අභිධානහෙයින් අතබොකුටු කොටගත්කල අතලොස්සකි.

තස්මා විඤ්ඤූහි සප්පුරිසෙහි සුගතවිදත්ථිවිධානං ජානන්තෙහි පමාණලක්ඛණමෙව ගහෙතබ්බං, සො හි භගවා දිවසෙ දිවසෙ අත්තනො පත්තප්පමාණං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය තස්ස බො පන භගවතො පත්තො අට්ඨචත්තාළීසමුට්ඨිපමාණං ඔදනම්පි ගණ්හෙය්‍ය, සො ච භගවතො උදරස්ස පමාණමෙව ගණ්හාති. වුත්තංහෙතං භගවතා.

“අහංබොපන උදායි අප්පෙකදා ඉමිනාපත්තෙන සමතිත්තිකම්පි භුඤ්ජාමි භිය්‍යොපි භුඤ්ජාමීති.” තඤ්හි විනයපාළියාපි සමෙති, තථාපි පාළියං“ඔමකොනාම පත්තො පත්ථොදනංගණ්හාතීති ච සමතිත්තිකංපිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛාකරණීයාතිචාති ආගතං, අපරම්පි විසුද්ධජනවිලාසිනියං වුත්තං, තම්පිආහරිත්වා සංසන්දෙතබ්බං.”

“සුජාතාකිර සෙට්ඨිධීතා එකම්පාතිං අඤ්ඤාය සුවණ්ණපාතියා පටිකුජ්ජිත්වා ඔදාතවත්ථෙනවෙඨෙත්වා සුවණ්ණභිඞ්කාරෙන ගන්ධපුප්ඵවාසිතං උදකංගහෙත්වා බොධිසත්තං උපගන්ත්වා අට්ඨාසි.” ඝටිකාරමහාබ්‍රහ්මුනා දින්නො මත්තිකාපත්තො එත්තකං අද්ධානං බොධිසත්තං අවිජහිත්වා * තස්මිංඛණෙ අදස්සනංගතො, බොධිසත්තො පත්තං අපස්සන්තො දක්ඛිණහත්ථං පසාරෙත්වාඋදකං සම්පටිච්ඡි,

---

එහෙයින් සුගත්වියත්විධියදන්නා නුවනැතිසත්පුරුෂයන්විසින් ප්‍රමාණලක්‍ෂණයමගතයුතුයි, ඒ බුදුහුවනාහි දවසක්දවසක්පාසා තමන්වහන්සේගෙ පාත්‍රයේප්‍රමාණ පිණ්ඩපාතය වළඳන්නේය, ඒ බුදුන්ගෙපාත්‍රය අටසාළිස්මිටක් පමණබත්ගන්නේය, ඒපාත්‍රයද බුදුන්ගෙකුසේ ප්‍රමාණමගණීයි, ඒ වනාහි බුදුන්විසින්වදාරණලදී. “උදායිය! මමවනාහි සමහරදවසක මේපාත්‍රයෙන්සමව පිරුණාවූ පාමුවවිටඇතිආහරයදවලඳමි, වැඩියදවලඳමියි.” ඒ කාරණයවනාහි විනයපාලියහාදසමවෙයි. එසේහෙයින්වනාහි බුදුන්වදාළපාලියෙහි ඔමකපාත්‍රයනම් පතක්පමණ බත්ගන්නේයයිද පාත්‍රයේමුවවිට සටරේඛාවහාසමවපිරුණාවූ පිණ්ඩපාතයපිළිගන්නෙමියි ශික්‍ෂාව කටයුත්තීයයිද ආයේය, අනිකකුදු විසුද්ධජනවිලාසිනියෙහි කියන ලද්දේය, ඒද එළවාගෙණ සංසන්දනයකටයුතුයි.

“සුජාතානම් සිටුදූවනාහි එක්රන්තලියක් අනික්රන්තලියකින්වසා සුදුවස්ත්‍රයකින්වෙළා ගඳමලින් සුවඳකවනලද පැන්රන් කෙණ්ඩියකින්ගෙණ බෝසත්කරා එළඹසිටියා,
ඝටීකාරනම් මහාබ්‍රහ්මයාවිසින්දෙනලද මැටිපාත්‍රයමෙතාක්කල්බෝසත්හු අවිජහිතව එකෙණෙහිනොදක්මටගියේය, බොසත්තෙම පාත්‍රයනොදක්නේ දකුණු ශ්‍රීහස්තයදිගුකොට පැන්පිළිගත්තේය,

---

* ආවිඤ්ජහිත්වා සියම්පොතේ.

සුජාතා සහෙව පාතියාපායාසං මහාපුරිසස්ස හත්ථෙඨපෙසි, මහා
පුරිසො සුජාතං ඔලොකෙසි, සා තස්සාකාරං සල්ලක්ඛෙත්වා අය්‍ය
මයා තුම්හාකං පරිච්චත්තංගණ්හිත්වා යථාරුචිං ගච්ඡථාති වත්වා
යථාමය්හං මනොරථො නිප්ඵන්නො, එවං තුම්හාකංනිප්පජ්ජතූති
වත්වා සතසහස්සග්ඝනිකාය සුවණ්ණපාතියා පුරාණපණ්ණං විය
අනපෙක්ඛාහුත්වා පක්කාමි.

බොධිසත්තොපිඛො නිසින්නට්ඨානතො වුට්ඨාය රුක්ඛං පදක්ඛි
ණංකත්වා පාතිං ආදාය නෙරඤ්ජරායතීරංගන්ත්වා අනෙකෙසං
බොධිසත්තසතසහස්සානං අභිසම්බුජ්ඣනදිවසෙ ඔතරිත්වා නහා
නට්ඨානං සුප්පතිට්ඨිතතිත්ථං නාමඅත්ථි, තස්සාතීරෙ පාතිං ඨපෙත්වා
ඔතරිත්වා නහාත්වා අනෙකබුද්ධසතසහස්සානං නිවාසනං අරහත්ත
ධජං නිවාසෙත්වා පුරත්ථාභිමුඛො නිසීදිත්වා එකට්ඨිතාලපක්කප්පමා
ණෙ එකූනපඤ්ඤාසපිණ්ඩෙකත්වා සබ්බං අප්පොදකං මධුපායාසං
පරිභුඤ්ජීති" තදෑකිර භගවා අපත්තකොයෙව අහොසි, තත්ත
කොපි පායාසො භගවතො අලංයාපෙතුං.

යඤ්හි භගවතො අතිමහන්තංච සරීරප්පමාණං අට්ඨකථාචරි
යෙහි අධිප්පෙතං තම්පිඨපෙත්වා සෙසං ඉධ අත්ථසාධකංභවෙය්‍ය.

---

සුජාතාවෝ තලියහා සමග ක්ෂීරපායාසය මහාපුරුෂයානන් අත
තැබූ, මහාපුරුෂතෙමේ සුජාතාවුන්දෙසබැලූවේය, ඈතොමෝ උන්
වහන්සේගෙ ආකාරයසලකා ස්වාමීන්වහන්ස! මාවිසින් නුබවහ
න්සේට පුදනලද මේරන්තලියේකිරිබතඇරගෙණ රුචිවූස්ථානය
කට වැඩමවවූයයිකියා යම්සේ මගෙමනොරථය නිපන්නේද එසේ
ම නුබවහන්සේගෙ මනොරථයත්නිපදීවයිකියා (මසුරන්) ලක්ෂයක්
අගනා රන්තළිය පරඬලාපතක්මෙන් අපෙක්ෂාවක් නැතිවගියාය.

බෝසත්තෙමේද හුන්තැනින්නැගිට නුගවෘක්ෂයට පැදකුණු
කොටතළියගෙණ නෙරඤ්ජරානම්ගංතෙරටවැඩ නොයෙක්සි
යදහස්ගණන් බොධිසත්වයන්වහන්සේලාවිසින් බුදුබවටපැමිණෙ
නදිනයෙහි බැස ස්නානකරණතැන සුප්‍රතිෂ්ඨිතනම් තොටෙක්ඇ
ති, ඒ ගඞගාතීරයෙහි තළියතබා බැසසනහා නොයෙක් බුදුවරුසි
යදහස්ගණන්විසින් නිවාසිත අර්හත්ධ්වජයහැඳ පූර්වදිගටඅභිමුඛව
වැඩහිඳ එකඇටයක්ඇතිතල්ගෙඩියක්පමණවූ එකුන්පණස්පිඩක්
කොට දියනුමුසු සියලු මී කිරිබත වැළඳූවේය, එවිට බුදුරජානන්
වහන්සේ පාත්‍රය නැත්තෙක්වූයේය, එතෙක්දවූ ක්ෂීරපායාසය බුදු
න්ට යැපීමටසෑහිය, බුදුන්ගේ ඉතාමහත්වූ යම් ශරීරප්‍රමාණයක්
අටුවාචාරීන්වහන්සේලා විසින් කැමතිවනලදද ඒ කැමැත්තහැර
දමා සෙස්ස මෙහි අපිසාධක වන්නේය.

## අපරම්පි චෙත්ථ සාධකං

"අථඛො භගවා භික්ඛූ ආමන්තෙසි ඉච්ඡාමහං භික්ඛවෙ අඩ්ඪමාසං පටිසල්ලීයිතුං නම්හි කෙනචි උපසඞ්කමිතබ්බො අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනාති, එවම්භන්තෙති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුත්වා නාස්සුධ කොචි භගවන්තං උපසංකමති අඤ්ඤත්‍ර එකෙන පිණ්ඩපාතනීහාරකෙනාති" ඉදං නිදස්සනං.

සොහි භගවා දිවසෙදිවසෙ අත්තනො පත්තපූරං පිණ්ඩපාතං ලභෙය්‍ය සොපනස්ස පත්තො අනතිමහන්තො භික්ඛූනං පකතිපත්තෙන නාතික්කමිත්වා විනයෙ ආගතලක්ඛණානං අධිට්ඨාතබ්බකානං සත්තන්නං පත්තානං යෙනකෙනචි සම පමාණො භවෙය්‍ය, යදිසො භගවා ද්වාදසහත්ථුබ්බෙධතාය අතිවිය මහොදරො අස්ස, කථංපනස්ස එකෙන පිණ්ඩපාතනීහාරකෙන ආහටො* පිණ්ඩපාතො පහොස්සති, තස්මිංඛො පනකාලෙ නයොකොචි පිණ්ඩපාතං දෙති අඤ්ඤත්‍ර පිණ්ඩපාතනීහාරකෙන, අථඛො භගවා දිවසෙදිවසෙ එවංඅප්පාහාරතාය ජිඝච්ඡාපරෙතො හුත්වා තෙමාසංවා අඩ්ඪමාසංවා පටිසල්ලීනො භවෙය්‍ය, එවංසන්තෙ අද්ධානෙ අත්තානංකිලමිත්වා පටිසල්ලීනොති උපවදිතබ්බො අස්ස,

---

## මෙහි අතිකුදු සාධකයෙක්වෙයි

"ඉක්බිති භාග්‍යවත්තෙම භික්ෂූන්ට ආමන්ත්‍රණය කොළේය, මහණෙනි මම අඩමසක් විවෙකව වාසයකරන්ට කැමැත්තෙමි, පිණ්ඩපාතය එළවන්නාවූ එකෙකුහැර අන්කිසිවකුවිසින් නොඑළඹියයුත්තේය, එසේයස්වාමීණීයි ඒ භික්ෂූහු බුදුන්ගෙනොපුළ පිළිසවන්කොට පිණ්ඩපාතයඑළවන්නාවූ එකොකුහැර මෙහි බුදුන්කරාකිසිවෙක් නොඑළඹෙයි." මේද නිදසුනකි.

ඒ භාග්‍යවත්තෙම දවසක්දවසක් පාසා තමන්වහන්සේගේ පාත්‍රයපුරා පිණ්ඩපාතයවලදන්නේය, උන්වහන්සේගේ ඒ පාත්‍රය ඉතාමහත්නොවෙයි, භික්ෂූන්ගෙ ප්‍රකෘතිපාත්‍රයනොසික්මවා විනයෙහිආලක්ෂණයෙන්යුත් අධිෂ්ඨානකටයුතු පාත්‍රාසතඅතුරෙන් යම්කිසිවකුහාසම ප්‍රමාණඇත්තේවන්නේය, ඉදින් ඒ බුදුන් දෙළොස්රියනක් උසඇතිබැවින් ඉතාමහත් උදරයක්ඇත්තෙක් වන්නේනම් උන්වහන්සේට එක්පිණ්ඩපාත එළවන්නෙකුවිසින් ගෙණනලද පිණ්ඩපාතය කෙසේපොහෝනේවන්නේද? එකල්හිවනාහි පිණ්ඩපාතඑළවන්නෙකුහැර (බුදුන්ට) යම්කිසිවෙක් පිණ්ඩපාතනොදෙයි, ඉක්බිති බුදුහු දවසක්දවසක්පාසා මෙසේඅල්පාහාරඇතිබැවින් ජිඝත්සාවෙන්පීඩිතව තෙමසක්හෝ අඩමසක්හෝ විවෙකවාසඇත්තෙකවන්නේය, මෙසේඇතිකල්හී ආස්ථානයෙහි ශරීරක්ලාන්තකොට විවෙකවවිසූයේයයි අපවාදකටයුතුවන්නේය,

---

* ආහතො.

නහි භගවා අඤ්ඤෙන උපක්කමෙය්‍ය, තනුපක්ඛන්තං භගවතා න භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං යො පාතෙය්‍ය ආපත්ති දුක්කටස්සාති" එත්ථ ච කෙවලම්පි න පාතෙතබ්බං, අඤ්ඤම්පි යෙනකෙනචි උපක්කමෙන අන්තමසො ආහාරූපච්ඡෙදනෙන *පි න මාරෙතබ්බං, යොපි හි ගිලානො විජ්ජමානෙ භෙසජ්ජෙ × සනෙනාසු උපට්ඨාකෙසු ච මරිතුකාමො ආහාරං උපච්ඡින්දති දුක්කටමෙවාති අට්ඨකථායං වුත්තං, ඉදං ඨානං පණ්ඩිතෙහි පඤ්ඤාය අනුවිචාරෙතබ්බං. විචාරෙත්වා උපධාරෙතබ්බං, අම්හාකං ඛ නාථ, යත්තකො හි පිණ්ඩපාතො දිවසෙදිවසෙ පිණ්ඩපාත නීහාරකෙන ආහටො, තත්තකො යෙව තස්ස පහොස්සති, සො ඛො භගවා දිවසෙ දිවසෙ පඤ්ච චත්තාළීස මුට්ඨිපමාණං ඔදනං පරිභුඤ්ජති, තස්ස පත්තො ඔදනස්ස අඩ්ඪචත්තාළීස මුට්ඨි පමාණ යුත්තො හොති, එකාපි ඔදනස්ස මුට්ඨිමාසකානං අඩ්ඪුත්තර නවුත්‍යාධික සතෙන තුලිතබ්බ සමභාගො හොතීති. අපරම්පි ඊදිසං බහූසු සුත්තන්තෙසු ආගතං තතො සමාහරිත්වා සංසන්දෙතබ්බං.

## සරීරපත්තපමාණකථා.

සරීරස්සච පත්තස්ස පමාණං උදරස්සච,
දස්සෙත්වාන පරික්ඛාරං පමාණ යුත්තමාරභෙ.

බුදුහුආස්ථානයෙහි උපක්‍රමනොකරන්නේය, "මහණෙනි ශරීරය නොහෙළිය යුතුයි යමෙක් හෙළන්නේනම් ඔහට දුකුළාඇවැත්වෙයි"(කියා)බුදුන් විසින් සික්‍ෂාපද පණවනලද්දේ නොවේද,මෙහිදී හුදෙක් නොහෙළිය යුතුයි, අනික්යම්කිසි උපක්‍රමයකින් තබා සටත්පිරිසයෙන් ආහාරූපච්ඡෙදයකිනුදු නොමැරිය යුතුයි, යම්රොගාතුරයෙක් බෙහෙත් ඇතිකල්හිදු උපස්ථායකයන් ඇතිකල්හිදු මැරෙණු කැමැත්තේ ආහාරූපච්ඡින්දනය කෙරේද (ඔහට) දුකුළා ඇවැත්මැයි අටුවාහී කියනලද්දේය, මේකාරණය පණ්ඩිතයන් විසින් නුවනින් සෙවියයුතුයි, සොයාදැරියයුතුයි, අපේකැමැත්ත,යම් පමණ පිණ්ඩපාතයක් දවසක්දවසක් පාසා පිණ්ඩපාත එළවන්නෙකු විසින් ගෙණෙන ලද්දේද, එතෙක්ම උන්වහන්සේට පොහොනේ වන්නේයයිකියාය, ඒබුදුහු දවසක් දවසක් පාසා පන්සාළිස් මිටක්පමණ බත්වළදයි, උන්වහන්සේගෙ පාත්‍රය බත්අටසාළිස්මිටක ප්‍රමාණයුත්තවෙයි, එකබත්මිටක් යවඇටඑක්සිය අනූඅටකින්කිරියයුතු සමකොටසක් වෙයි. බොහෝසූත්‍රවල ආවාවූඅනිකුදු මෙබඳු කාරණා ඒ ඒතැනින් එළවා සංසන්දනයකටයුතුයි.

## ශරීරයේහාපාත්‍රයේ ප්‍රමාණපිළිබඳකථාවයි.

ශරීරයේද පාත්‍රයේද ප්‍රමාණය දක්වා ප්‍රමාණ යුක්තවූ පරිෂ්කාර කියන්ට පටන්ගන්නෙමි.

* 'ආහාරුපච්ඡෙදනෙන' × 'උපට්ඨාකෙසුච' සියම්පොතේ.

සං යං වත්‍ථු සුගතස්ස විදත්ථිලක්ඛණූපගං,
සම්මූල්හෙහි දු විඤ්ඤෙය්‍යං ඉධතං තං විභීයතෙ.

සුගතවිදත්ථිවිධානෙ හි කප්පියා කප්පියං ජානිතු කාමෙන ස ද්ධෙචව පඤ්ඤඤ්ච පුරෙචාරිකං කත්වා නසද්ධාමත්තෙනෙව සවණමත්තෙනෙව ගහෙතබ්බං, අත්තනො පඤ්ඤානුරූපෙන ප න විචාරෙතබ්බං, ඉමස්මිංබොපනට්ඨානෙ යංයං සුගතඞ්ගුලවසෙ න භගවතා පඤ්ඤත්තං, ඉධපි තංතං සමාහරිත්වා වඩ්ඪකඞ්ගුල වසෙනෙව විභජිත්වා අත්ථමත්තං සෙවගහෙත්වා සංවණ්ණීයතෙ, එතානිබො නවසුගතවිදත්ථි පටිසංයුත්තානි විභඞ්ගෙච ඛන්ධකෙ ච ආගතානි හොන්ති.

කුටිකාරසික්ඛාපදං තාව තෙනභගවතා ජානතාපස්සතා අර හතා සම්මාසම්බුද්ධෙන එවංපඤ්ඤත්තං, "සඤ්ඤාචිකාය පන භික්ඛු නා කුටිංකාරය මානෙන අස්සාමිකං අත්තුද්දෙසං පමාණිකා කා රෙතබ්බා, තත්‍රිදංපමාණං දීඝසොළසදස විදත්ථියො සුගත විදත්ථියා තිරියං සත්තන්තරාති"
අට්ඨකථායංපන යොපනලෙසං ඔඩ්ඩෙනෙතා යථාවුත්ත පමාණමෙව කරිස්සාමීති දීඝතො එකාදස විදත්ථියො තිරියං අට්ඨවිදත්ථියො දීඝ තොවා තෙරස විදත්ථියො තිරියංඡවිදත්ථියො කරෙය්‍ය, නවට්ටති

---

යම්යම් වස්තුවක් සුගත්වියත සම්බන්ධ ලක්ෂණයෙන් යුත්තද, ඒ ලක්ෂණය මුලාවූවන් විසින් නොදත හැකිද මෙහිදී ඒ ලක්ෂ ණය විශෙෂයන් ප්‍රකාශ කරණුලැබේ.

සුගත්වියත් විධියෙහි කැපනොකැප දැනගනු කැමැත්තාහු වි සින් ශ්‍රද්ධාවද ප්‍රඥාවද පුරස්සරකොට ශ්‍රද්ධාමාත්‍රය කින්හෝ ශ්‍රවණ මාත්‍රයකින්හෝ නොගතයුතුයි, තමාගෙ නුවනට සුදුසු පරිද්දෙන් සෙවියයුතුයි, මේස්ථානයෙහිදී යමක් යමක් සුගත් අඟුලවශයෙ න් බුදුන් විසින් පණවන ලද්දේද මෙහිදීත් ඒඒ එළවා වඩුඅඟුල් ව ශයෙන්ම විභාගකොට අර්ථමාත්‍රයක්මගෙණ වර්ණනාකරණු ලැබේ සුගත් වියත පිළිබඳවූ මේ ශික්ෂාපදනවය විභඞ්ගයෙහිද ඛන්ධක යෙහිද ආවාහුවෙත්.

කුටිකාර ශික්ෂාපදය භාග්‍යවත්වූ ආසයානුසය දන්නාවූ ස ර්වධර්මයන් දක්නාවූ කෙලෙස් සතුරන් නැසූහෙයින් අර්හත්වූ ඒ සර්වඥයන්වහන්සේ විසින් පළමුකොට මෙසේ පණවන ලද්දේ ය, තමාවිසින් ඉල්වාගත් වැපොරෝආදී උපකරණයෙන් කර වාදෙන හිමියන් නැතිහෙයින් අස්වාමිකවූ තමා වසන පිණිස කරවන බැවින් තමාඋද්දෙසකොට ඇති කුටියකරවන්නාවූ භික්ෂුව විසින් ප්‍රමාණයෙන් යුත්තව කරවිය යුතාහීය, ඒකුටියේ මේප්‍රමාණයි සුගත් වියතින් බිත්තියේ පිටත දිගින් දොලොස්වියතෙක, පුළු ල ඇතුළේ සත්වියතෙක.
අටුවාවේවනාහි, යමෙක් යටකියනලද ප්‍රමාණයම කරන්නෙමිසිලෙ සයක්හෙළමින්දිගින් එකොළොස්වියතක්දපුළුලින්අටවියතක්ද දිගි න්හෝ තෙළෙස්වියතක්දපුළුලින්සවියතක්දකරන්නේනම්නොවටී

එකතො භාගෙන අතික්කන්තම්පිහි පමාණාතික්කන්තමෙව හොති
තිට්ඨතු ඡවිදත්ථි, කෙසග්ගමත්තම්පි දීඝතො හාපෙත්වා තිරියං, තිරි
යතො වා හාපෙත්වා දීඝං වඩ්ඪෙතුං න වට්ටති, කොපනවාදෙ උභ
තො වඩ්ඪිතෙ, වුත්තං හෙතං ආයාමතො වා විත්ථාරතො වා අන්තම
සො කෙසග්ගමත්තම්පි අතික්කමිත්වා කරොති වා කාරාපෙති වා පයො
ගෙ දුක්කටං තති ආදී, යථාවුත්තප්පමාණා එවපන වට්ටති, යාපන දීඝ
තො සඞ්ඝහත්ථාපි හොති තිරියං තිහත්ථා වා ඌනකචතුහත්ථා වා යත්ථ ප
මාණයුත්තො මඤ්චො ඉතොචිතො ච න පරිවත්තති, අයං කුටීති සඞ්ඛං
න ගච්ඡති තස්මා අයම්පි වට්ටති, මහාපච්චරියම්පන පච්ඡිමකොටියා
චතුහත්ථා විත්ථාරා වුත්තා, තතො හෙට්ඨා අකුටීති වුත්තං, අම්හාකම්ප
න ඛමති, යාසාහි කුටි ඤත්තිපවාරිතට්ඨානතො වා අරඤ්ඤතො වා
යං කිඤ්චි දබ්බසම්භාරං ආහරිත්වා අත්තනො අත්ථාය කාරයමානෙ
න භික්ඛුනා පමාණිකා කාරෙතබ්බා උපචිනාපෙතබ්බා, තත්‍රකිත්ත
කං පමාණං, දීඝතො වඩ්ඪකිහත්ථෙන විකලාධික එකඞ්ගුලුත්තර අඩ්ඪ
හත්ථප්පමාණා හොති, තිරියතො පන වාතුකලුත්තරතිකලාධිකචතුර
ඞ්ගුලුත්තර විදත්ථාධික චතුහත්ථප්පමාණා හොති ඉතො ඌනා වට්ටති.
සචෙ ඉතො ආයාමතො වා විත්ථාරතො වා අන්තමසො කෙසග්ගම
ත්තෙනාපි අතිරෙකා භවති, සාපි පමාණාතික්කන්තා යෙව හොතීති,
එවම්ධ විනයඤ්ඤූහි ඉමස්මිං ලක්ඛණෙයෙව ඨාතබ්බං.

## කුටිකාර කථා.

එක්අතකින් ප්‍රමාණ ඉක්මවන ලද්දේද ප්‍රමාණාතික්‍රාන්තමවෙයි, ස
වියතක්තබා දිගින් පිරිහෙලා පුළුල හෝ පුළුලින් පිරිහෙලා දිගහෝ
කෙසඟක් පමණකුදු වැඩිකරන්ට නොවටී, දෙපැත්ත වැඩිකිරීමෙ
හිදී කියනුම කවරේද ! අයමින්හෝ විතරින්හෝ යටත්පිරිසයෙන්
කෙසඟක් පමණකුදු ඉක්මවාකෙරේද කරවාද (ඕහට) ප්‍රයොගයෙ
හි ප්‍රයොගයෙහි දුකුළා ඇවැත්වෙයි යනාදීවූ මේ කාරණයවදාරණ
ලදී. යටකියනලද ප්‍රමාණ ඇතිවම (කරන්ට කරවන්ට) වටී, යම්
කුටියක් වනාහි දිගින් සැටරියනකුදුවේද පුළුලින් තුන්රියනක්හෝ
සතරරියනකට අඩුහෝ වේද, යම්ගෘහයක ප්‍රමාණයෙන්යුත් ඇඳක්
ඔබ්බෙනොබ නොහැර වන්නේද මේක කුටිසංඛ්‍යාවට නොයයි. එ
සේහෙයින් මේකදවටී, මහාපච්චරියනම් අටුවාවේ පශ්චිමකොටියෙ
න් සතරරියනක් පුළුල්වූගෙයක් කුටියයිකියන ලද්දේද. ඊටකුඩා
ගෙයක් කුටියනොවෙයි කියනලදී. අපේ කැමැත්තද, යම් ඒකුටි
යක් ඤත්තිපවාරිත තැනකින්හෝ ආරණ්‍යයකින්හෝ ද්‍රව්‍යදඬු එළවා
තමාපිණිස කරවන භික්‍ෂුවක් විසින් ප්‍රමාණයෙන් යුක්තව කරවිය
යුත්තීය. බැන්දවිය යුතුය, එහි ප්‍රමාණය කොතෙක්ද ? දිග
වඩුරියනෙන් අටරියන් එක්අඟුල් දෙකලාවක් පමණවෙයි, පුළුලව
නාහි සතරරියන් එක්වියත් සතරඅඟුල් තුන්කලා දෙඅනුකලාවක්
පමණ වේයයි කියාය, මෙයින් අඩුවද වටී.

ඉදින් මේ දිගටවඩාහෝ පුළුලට වඩාහෝ යටත් පිරිසයෙන් කෙ
සඟක් පමණකුදු වැඩිවේද ඒත් ප්‍රමාණාතික්‍රාන්තවූයේමවෙයි, මේශා
සනයෙහි විනය දන්නවුන් විසින් මේ ලක්‍ෂණයෙහිම මෙයාකාර
යෙන් සිටියයුතුයි. **කුටිකාර ශික්‍ෂාපදය පිළිබඳ කථාවයි.**

නිසීදන සන්ථත සිකඛාපදං තෙනභගවතා ජානතා පසසතා අරහතා සමමාසමබුඬෙන එවං පඤඤතතං.

“නිසීදන සන්ථතංපන භිකඛුනා කාරයමානෙන පුරානසන්ථතසස සාමනතා සුගතවිදත්ථි ආදාතබබා දුබබණණකරණාය, අනාදා චෙභිකඛු පුරාණ සන්ථතසස සාමනතා සුගතවිදත්ථිං නවං නිසීදන සන්ථතං කාරාපෙය්‍ය නිසසග්ගියං පාචිතතියනති.”

සන්ථතංනාම සන්ථරිත්වා කතංහොති අවායිමං, පුරාණ සන්ථතංනාමසකිං නිවත්ථම්පි සකිං පාරුතම්පි, සමනතාති එකපසසතො වට්ටංවා චතුරසසංවා ඡින්දිත්වා ගහිතඨානංයථා විදත්ථිමත්තංහොති එවංගහෙ තබබනතිවුත්තං, විදත්ථිමත්තනති ඉදානි වඩඪකඞගුලෙන ඊහානු කලාහි සහ සොළසඞගුලානි ගහෙතබබානි.

## නිසීදනසන්ථත කථා.

මඤචසිකඛාපදං තෙනභගවතා ජානතා පසසතා අරහතා සමමා සමබුඬෙන එවංපඤඤතතං, “නවංපන භිකඛුනා මඤචංවා පීඨංවා කාරය මානෙන අඨඞගුල්පාදකං කාරෙතබබං සුගතඞගුලෙන අඤඤත්‍ර හෙඨිමාය අටනියා, තංඅතිකකාමයතො ඡෙදනකං පාචිතතියනති” අඨඞගුල පාදකනති චෙතථ යංමඤචංවා පීඨංවා නාවමු ඛෙබඪං න පමාණා තිකකනතං තිකලාධික දසඞගුල පාදකං හොති තංපමාණ යුතතා නති වෙදිතබබං.

---

නිසිදන සන්ථත ශික්ෂාපදය අඟීත්වූ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ ඒ සර්වඥයන්වහන්සේ විසින් මෙසේ පණවනලද්දේය.

“හිඳිනා ඇතිරියක් කරවන භික්ෂූව විසින් පරණ ඇතිරියගෙ එක්පසෙකින් දුර්වර්ණකිරිම පිණිස සුගත් වියතක් පමණතැන් කපාගත යුතුය, ඉදින් භික්ෂුව පරණ ඇතිරියගෙ එක්පසෙකින් සුගත්වියතක් පමණතැන් කපානොගෙණ අලුත් හිඳිනා ඇතිරියක් කරවන්නේනම් නිසගි පචිතිවෙයි.”

සන්ථතයනම් අතුරා කරණ ලද්දක්වෙයි, වියමණකින් කරණ ලද්දක් නොවෙයි, පරණ ඇතිරියනම් වරක්වත් හැන්දූවූද වරක්වත් පෙරෙව්වාවූද ඇතිරියවේ, හාත්පසයනු එක්පැත්තකින්හෝ වට්ටෙහෝ සතරැසහෝ කපාගත්තැන යම්සේ වියතක් පමණවේද එසේගතයුතුයයි කියනලදී. විදසති මාත්‍රයනු මෙකල වඩු අඟුලෙන් සොළොස් අඟුල් දෙඅනුකලාවක් පමණ ගතයුතු වෙති.

## නිසීදනසන්ථත ශික්ෂාපදය පිළිබඳ කථාවයි.

මඤචශික්ෂාපදය අඟිත්වූ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූන් සර්වඥයන්වහන්සේ විසින් මෙසේ පණවන ලද්දේය. “අලුත් ඇඳක්හෝ පුටුවක්හෝකරවන භික්ෂුහු විසින් වළයටසහැර සුගත් අඟුලෙන් අටඟුල්පා ඇතිව කරවියයුතුය. ඒ ඉක්ම වන්නාහට ඡේදනක පචිති ඇවැත්වේ” මෙහි අඨඞගුල පාදකයනු යම් ඇඳක්හෝ පුටුවක්හෝ ඉතා උස්නුවූයේ ප්‍රමාණාතික්‍රාන්ත නුවූයේ (වඩුඅඟුලෙන්) දසඅඟුල් තුන්කලාවක් පමණ කකුල්ඇත්තේවෙයි, ඒඇඳහෝපුටුවහෝ ප්‍රමාණ යුක්තයයි දතයුතුයි.

සචෙ මඤ්චං වා පීඨං වා පමාණාතික්කන්තං ලභිත්වා න ඡින්දිතුකාමො හොති භූමියං නිඛණිත්වා පමාණං උපරිදස්සෙති උත්තානං වා කත්වා පරිභුඤ්ජති උක්ඛිපිත්වා වා තුලාසඞ්ඝාටෙ ඨපෙත්වා අට්ටං කත්වා පරිභුඤ්ජති සබ්බමෙව වට්ටති, සචෙ යො කොචි එවං මඤ්ඤෙය්‍ය, ඉදං පමාණං ආධුනිකෙහි පඤ්ඤත්තං පොරාණට්ඨකථා ටීකා නයෙහි න සමෙති, මඤ්චපාදෙපි අතිරස්සෙ න සක්කා හෙට්ඨා පත්තං පක්ඛිපිත්වා පටිසාමෙතුන්ති.

වුත්තම්පිහෙතං භගවතා, "පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨා මඤ්චං වා හෙට්ඨා පීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො, න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බොති" අම්හෙහිපි තං නිස්සාය හෙට්ඨා මඤ්චෙ තත්තක පාදකෙ පත්තං පක්ඛිපාපෙත්වා වීමංසිත්වා වුත්තං, එවං මහතා උස්සාහෙන කතං විනයඤ්ඤූහි සප්පුරිසෙහි ඉමං ලක්ඛණං ඤත්වා විචාරෙතබ්බං.

මඤ්චපමාණ කථා.

අපරම්පි සුගතස්ස අඞ්ගුලප්පමාණලක්ඛණං ඛන්ධකෙයෙව ආගතං, "තෙන ඛො පන සමයෙන භික්ඛූනං පරිපුණ්ණං හොති තිචීවරං, අත්ථො ච හොති පරිස්සාවනෙහිපි ථවිකාහිපි, භගවතො එතමත්ථං ආරොචෙසුං, අනුජානාමි භික්ඛවෙ පරික්ඛාර චොළන්ති,,

---

ඉදින් ප්‍රමාණ ඉක්මියාවූ ඇඳක්හෝ පුටුවක්හෝ ලැබ කපන්ට නොකැමතිවේනම් බිමහාරා ප්‍රමාණය මතුකොටදක්වාද උඩුකුරු කොටහෝ පරිභොගකෙරේද ඔසවාහෝ තලාදෙක්හී තබා අටල්ලක්කොට පරිභොගකෙරේද සියල්ලමවටී, මේප්‍රමාණය ආධුනිකයන් විසින් පණවන ලද්දේය, පුරාණ අටුවා ටීකාක්‍රමහා සමනොවේය, ඇඳකකුල් ඉතාකොටය, යට පාත්‍රයක් තබා තැම්පත්කරන්ට නොහැකියයි ඉදින් යම්කිසිවෙක් මෙසේ සිතන්නේනම්.

බුදුන් විසින් මෙසේ වදාරණ ලද්දේය. "පාත්‍රය තබන්නහු විසින් එක්අතකින් පාත්‍රය ගෙණ එක්අතකින් ඇඳයටහෝ පුටුවයටහෝ පිසදමා පාත්‍රය තැබිය යුතුය, නොඅතුරණලද භූමියෙහි පාත්‍රය නොතැබිය යුතුයයි" ඒ නිසා අපවිසිනුත් එපමණ කකුල්ඇති ඇඳයටක පාත්‍රයක් තබවා විමසා කියනලද්දේය. මෙසේ මහත් උත්සාහයකින් කරණලද මේලක්‍ෂණය විනය දන්නාසත්පුරුෂයන් විසින් දැන සෙවියයුතුයි. **ඇඳේ ප්‍රමාණපිළිබඳ කථාවයි.**

අනිකකුදු බුදුන්ගෙ අටඟුල් ප්‍රමාණවූ ලක්‍ෂණයක් ඛන්ධකයෙහිම ආයේය. "එසමයෙහි වනාහි භික්‍ෂූන්ට තුන්සිවුරු සම්පූර්ණවිය, පෙරහණකින්ද ථවිකයකින්ද ප්‍රයොජන ඇත්තේදවේ, බුදුන්ට ඒ කාරණයසැලකළාහුය, මහණෙනි තොපට පරිෂ්කාර චොල අනුදනිම්,,

අථඛො භික්ඛූනං එතදහොසි, යානිතානි භගවතා අනුඤ්ඤාතා
නි ති චීවරන්තිවා වස්සික සාටිකාතිවා නිසීදනන්තිවා පච්චත්ථරණ
න්තිවා කණ්ඩුපටිච්ඡාදීතිවා මුඛපුඤ්ඡන චොළන්තිවා පරික්ඛාර
චොළන්තිවා සබ්බානිතානි අධිට්ඨාතබ්බානී නුඛො උදාහු විකප්පෙ
තබ්බානීති. භගවතො එතමත්ථං ආරොචෙසුං, "අනුපානාමි භික්ඛ
වෙ තිචීවරං අධිට්ඨාතුං වසසික සාටිකං වසසානං චාතුමාසං අධිට්ඨා
තුං තතොපරං විකප්පෙතුං, නිසිදනං අධිට්ඨාතුං නවිකප්පෙතුං,
පච්චත්ථරණං අධිට්ඨාතුං නවිකප්පෙතුං, කණ්ඩුපටිච්ඡාදිං යාවආබා
ධා අධිට්ඨාතුං තතොපරං විකප්පෙතුං, මුඛපුඤ්ඡනචොළං අධිට්ඨාතුං
නවිකප්පෙතුං පරික්ඛාරචොළං අධිට්ඨාතුං නවිකප්පෙතුන්ති."

අථඛො භික්ඛූනං එතදහොසි, කිත්තකං පච්ඡිමං නුඛොචීවරං
විකප්පෙතබ්බන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං, "අනුජානා
මි භික්ඛවෙ ආයාමෙන අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන චතුරඞ්ගුලවිත්ථ
තං පච්ඡිමං චීවරං විකප්පෙතුන්ති." පච්ඡිමං චීවරන්ති එත්ථ යං ආයා
මතො වඩ්ඪකඞ්ගුලෙන තිකලාධික දසඞ්ගුලං හොති, විත්ථාරතො
පන චාතුකලාධිකාය එකකලාය සහ පඤ්චඞ්ගුලං පච්ඡිමං නාම ත
ඤ්චබොලාමක පරිච්ඡෙදවසෙන අධිට්ඨානුපගඤ්චෙව විකප්පනූප
ගඤ්ච හොති, එත්තකප්පමාණෙන හි සක්කා තං තං කරණීයෙ
පයොජෙතුං, වුත්තං හෙතං අට්ඨකථා චරියෙහි.

---

ඉක්බිති භික්ෂූන්ට මෙසේ සිතක්විය, බුදුන් විසින් තුන්සිවුරයයි
කියාහෝ වැසි සළුවයයි කියාහෝ නිසීදනයයි කියාහෝ පසතුරණ
යයි කියාහෝ කණ්ඩුපටිච්ඡාදනයයි කියාහෝ මුඛපුඤ්ඡන චොළය
යි කියාහෝ පරිෂ්කාර චොලයයි කියාහෝ යම් ඒ සිවුරුකෙනෙක්
අනුදන්නාලද්දාහුද, ඒ සියල්ල අධිෂ්ඨාන කටයුත්තාහුද නොහො
ත් විකප්පනය කටයුත්තාහුදැයි.බුදුන්ට මේකාරණය සැළකළාහුය,
"මහණෙනි තුන්සිවුර අධිෂ්ඨාන කරන්ටද වැසිසළුව වැසිසාරමස අ
ධිෂ්ඨානකරන්ටද ඉන්මත්තෙහි විකපුන් කරන්ටද නිසීදනය අධි
ෂ්ඨානකරන්ටද විකපුන් නොකරන්ටද පච්චත්ථරණය අධිෂ්ඨානක
රන්ටද විකපුන් නොකරන්ටද කණ්ඩුපටිච්ඡාදනය ආබාධය ඇති
තාක් අධිෂ්ඨාන කරන්ටද ඉන්මත්තෙහි විකපුන්කරන්ටද මුඛපු
ඤ්ඡනය අධිෂ්ඨානකරන්ටද විකපුන් නොකරන්ටද පරිෂ්කාර චො
ලය අධිෂ්ඨාන කරන්ටද විකපුන් නොකරන්ටද අනුදනිමි."

ඉක්බිති භික්ෂූන්ට මෙසේ සිතක්වූයේය, කෙතෙක් ප්‍රමාණඇති
අන්තිම සිවුරක් විකපුන් කරන්ට යුතුදැයි, බුදුන්ට මේකාරණය සැ
ළකළාහුය, "මහණෙනි සුගත් අඟුලෙන් දිග අටඟුල්වූද පුළුල සත
රඟුල්වූද පශ්චිම චීවරය විකපුන්කරන්ට අනුදනිමි." මෙහි පශ්චිම
චීවරය යනු යම්සිවුරක් වඩුඅඟුලෙන් දිගින් දසඅඟුල් තුන්කලාව
ක්වේද, පුළුලින් පස්අඟුල් එක්කලා දෙඅනුකලාවක් වේද, ඒ පශ්
චිම චීවරය නම්වේ. ඒ වනාහි යටත්පිරිසයෙන් අධිෂ්ඨානයට පැමි
ණියේද විකප්පනයට පැමිණියේදවෙයි, මෙතෙක් ප්‍රමාණයෙන්
ඒඒ කටයුත්තෙහි යොදන්ට හැක්කේය, මේකාරණය අටුවාචාරීන්
විසින් කියන ලද්දේය.

සමමතෙන අපපමතතක විසජජනෙන භිකඛුනා චීවරකමම කරොනතසස සූචිං දෙහීති වදතො එතාදිසා එකාරසසාති චෙසූචියො දාතබබා, පිප්ඵලිකත්ථිකසස එකො පිප්ඵලිකො දාතබෙබා, කනතාරං පටිපජජිතු කාමසස උපාහනයුගලං දාතබබං, කායබනධනත්ථිකසස කායබනධනං දාතබබං, අංසබනධකොමෙ ජිණෙණාති ආගතසස අංසබනධකො දාතබෙබා, පරිසසාවනත්ථිකසස පරිසසාවනං දාතබබං, ධමමකරකත්ථිකසස ධමමකරකො දාතබෙබා, ස්වෙපටට කොනහොති ධමමකරකො පටෙටනසදධිං දාතබෙබා, ආගනතුකපටටං ආරොපෙසසාමීති යාචනතසස කුසියාච අඩඪකුසියාච පහොනකං දාතබබං, මණඩලං නපපහොතීති ආගතසස මණඩලං එකං දාතබබං, අඩඪමණඩලානි චෙ දාතබබානි, චෙමණඩලානි යාචනතසස චෙනදාතබබානි, අනුවාත පරිභණඩත්ථිකසස එකසස චීවරසස පහොනකං දාතබබනති, අනුවාත පරිභණඩං නාමදුවිධා විභජිතබබං හොති, උතතරාසඞගසස අනුවාත පරිභණඩඤච අනතර වාසකසස අනුවාත පරිභණඩඤචාති, එවමපි එතතකපපමාණං චීවරං සකකාසෙවතුං තං කිචෙච උපනෙතුං, අපිචඛො චකඛුසමිං රොගෙ උපපනෙන එතතකං සකකා චකඛුමලං නීහරිතුනති.

**පචඡිම චීවර කථා.**

---

සමමතලත් ස්වල්පමාත්‍ර වස්තුවක්දෙන භික්ෂුව විසින් සිවුරු කර්මාන්තකරන්නාවූ ඉදිකටුවක් දෙවයි කියන්නක්හට දික් ඉදිකටු එකක්ද කොටඉදිකටු එකක්දැයි ඉදිකටු දෙකක් දියයුත්තාහ, කතුරකින් ප්‍රයොජන ඇත්තක්හට එක්කතුරක් දියයුත්තේය, කාන්තාර යකට යනුකැමැත්තක්හට වහන්සගලක් දියයුතුයි, කායබන්ධනයකින් ප්‍රයොජන ඇත්තක්හට කායබන්ධනයක් දියයුතුයි, මගෙඅංසබන්ධනය හෙවත් දැඩියකඩ දිරුණේයයි ආවෙක්හට අංසබන්ධනයක් දියයුතුයි, පෙරහණකින් ප්‍රයොජන ඇත්තක්හට පෙරහණක් දියයුතුයි, ධම්මකරකයකින් ප්‍රයොජන ඇත්තක්හට ධම්මකරකයක් දියයුතුයි, ඉදින් පටියක් නැත්තේද පටියක් සමග ධම්මකරකයක්දියයුතුයි, ආගන්තුක පටක් හෙවත් නැවත පටක් නගන්නෙමියි ඉල්ලන්නක්හට දික්නුවාවක්හෝ දික්නුවා බාගයකට හෝ පොහෝනා තරම් දියයුතුය, මැඩිල්ලක් නොපොහෝනේයයි ආවෙක්හට එක්මැඩිල්ලක් දියයුතුයි, අඩමඩුලු දෙකක්දියයුත්තාහ, මඩුලුදෙකක් ඉල්ලන්නක්හට මඩුලුදෙකක් නොදිය යුත්තාහ, නුවාපිරි බඩුවකින් ප්‍රයොජන ඇත්තක්හට එක්සිවුරකට පොහෝනාතරම් දියයුතුයි, නුවාපිරිබඩුනම් තනිපටසිවුරේ නුවාපිරිබඩුද අඳනා සිවුරේ නුවාපිරිබඩුදැයි දෙවිදියකින් බෙදියයුතුවෙයි, මෙසේත් මෙතෙක් ප්‍රමාණ සිවුරක් ඒඒ කටයුතෙහි එළවන්ට හැක්කේමැයි, එසේදවූවත් ඇස්රෝගයක් උපන්කල්හී කබ හැරදමන්ට මෙතෙක් සිවුරක් හැකිවන්නේය.

**පශ්චිම චීවරය පිළිබඳ කථාවයි.**

ඉදං නිසීදන සික්ඛාපදං තෙනභගවතා ඡබ්බග්ගියෙභික්ඛූ අප්ප
මාණිකානි නිසීදනානි මඤ්චස්සපි පීඨස්සපි පුරතොපි පච්ඡතොපි
ඔලම්බෙන්තානි * ධාරෙන්තෙ ආරබ්භ එවංපඤ්ඤත්තං, “නිසීදනං
පන භික්ඛුනා කාරයමානෙන පමාණිකං කාරෙතබ්බං, තත්‍රිදං පමා
ණං, දීඝසො වෙවිදත්ථියො සුගතවිදත්ථියා තිරියංදියඩ්ඪං, තංඅති
ක්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති.” එවඤ්හිදං පඤ්ඤත්තං
හොති,“තෙනඛොපන සමයෙන ආයස්මා උදායී මහාකායො හොති
සොභගවතො පුරතො නිසීදනං පඤ්ඤපෙත්වා සමන්තතො සමඤ්
ඡමානො නිසීදි, අථඛො භගවා ආයස්මන්තං උදායිං එතදවොච, කි
ස්සත්වං උදායි නිසීදනං පඤ්ඤපෙත්වා සමන්තතො සමඤ්ඡසි සෙ
ය්‍යථාපි පුරාණාසිකොට්ඨොති, තථාහිපනභගෙනත භගවතා භික්ඛූ
නං අතිඛුද්දකං නිසීදනං පඤ්ඤත්තන්ති, අථඛොභගවා භික්ඛූආමන්
තෙසි, අනුජානාමි භික්ඛවෙ නිසීදනස්ස දසාවිදත්ථිං එවඤ්චපන භි
ක්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ, නිසීදනංපන භික්ඛුනා—ල-
තිරියං දියඩ්ඪං දසාවිදත්ථිතං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තිය
න්ති.” චීවරක්ඛන්ධකෙපන පණීත භොජන වත්ථුස්මිං පඤ්ඤත්තං
වුත්තං හිතත්ථභගවතා, “අනුජානාමි භික්ඛවෙ කායගුත්තියා චීවරගු
ත්තියා සෙනාසන ගුත්තියා නිසීදනන්ති,” අඩ්ඪකථායංපන එවං සංව
ණ්ණිතං.

---

මේ නිසීදන ශික්ෂාපදය ඒ භාග්‍යවත්හු විසින් ෂඩ්වර්ගිකභික්ෂූන් ප්‍රමා
ණ ඉක්මවා කරණලද නිසීදනයන් ඇඳේද පුටුවේද ඉදිරියෙන්ද ප
ස්සෙන්ද එල්ලමින් දරන්නවුන් අරබයා මෙසේ පණවන ලද්දේය,
“නිසීදනයක් කරවනභික්ෂුව විසින් ප්‍රමාණ යුක්තව කරවිය යුත්තේ
ය,එහිමේප්‍රමාණයයි,දිගින් සුගත්වියතින් දෙවියතයි, සරස යෙලවිය
තයිඑ්ඉක්මවා කරන්නාහට ඡේදනකපචිති ඇවැත්වෙයි,“ මේ ශික්ෂා
පදය මේයේ පණවන ලද්දේවෙයි,” එසමයෙහි වනාහි ආයුෂ්මත්වූ
උදායි ස්ථවිරතෙමමහත්වූශරීරයක් ඇත්තෙක්වේ, ඒස්ථවිරතෙම බු
දුන් ඉදිරියේ නිසිදනය පණවා හාත්පසින් අදිමින් වැඩහුන්නේය,ඉ
ක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙසේ
වදාළේය,උදායිය! තෝකවරහෙයකින් නිසීදනය පණවාගෙණ පුරා
ණ ඩම්කරයාමෙන් හාත්පසින් අදින්නෙහිද, ස්වාමීනි එසේමැයි, භා
ග්‍යවත්හු විසින් භික්ෂූන්ට ඉතාකුඩා නිසීදනයක් පණවන ලද්දේය,
ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කොළේය,
මහණෙනි! නිසීදනයේ දවල්ල වියතක්කොට අනුදනිමි, මහණෙ
නි! මේ ශික්ෂාපදය තොපි මෙසේ උදෙසව්, නිසීදනයක් කරවන භි
ක්ෂුව විසින්—ල—සරස එක්වියත් සමාරක්ද දවල්ල වියතක්ද ඒ ඉ
ක්මවාකරන්නක්හට ඡේදනක පචිතිඇවැත්වේ, “චීවරක්ඛන්ධකයෙ
හි ප්‍රණීතභොජන වස්තුවෙහිදී පණවනලදී. එහිදී භාග්‍යවතුන්ව
හන්සේ විසින් “මහණෙනි! ශරීර ගොපනය පිණිසද චීවරගොප
නය පිණිසද සෙනාසන ගොපනය පිණිසද නිසීදනයක් අනුදනි
මියි” වදාරණ ලද්දේය අටුවාවේ වනාහි මෙසේ වර්ණනා කරණලදී.

---

* ධාරනෙත සියම් පොතේ.

පුරාණසිකොණ්ඩොති පුරාණධම්මකරො සත්ථාහිනාම පුරාණ ධම්මකරො ධම්මං විත්ථතං කරිස්සාමීති ඉතොචිතොච සමඤ්ජති නික්කඩ්ඪන්ති එවං සොපි තංනිසීදනං.

නිසීදනං නාම සදසං වුච්චතීති සන්ථතසදිසං සන්ථරිත්වා එකස්මිංඅන්තෙ සුගතවිදත්ථියා විදත්ථිමත්තෙ පදෙසෙ ද්වීසුඨානෙසු ඵාලෙත්වා තිස්සො දසාකරීයන්ති තාහිදසාහි සදසංනාමහොතීති, ඉදම්පි නිසීදනසික්ඛාපදං ඉමස්මිං සුසමාරද්ධෙ සුගතවිදත්ථි විධානෙ සාධකම්පි හොති අතිදළ්හ තරංයෙව.

යදිහිභගවා උබ්බෙධෙන වාදස හත්ථො හුත්වා පකතිමනුස්ස තිධා අතික්කමිත්වා තිඨෙය්‍ය තස්ස පන විදත්ථිපාත්ථා තිගුණීකතා භවෙය්‍යුං, අථපන සොභගවා ඡබ්බග්ගියානං භික්ඛූනං ඔලම්බනකා නි නිසීදනානි ධාරෙන්තානං සික්ඛාපදං න පඤ්ඤපෙය්‍ය' උදායිස්සච සදසං නිසීදනං නානුජානෙය්‍ය සුගතවිදත්ථියා දීඝභාවෙන පඤ්ඤ ත්තත්තා' තදාහි සො ආයස්මා උදායි භගවතො පුරතො අත්තනො නිසීදනං න සමඤ්ජිස්සති තඤ්චස්ස නිසීදනං තත්ථෙව පත්ථරිත්වා නිසීදිතුං පහොස්සති' තස්මා ඉධ සප්පුරිසෙහි පඤ්ඤ වන්තෙහි සන්නිට්ඨාන මෙව ගන්තබ්බං, සොභගවා පකතිමනුස්ස තිධා අති ක්කම්ම උබ්බෙධෙන වාදසහත්ථො නාහොසීති.

---

පුරාණසිකොඬ් යනු පුරාණධර්මකරයාය, යම්සේ වනාහි පුරාණ ධර්මකරනම්වූ තැනැත්තේ ධර්මය විස්තරකරන්නෙමියි ඔබිනොබින් සමඤ්ජනය කෙරේද අදිද උදායිස්ථවිරද ඒ නිසීදනයත් මෙසේය නිසීදනයනම් දෘවලු සහිතයයි කියනුලැබේ. ඇතිරිල්ලක්සමානව ආ ස්තරණයකොට එක්අන්ත යෙක්හි සුගත්වියතින් වියතක්පමණ ප්‍ර දෙශයෙහි දෙතැනක පලා දෘවලු තුනක් කරණුලැබෙත්, ඒ දෘවලු කරණකොටගෙණ සදසනම්වෙයි' මේ නිසීදන ශික්‍ෂාපදය මේ පටන් ගන්නාලද සුගත විදත්ථි විධානයෙහිදී ඉතාදැඩි තරම්මවූ සාධකයක් වෙයි.

ඉදින් වනාහී බුදුහු උසින් දොළොස් රියනක්ඇතිව ප්‍රකෘති මනු ෂ්‍යයන් තුන් පරිද්දකින් ඉක්මවා සිටින්නේනම් උන්වහන්සේගේ වියත් රියන් ත්‍රිගුණ කරණලද්දාහු වන්නාහ, ඉක්බිති ඒ භාග්‍යවත් තෙම එල්ලෙන නිසීදන දරන්නාවූ ෂට්වර්ගී භික්‍ෂූන්ට ශික්‍ෂාපද නො පණවන්නේය, සුගත්වියත දීර්ඝභාවයෙන් පණවනලද හෙයින් උදායිස්ථවිරයන්ට දෘවලූසහිත නිසීදනය අනුනොදන්නේය, එකල ඒ ආයුෂ්මත් උදායිස්ථවිරතෙම බුදුන් ඉදිරියේ තමන්ගෙ නිසීදනය නොඅදින්නේය, උන්වහන්සේගෙ ඒ නිසීදනය එහිම ආස්තරණය කොට හිඳින්ට පොහොනේ වන්නේය, එසේහෙයින් මෙහිදී සත්පුරු ෂවූ නුවණැත්තන්විසින් ඒ භාග්‍යවත්තෙම ප්‍රකෘති මනුෂ්‍යයන් තුන් පරිද්දකින් ඉක්මවා උසින් දොළොස් රියනක්නුවූයේයයි තීන්දුවටම යුතුයි.

සෙඛියයථා වුත්ත පකාරෙණ නිස්සංසයෙන ඉමං විධිං ජානන්තෙනහි ඉමස්මිං සික්ඛාපදෙ පමාණං ජානිතබ්බං, නිසීදනං නාම සදසන්ති පවුච්චති.

නිසීදනස්සහි පමාණං දීඝතො වඩ්ඪකඞ්ගුලෙන එකකලාධික බත්තිංසඅඞ්ගුලං හොති, විත්ථාරතො තිභානුකලාහිසහහත්ථප්පමාණං හොති, දසාපන වීභාතකලාහි සහ සොළසඞ්ගුලා හොති, එවං නිසීදනස්ස පමාණං වෙදිතබ්බං.

## නිසීදන පමාණ කථා.

කණ්ඩුපටිච්ඡාදී සික්ඛාපදං පන තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එවං පඤ්ඤත්තං, “කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං, දීඝතො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං වෙවිදත්ථියො, තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති,” කණ්ඩුපටිච්ඡාදි නාම යස්ස අධො නාභි උබ්භ පානුමණ්ඩලං කණ්ඩුවා පිළකාවා අස්සාවො වා ථුල්ලකච්ඡුවා ආබාධො තස්ස පටිච්ඡාදනත්ථාය ඉමස්මිං සික්ඛාපදෙ පමාණං වෙදිතබ්බං, කණ්ඩුපටිච්ඡාදිනාම දීඝතො වඩ්ඪකීහත්ථෙන විකලාධික චතුරඞ්ගුලුත්තරවිදත්ථ්‍යාධික විහත්ථප්පමාණා හොති.

---

යටකියනලද ආකාරයෙන් නිඃශඞ්කාවෙන් මේවිදිය දන්නාවූයමෙකුන් විසින් මේ ශික්ෂාපදයෙහි ප්‍රමාණ දතයුතුයි, නිසීදනයනම් දෘවලූ සහිතයිසී කියනුලැබේ.

නිසීදනයේ ප්‍රමාණය දිගින් වඩුඅඟුලෙන් දෙතිස්අඟුල් එක්කලා වෙකි, පුලුලින් එක්රියන් තුන්අනුකලා වක්වෙයි, දෘවල්ල වනාහි සොළොසඅඟුල් දෙඅනුකලාවක්වෙයි, නිසීදනයෙහි ප්‍රමාණ මෙසේ දතයුතුයි.

## නිසීදන ප්‍රමාණය පිළිබඳ කථාවයි.

කණ්ඩුපටිච්ඡාදි ශික්ෂාපදය වනාහි චතුරාර්‍ය්‍යසත්‍ය දන්නාවූ චතුරාර්‍ය්‍යසත්‍ය දක්නාවූ රහත්වූ සම්මාසම්බුදුවූ ඒ භාග්‍යවත්හුවිසින් මෙසේ පණවනලද්දේය, “කාස්පිළිසන් සිවුර කරවන භික්ෂුහු විසින් ප්‍රමාණයෙන්යුක්තව කරවියයුත්තීය, එහි මේ ප්‍රමාණයි, සුගත්වියතින් දිගින් සතරවියතෙක සරස්හී දෙවියතෙක එකීප්‍රමාණය ඉක්මවන්නක්හට ඡෙදනක පචිති ඇවැත්වෙයි,” කාස්පිළිසන් සිවුරනම් යමෙකුගේ නැඹින්යට දනමඩුල්ලෙන් උඩ කැසීමක්හෝ පිළිකාවක්හෝ සොදිය ගැලීමක්හෝ ඝනවූ දදයක්හෝ යන (මෙකී) ආබාධයක් වේද, ඒ වැස්ම පිණිසයි, මේ ශික්ෂාපදයෙහි ප්‍රමාණ දතයුතු, කාස්පිළිසන් සිවුරනම් වඩුරියනින් දිගින්දෙරියන් එක්වියත් සතරඟුල් දෙකලාවක් පමණවේ.

විත්ථාරතොපන එකකලාධික අඞ්ගුලුත්තර හත්ථප්පමාණාහොති එවං කණ්ඩුපටිච්ඡාදි පමාණ වෙදිතබ්බං.

## කණ්ඩු පටිච්ඡාදි කථා.

අපරම්පි භික්ඛුනී විභඞ්ගෙ ආගතං, තත්‍රිදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඤ්ඤත්තං, “උදකසාටිකම්පන භික්ඛුනියා කාරයමානාය පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං, දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ද්වෙවිදත්ථියො, තංඅතික්කාමෙන්තියා ඡෙදනකං පාචිත්තියන්ති,” ඉමස්මිං සික්ඛාපදෙ ආගතපමාණං කණ්ඩු පටිච්ඡාදි සික්ඛාපදෙ වුත්තනයෙන වෙදිතබ්බන්ති.

## උදක සාටික කථා.

වස්සික සාටික සික්ඛාපදං බො තෙන භගවතා ජානතා පස්සතා, අරහතා සම්මාසම්බුද්ධෙන එවං පඤ්ඤත්තං, වස්සිකසාටිකංපන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං දීඝසො ඡවිදත්ථියො සුගතවිදත්ථියා, තිරියං අඩ්ඪතෙය්‍යා, තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති,” වස්සිකසාටිකානාම වස්සානස්ස චාතුමාසත්ථාය, ඉමස්මිංසික්ඛාපදෙ පමාණං ජානිතබ්බං.

---

පුලුලින් එක්රියන් අටඟුල්එක්කලාවක්පමණවෙයි, මෙසේ කණ්ඩු පටිච්ඡාදන සිවුරෙහි ප්‍රමාණ දතයුතුයි.

## කස්පිළිසන් සිවුරපිළිබඳ කථාවයි.

අනිකකුදු භික්ෂුණී විභඞ්ගයෙහි ආයේය, අභීත්වූ සියල්ලදන්නාවූ සියල්ලදක්නාවූ ඒ සර්වඥයන්වහන්සේ විසින් භික්ෂුණී විභඞ්ගයේ දී මේ ශික්ෂාපදය පණවනලද්දේය, ජලසාටිකාවක්කරවන භික්ෂුණියවිසින් ප්‍රමාණයෙන්යුක්තව කරවියයුත්තීය, එහි මේ ප්‍රමාණයි සුගත්වියතින් දිගින් සතරවියතෙක, සරස දෙවියතෙක, එකී ප්‍රමාණය ඉක්මවන්නියක්හට ඡෙදනක පචිතිඇවැත්වෙයි,” මේ ශික්ෂාපදයෙහි ආ ප්‍රමාණ කස්පිළිසන් සිකපදෙහි කීනයින් දතයුතුයි.

## උදකසාටිකා පිළිබඳ කථාවයි.

වස්සික සාටික ශික්ෂාපදය අභීත්වූ සියලලදන්නාවූ සියලලදක්නාවූ ඒ සර්වඥයන්වහන්සේ විසින් මෙසේ පණවනලද්දේය, “වැසි සලුසිවුරුකරවන භික්ෂුහුවිසින් ප්‍රමාණයුක්තව කරවියයුත්තීය, එහි මේප්‍රමාණයි, සුගත්වියතින් දිගින් සවියතෙක සරස දෙවියත් සමාරෙක එකීප්‍රමාණය ඉක්මවන්නක්හට ඡෙදනක පචිති ඇවැත් වෙයි,” වැසිසළු සිවුරනම් වස්සාරමාසය පිණිසයි, මේ ශික්ෂාපදයෙහි ප්‍රමාණදතයුතුයි,

වස්සික සාටිකානාම දීඝතො වඩ්ඪකීහත්ථෙන තීහිකලාහි සහ චතුහත්ථප්පමාණාහොති, තිරියතො එකානුක ලූනතාරෙක කලාධික චතුරඞ්ගුලූනතර විදත්ථ්‍යාධික හත්ථප්පමාණාහොති.

එවං වස්සිකස්සාටිකා පමාණං වෙදිතබ්බං.

**වස්සික සාටික කථා.**

සුගත චීවර සික්ඛාපදං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන එවං පඤ්ඤත්තං, “යොපනභික්ඛු සුගතචීවරප්පමාණං චිවරං කාරාපෙය්‍ය අතිරෙකංවා ඡෙද කං පාචිත්තියං, තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං, දීඝසො නවවිදත්ථියො, සුගතවිදත්ථියා, තිරියං ඡ විදත්ථියො, ඉදං සුගතස්සසුගතචීවරප්පමාණනති,” ඉමස්මිං සික්ඛාපදෙ සුගතචීවරප්පමාණනතිවා අතිරෙකනතිවා කථං ජානිතබ්බං, යං චීවරං වුත්තනයෙනෙව වඩ්ඪකීහත්ථෙන දීඝතො වානු කලාධික එකඞ්ගුලූනතර ඡ හත්ථප්පමාණංහොති, විත්ථාරතො තීහි කලාහි සහ චතුහත්ථප්පමාණංහොති, තං චිවරං සුගත චිවරප්පමාණං නාම හොති, යම්පනචීවරං දීඝතොවා විත්ථාරතොවා තතො අතිරෙක තරං අන්තමසො කෙසග්ගමත්තම්පි හොති, තං අතිරෙකං නාම හොති, යම්පි චීවරං උභයභාගෙන නොඌනකංහොති

---

වැසිසළු සිවුරනම් වඩුරියනෙන් දිගින් සතරරියන් තුන්කලාවක් පමණවෙයි, සරසින් එක්රියන් එක්වියත් සතරඟුල් එක්කලා එකානුකලාවක්පමණවෙයි.

මෙසේ වැසිසළු සිවුරෙහි ප්‍රමාණ දතයුතුයි.

**වැසිසළු සිවුර පිළිබඳ කථාවයි.**

සුගත චීවර ශික්ෂාපදය අභිත්වූ සියල්ලදන්නාවූ සියල්ලදක්නාවූ ඒ සර්වඥයන්වහන්සේ විසින් මෙසේ පණවනලද්දේය, යම් භික්ෂුවක් සුගත්සිවුරේ ප්‍රමාණයුක්තවහෝ අධිකවහෝ සිවුරක් කරවන්නේනම් ඡේදනක පචිතිඇවැත්වේ, එහි මේ සුගත්හුගෙ සුගත්සිවුරේ ප්‍රමාණයි, සුගත්වියතින් දිග නවවියතෙක සරස සවියතෙක මේ සුගත්හුගෙ සුගත් සිවුරේප්‍රමාණයි,” මේ ශික්ෂාපදයෙහිදී සුගත් සිවුරේ ප්‍රමාණයයි කියාහෝ අධිකයයිකියාහෝ කෙසේ දතයුතුද,? යම් සිවුරක් කියනලද ක්‍රමයෙන් වඩුරියනින් දිගින් හරියන් එක් අඟුල් දෙඅනුකලාවක් ප්‍රමාණවේද, පුළුලින් සතරරියන් තුන් කලාවක් ප්‍රමාණවේද, ඒ සිවුර සුගත්සිවුරේ ප්‍රමාණනම්වේ, යම් සිවුරක් දිගින්ද පුළුලින්ද යටත්පිරිසයෙන් කෙසඟක්පමණකුදු ඊට ඉතාවැඩිවේද ඒ අතිරේක චීවරයනම්වෙයි, යම්සිවුරක් දිගපුළුලින් අඩුවූයේවේද

තස්සෙව පරිභුඤ්ජිතුංවට්ටති, අයමෙත්ථ කුටිකාරසික්ඛාපදස්සඅත්ථ වණ්ණනායමෙව වෙදිතබ්බො, ඉමස්මිංසික්ඛාපදෙ නසංවණ්ණිතො යෙවාති.

## සුගත චීවර කථා.

විනයෙ නවධා වුත්තා පරික්ඛාරා පමාණිකා,
තත්ථමෙ නිච්ඡයො චෙසො දස්සිතො අත්ථසාරතො.
එවං හි සාරතො ඤත්වා විනයග්ගරුකෙනපි
එත්ථෙව අනුසික්ඛිත්වා සණ්ඨාතබ්බං අප්‍රණ්ණකෙ.

වුත්තං හෙ තං.

* "අපණ්ණකට්ඨානමෙකෙ දුතියංආහු තක්කිකා,
එතදඤ්ඤාය මෙධාවී † තංගණ්හෙය්‍ය අපණ්ණකන්ති,"

අයං ගාථා බහුන්නං කුලපුත්තානං පඤ්ඤවන්තානංසාත්ථකාහොති තස්සායමත්ථො එකෙ ආපණ්ණකිකා අවිරුද්ධගාහිනො මනුස්සා අප ණ්ණකට්ඨානං පඨමං ඨානමාහු, එකෙ තක්කිකා යථාතක්කගාහිනො තක්කං දුතියං ඨානමාහු, මෙධාවී පණ්ඩිතො විඤ්ඤූපුරිසො එතං අපණ්ණකං තක්කවසෙන දුවිධං ගාහං අඤ්ඤාය ආජානිත්වා

එමසිවුර පරිභොගකරන්ටවටී මේකාරණය කුටිකාරශික්ෂාපදය පිළි බඳ අර්ථවර්ණනාවෙන්ම දතයුත්තේය මේශික්ෂාපදයෙහිදිවර්ණනා නොකරණ ලද්දේවෙයි.

## සුගත් සිවුර පිළිබඳ කථාවයි.

විනයෙහි ප්‍රමාණයුක්තවූ පිරිකර නවපරිද්දකින් කියනලද්දූහ, එහිදීමාවිසින් මේනිශ්චය අර්ථවශයෙන්ද සාරවශයෙන්ද දක්වන ලද්දේය.

මෙසේවනාහි සාරවශයෙන්දැන විනයෙහි ගරුසිත ඇත්තන් විසි නුදු මේවිනිශ්චයෙහිම නැවත නැවතත් හික්මී අවිරුද්ධකාරණයෙක්හි පිහිටියයුතුයි. මේවනාහී වදාරණලදී.

"ඇතැම් පණ්ඩිතකෙනෙක් අවිරුද්ධ කාරණය පළමුයයි කියත්, තර්කග්‍රාහි ඇතැම්කෙනෙක් තර්කය දෙවෙනිකාරණයයි කියත්, නුව නැත්තේ මේකාරණාදෙකදැන අවිරුද්ධ කාරණයම පිළිගන්නේය,"

මේ ගාථාව නුවනැති බොහෝකුලපුත්‍රයන්ට සාර්ථකවෙයි, මෙම් ගාථාවේ අර්ථයි, සමහර ආපණ්ණිකවූ අවිරුද්ධග්‍රාහිවූ මනුෂ්‍යයෝ අවිරුද්ධකාරණය පළමුවනකාරණයයි කියති, සමහර තාර්කිකයෝ තර්කවූපරිදි ග්‍රහණයකරන්නාහු තර්කය දෙවනකාරණයයි කියති, මෙධාවීවූ පණ්ඩිත විඥපුරුෂතෙම මේ අවිරුද්ධ තර්කවශයෙන් ද්විප්‍ර කාරවූ ගැණීම්දැන ආජානනයකොට

* "අපණ්ණකං ඨානමෙකෙ"
† "තංගණ්හෙය්‍යද පණ්ණකං" සිංහල පොත්වල.

තං විඤ්ඤූහි පසත්ථං වණ්ණිතං යථා කථඤ්චි අවිරොධකරං අපණ්ණකං අවිරුද්ධගාහං යෙව භණෙය්‍ය, තක්කං යථාතක්කගාහං පතිවිස්සජ්ජෙය්‍යාති, ඉමිස්සා ගාථාය අත්ථඤ්ච අධිප්පායඤ්ච සල්ලක්ඛෙත්වා අත්තනො පඤ්ඤානුරූපෙන විචාරෙත්වා අත්තනො හිතත්ථායයෙව ධාරෙතබ්බං.

එත්තකම්පි ධාරෙන්තෙන සක්කා සබ්බත්ථකිච්චෙසු පයොජෙත්වා අත්තනො පතිට්ඨං කාතුං, තස්මා ඉධකුලපුත්තෙහි සප්පුරිසෙහි අත්තනො අත්ථං සම්පස්සමානෙහි සුට්ඨුවිචාරෙත්වා ඨාතබ්බන්ති සබ්බංහියථා සංවණ්ණිතං සුගතවිදත්ථිවිධානං අපණ්ණකපටිපදාය පරියාපන්නංයෙව, විනයක්ඛන්ධෙහි ධාරෙතබ්බයුත්තකංහොති අත්තනො සීලස්ස සොධනත්ථාය, සීලංහි සුපරිසුද්ධං සමාධිස්ස උපකාරකං හොති, තථා සමාධිපඤ්ඤාය, පඤ්ඤාචිත්තවිසුද්ධියා වුත්තංහෙතං භගවතා, සීලපරිභාවිතො සමාධිමහප්ඵලොහොති, මහානිසංසො සමාධිපරිභාවිතා පඤ්ඤාමහප්ඵලාහොති, මහානිසංසා, පඤ්ඤාපරිභාවිතංචිත්තං සම්මදෙව ආසවෙහි විමුච්චති, සෙය්‍යථීදං කාමාසවා භවාසවා අවිජ්ජාසවාති. තස්මා ඉධ අත්තනො සද්ධානුරූපෙන සීලං පරිපූරෙතබ්බං සමාධිභාවෙතබ්බො පඤ්ඤාභාවෙතබ්බා, එවං මනුස්සත්තභාවො අම්හෙහි පටිලද්ධො නිරත්ථකො න හෙස්සති.

---

ඒ නුවනැත්තන් විසින් පසසනලද වර්ණනාකරණලද යම්කිසි ලෙසකින් අවිරොධකරවූ අපණ්ණක සංඛ්‍යාත අවිරුද්ධග්‍රාහයම ගන්නේය තර්කසංඛ්‍යාත තර්කයවූ පරිද්දෙන් ගැණ්මවනාහී හරින්නේසි, මේ ගාථාවේ අර්ථයද අභිප්‍රායද සලකා තමාගෙ නුවනට සුදුසු පරිද්දෙන් සොයා තමහටහිතපිණිසම දැරියයුතුයි.

මෙතෙක්දරන්නහු විසින් ද සියලුතන්හී කෘත්‍යයෙහි යොදා තමහට ප්‍රතිෂ්ඨාවක්කරන්ට හැක්කේය, එසේහෙයින් මෙහිදී සත්පුරුෂවූ තමන්ගේ අර්ථය දකිනුලබන කුලපුත්‍රයන්විසින් මනාව සොයා පිහිටියයුතුයි, සියලුම සුදුසුපරිද්දෙන් වර්ණනාකරණලද සුගත්වියත් විධිය අවිරුද්ධප්‍රතිපත්තියෙහි ඇතුලත්වූයේමැයි, තමාගෙ සීලසොධනයපිණිස විනයදන්නවුන් විසින් දැරියයුත්තේවෙයි, සිල්වනාහී ඉතා පිරිසිදුවූයේ සමාධියට උපකාරවෙයි, එසේ සමාධිය ප්‍රඥාවට උපකාරවෙයි. ප්‍රඥාව චිත්තවිසුද්ධියට උපකාරවෙයි, මේවනාහී බුදුන්විසින්වදාරණලද්දේය, සීලයෙන් පරිභාවිතවූ සමාධිය මහත්ඵලවෙයි, මහඅනුසස්වෙයි, සමාධියෙන් පරිභාවිත ප්‍රඥාව මහත්ඵලවෙයි, මහානිසංසවෙයි, ප්‍රඥාවෙන්පරිභාවිත සිත මනාකොටම ආශ්‍රවයන්ගෙන් මිදෙයි, ඒ කවරේද? කාමාශ්‍රවයෙන්ද භවාශ්‍රවයෙන්ද අවිද්‍යාශ්‍රවයෙන්දැයි, එසේහෙයින් මෙහි තමාගෙ ශ්‍රද්ධාවට යොග්‍ය පරිද්දෙන් සිල්පිරියයුතුයි සමාධියවැඩියයුතුයි ප්‍රඥාව වැඩියයුතුයි මෙසේ ඇතිකල්හී අපවිසින් ප්‍රතිලබ්ධවූ මිනිසත්බව නිරර්ථකනොවන්නේය.

* තුමෙහ ගොපෙථ අතතානං ඛණෙණාවෙමා උපච්චගා,
ඛණාතීතාහි සොචනති නිරයමහි සමප්පිතා, ති.

සනතිමඤෙඤ එකචෙචබාලා දුමෙමධා අසසධා අතිමොමුහා ගහ ඨාපි පබබජිතාපි ආචිණණකපපවාදිනො සතාමංකුජඣිත්වා පරිභා සිසසනති.

අපපසීදිත්වා අතතතාම න වාචං නිචඡාරෙසසනති, අයං අකාලඤඤූ අකාලවාදී කුතොදානි විනයවජජ පටිපතතා,? කො අඤෙඤා ඉමිනා සුගතපමාණ විධානෙන; ? එතරහිබො ආධුනිකා ...නො ජාතා? න පොරාණකානං පුතතාවා නතතාරොවා භවනති කිං ඉමෙපොරාණකානං සෙඨා භවිසසනතී ති'? තඤ්හි කත්ථචියුතතං, කත්ථචි නයුතතං, සොහි භගවා අම්හාකං සත්ථා ධමමවාදී විනයවාදී ධමෙමසුකොවිදො,නනු භගවතා ආලවකපඤ්හං විසසජෙජනෙනත එවං වුතතං.

“සඬිධවිතතං පුරිසසසසෙඨං ධමෙමා සුචිනෙනා සුඛමාවහාති,
සච්චංහවෙ සාධුතරං රසානං පඤඤාජීවිං ජීවිතමාහු සෙඨනති”

අපරම්පි භගවතා වුතතං.

---

තොපි ආත්මයරකු, හෙවත් චක්ෂුරාදී සදොරපියාලා සිහිනැමති දොරපාලයා එලවාසිටුවාලා බාහිරායතනයන් සදෙනා විසින් අධ්‍යාත්මිකායතනයන් සදෙනාට උපඝාතනයක් නොවනලෙස සකස් කොට තොපගෙසිතරකු, යම්හෙයකින් බුද්ධොත්පාදක්ෂණය ඉක්මුනාහු නිරයෙහි ඉපිද බොහෝකලක් සොකකෙරෙද්ද එහෙයින් අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්තවූ පරමදුලීභවූ බුද්ධොත් පාදක්ෂණය එකාන්තයෙන්ම නොඉක්මෙව්. ඇතැම් බාලවූ දුප්‍රාඥ සැදැහැනැති ඉතාමුලාවූ ආචීර්ණකල්පය කියන්නාවූ ගෘහස්ථයෝද පැවිද්දෝද ඇත්තාහුයයි සිතමි, ඔවුහු මටකිපී පරිභාෂණය කෙරෙති.

අප්‍රසාදකොට අප්‍රිය වචනද පිටකෙරෙති, මේ තෙම අකාලඥය අකාලවාදිය; මෙකල විනය වරදවූ පිළිවෙත්කොයින්ද? මේ සුගත් ප්‍රමාණවිධියෙන් කවරවැඩෙක්ද? මෙකල ආධූනිකයෝ කොයින් උපන්නෝද? පුරාතනයන්ගෙපුත්‍රයෝහෝ මුනුබුරෝහෝනොවෙති කිමෙක්ද? මොහු පුරාතනයන්ටවඩා ශ්‍රෙෂ්ඨයෝ වන්නාහුදැයි, ඒ සුගත් වියත් විධියවනාහි කිසිතැනකයුතුය, කිසිතැනක අයුතුය, ඒ භාග්‍යවතුන්වහන්සේ අපගෙ ශාස්තෘය, ධර්මවාදිය, විනයවාදිය, ධර්මයෙහිචතුරය,ආලවකයාගේ ප්‍රශ්න විසර්ජනයකරණභාග්‍යවත්හු විසින් මෙසේ වදාරණ ලද්දේනොවේද.

“මෙලොව ජීවත්වන පුරුෂයාහට ශ්‍රද්ධාධනය ශ්‍රෙෂ්ඨය, රැස්ක
...ලද කුශලය සැපඑළවන්නේය, රසයන්අතුරෙන් සැබෑව ඒ
...තයෙන්ම යහපත්වේ ප්‍රඥාජීවිතයෙන් යුක්තව ජීවත්වීමශ්‍රෙෂ්ඨ
...යති,” භාග්‍යවත්හු විසින් අනික්කාරණයකුදු වදාරණලදී.

---

* ‘එවං ගොපෙථ අතතානං’ සමහර.

“නත්ථිඅත්තසමං පෙම නත්ථිධඤ්ඤ සමං ධනං,
නත්ථිපඤ්ඤා සමා අංගා වුඪිට පරමා සරාති.”

ඉදං නිදස්සනං.

එකස්මිං කිර කාලෙ එකා සෙට්ඨිධීතා සාමිකෙන අරඤ්ඤං නෙත්වා විහෙඨීයමානා මරණභයතජ්ජිතා එවං චින්තෙසි, පඤ්ඤා නාම න පචිත්වා ඛාදනත්ථාය කතා, අපිච ඛො විචාරනත්ථාය කතා, හන්දාහං සාමිකස්ස කත්තබ්බං ජානිස්සාමීති, සා යෙන කෙනචි උපායෙන සාමිකං පලොභෙත්වා අත්තනො සාමිකං වඤ්චෙත්වා සයමෙව මරණතො මුත්තා.

අපරභාගෙපි බුද්ධසාසනෙ සද්ධං පටිලභිත්වා පරමත්ථං සම්පාපුණීති, එවං සබ්බකිච්චෙසු පඤ්ඤාය විචාරණං සෙට්ඨං පවරන්ති බුද්ධාදීහි පසංසිතං.

පඤ්ඤා සෙට්ඨාව ලොකස්මිං බුද්ධාදීහි පසංසිතා,
නත්ථිපඤ්ඤා සමා ආභා මොහතම විනොදනා.

එවං විසෙසතො ඤත්වා පඤ්ඤාකිච්චං පයොජයෙ,
අලජ්ජිතායෙ ලජ්ජන්ති ලජ්ජතා යෙ න ලජ්ජරෙ.

---

“තමාහාසම ප්‍රෙමකටයුත්තක් නැත්තේය, ධාන්‍යසමවූ වස්තුවක් නැත්තේය, ප්‍රඥාවසමවූ ආලොකයක් නැත්තේය, වෂ්ඨාවවැනි අධිකවූ ජලයක්නැත්තේය,” මේ උදාහරණයකි.

එක්කලෙක්හී වනාහි එක් සිටුදුවක්තොමෝ සාමියෙකු විසින් වනයට ගෙණගොස් වෙහෙසනුලබන්නේ මරණභයින් තැතිගන්නාලදුව මෙසේ සිතූය, ප්‍රඥාවනම් පිසකෑමපිණිස නොකරණලද්දීය, තවද වනාහි සෙවීම පිණිස කරණලද්දීය, එහෙයින් මම සාමියාහට කටයුත්තක් දන්නෙමියි, ඈ යම්කිසි උපායකින් සාමියා පොළඹවා තමාගේ සාමිහු රවටා තමාම මරණින්මිදුනා.

මැතකාලයෙහි බුදුසස්නෙහි ශ්‍රද්ධාප්‍රතිලාභයකොට පරමාත්වයවූ නිවනට පැමිණීයායි. මෙසේ සියලු කෘත්‍යයෙහි නුවණින්සෙවීම ශ්‍රෙෂ්ඨය උතුමැයි බුද්ධාදින්විසින් පසසනලද්දේය.

ලොකයෙහි ප්‍රඥාවමශ්‍රෙෂ්ඨය බුද්ධාදීන්විසින් පසසනලද්දීය ප්‍රඥාවහා සමාන මොහාන්ධකාරය දුරුකරන්නාවූ ආලොකයක් නැත්තේය.

මේකාරණය විශෙෂයෙන්දැන ප්‍රඥාවෙන් කටයුතු යොදන්නේය, යම්කෙනෙක් ලජ්ජානොකොට යුතුතන්හී ලජ්ජාකෙරෙද්ද, ලජ්ජා කටයුතුතන්හි ලජ්ජානොකෙරෙද්ද.

අභයෙ භය දස්සිනො භයෙච අභය දස්සිනො
අවජ්ජෙ වජ්ජමතිනො වජ්ජෙච අවජ්ජ දස්සිනො.
මිච්ඡාදිට්ඨි සමාදානා සත්තා ගච්ඡන්ති දුග්ගතින්ති.

බුද්ධස්සභගවතො පරිනිබ්බාණතො තිසතාධිකානං චිනනං වස්ස සහස්සානං උපරි අට්ඨාසීතියා සංවච්ඡරෙසු අතික්කන්තෙසු පොට්ඨපාදමාසෙ අයමපිමයා ගන්ථිත්වා තස්මිංයෙවමාසෙ නිට්ඨාපිතා.

යෙතෙ පච්ඡාජාතා පුරෙවාසීතා මම පවත්තිං සුත්වා මං අපස්සන්තා තත්ථතත්ථ ආරබ්භ අනුස්සරෙය්‍යුං, තෙඉමං පස්සිත්වා එව ජානන්තු, යොඉමංපස්සති සොමං පස්සති යොඉමං පඤ්ඤාදය විචාරෙති සොමයාසද්ධිං කථාසල්ලාපං කරොති නාමාති.

පඤ්ඤාදාඅග්ගව්හයො සොහං පවර නිවෙසනාමකෙ,
වසන්තො රාජකාරාමෙ කොසිඤ්ඤ නගරෙ රම්මෙ.
යාචිතො කකුසන්ධෙන ජාතුස්සාහො සුසාදරො,
නානා කාරණ යුත්තම්පි ආහරිත්වා නිදස්සිතුං.
තස්ස ජෙට්ඨසන මාගම්ම අථො සබ්‍රහ්ම චාරිණං,
බහුන්නං සාත්ථකත්තඤ්ච පටිච්ච තුට්ඨමානසො.

---

භය නොකළ යුතුතන්හී භය දක්නාසුලුවූද භයකළමනා තන්හි අභය දක්නාසුලුවූද නිරවද්‍යයෙහි සාවද්‍යය යන බුද්ධිය ඇත්තාවූද, සාවද්‍යයෙහි නිරවද්‍යයයි දක්නාසුලුවූදතුච්ඡවූ විපරීතදෘෂ්ටිගෙණ වසන්නාවූ සත්වයෝ නරකාදිදුගතියට යන්නාහුයි.

භාග්‍යවත්වූ බුදුන්ගේ පිරිනිවීමෙන් දෙදහස්තුන්සිය අටඅසූවක් හවුරුදු ඉක්මුනුකල්හී බිඞිරමාස යෙහිදී මේපොත මාවිසින් ග්‍රන්ථනයකොට එමමාසයෙහිදී නිමකරණලද්දේය.

පසුවඋපන්නාවූහෝ පෙරසිටියාවූහෝ යම්ඒ කෙනෙක් මාගේ විත්තීඅසා මානොදක්නාහු එසේඑසේ මා අරබයා සිහිකරන්නාහු නම් ඔව්හු මේපොතබලා මෙසේදනිත්වා, යමෙක් මේපොතබලාද ඔහුමාබලයි' යමෙක් මෙයනුවනින් සොයාද ඔහු මාහාසමග කතා බස්කෙරේ නම්වේ.

සිත්කලුවූ රතනකොසින්දනගරයෙහි පවරනිවෙසනම් රාජකාරාම විහාරයෙහි වාසය කරණ පඤ්ඤාදාඅග්ග නම් ස්ථවිරවූඒමම.

කකුසඳනම් ස්ථවිරයන්විසින් ආරාධනා කරණලදුවහටහත් උත්සාහඇතිව මනාආදරඇතිව උදාහරණ කිරීමට යුතු නොයෙක් කාරණාදළුලවා.

ඔහුගේ ආරාධනාවට පැමිණ නැවතබොහෝ සබ්‍රම්සරුන්ට සාර්ථකබවනිසාද සතුටුසිත්ඇත්තේ.

නානා ඨානෙහි සාරත්‍ථං ආහරිත්‍වාච සාධකං,
ගන්‍ථිත්‍වාව ඉමං ගන්‍ථා අාසසම් අභිකඛතං.
යෙයෙ දෙවා මනුස්සාවා ධම්මිකා ධම්මවාදිනො,
සාමං කතංච මඤ්ඤිත්‍වා අනුමොදන්තු සාධවො.
අමහාකර පතතිදානමහි පතතිකා හොන්තු පාණීනො
වුඩිං විරූළ්හි වෙපුල්ලං පපෙපාන්තු බුධසාසනෙ.
තෙස භුමමාදයො සබෙබ පසනනා බුධ මාමකා,
යථා නො ධම්මිකොරාජා චිරං ධරති සොත්‍ථිනා.
අථො පාවචනං සත්‍ථු චිරං ලොකෙච දිප්පති,
තථා ධමෙමන ආරක්ඛං කරොන්තු අත්‍ථකාමිනො.
අහො සුගතවිදත්‍ථි චිරං ලොකෙ අපාකටා,
පුන අක්ඛායති දනි ඉමිනාව සමෙති සා.
අහො අනිච්චා සඞ්ඛාරා තෙකාලිකා අසණ්ඨිතා,
සකාලාකාලිකා සබෙබ හුත්‍වා හුත්‍වාන හොනතිතෙ.
තංකුතෙත්‍ථ ලබ්භා ලොකෙ යදුප්පනනං නනස්සති,
එවං භූතෙසු වෙතෙසු සාධු තත්‍ථාප්ජ්ජු පෙක්ඛණා.

---

නානාස්ථානවලින් සාරාර්ථද සාධකද එලවා මේපොත ග්‍රන්ථනය කොටම මෙයින්වැඩකැමතිවන්නාවූ යොගාවචරයන්ට දෙන්නෙමි

යම් දෙවිකෙනෙක් හෝ මනුෂ්‍යකෙනෙක් හෝ ධර්මයෙහි හැසිරෙන්නෝද ධර්මවාදීහුද ( ඒ ) සත්පුරුෂයෝ මෙයතමන්විසින්කරණලද දෙයක්මෙන් අනුමෝදන්වෙත්වා.

ප්‍රාණීහු අපගේ පත්තිදානයෙහි පින්අනුමෝදන් වන්නාහු වෙත්වා බුදුසස්නෙහි වෘඩියටද මුල්ගැන්මටද විපුලත්වයටද පැමිණෙත්වා

ඔවුන් අතුරෙහි භූම්‍යාදී සුළුවූ සියලුදෙවියෝ ප්‍රසන්නවූවාහුද බුදුන් කෙරෙහි මමත්වය ඇත්තාහුද යම්සේ අපගේ ධාර්මිකරජ බොහෝ කලක්සුවසේ ජීවත්වේද එසේවෙත්වා, නැවතබුධශාසනය බොහෝ කලක් ලෝකයෙහි බබලාද, එසේම අර්ථකාමීහු දහැමින් සෙමින් ආරක්‍ෂාකරත්ව , අනේ සුගත්වියත බොහෝකලක් ලෝකයෙහි අප්‍රකටවීය, නැවත දැන් කියනුලැබෙයි, ඒ සුගත්වියත මේ කියන ලද ප්‍රමාණයහා සමවෙයි.

අනේ සංස්කාරයෝ අනිත්‍යයෝය, තුන්කල්හි එකාකාරව නොසිටින්නාහ, ඒ සියලු අකාලික දේවල් සකාලික යන්මෙන් වෙවිවෙවී පවතිත්, මේ ලෙව්හී උපදින සුලු යමක් නොනස්නේද එබන්දක් කොයින් ලැබියහැකිද? එහිදී මෙසේවූ මොවුන් කෙරෙහිම මැද හත්වශයෙන් බැල්ම මැනව.

අපි තෙසං නිරොධාය පටිපජ්ජන්ති සාධුකා,
තස්මාහි අත්ථකාමෙහි චින්තෙතබ්බ මභික්ඛණන්ති.
පොරාණිකෙසු ධම්මෙසු පසන්නා යුත්තවාදිනො,
යෙ ඛො ඉමං පස්සිත්වාන ඔලොකෙත්වා විචාරයුං.
අයං සුගතවිදත්ථි කථා අම්හෙහි වණ්ණිතා,
පොට්ඨපාදෙ සංවච්ඡරෙ ද්වාදසන්නම්පි ඡට්ඨමෙ.
අයං සංවච්ඡරොමාසො චතුමඞ්ගලිකො මම,
එකවාරං පවත්තෙතය්‍ය පුබ්බන්තම්පි විනොපරං.
එත්තකාව කථා අයං අසෙසා [illegible] නිට්ඨිතා
ඤාණරක්ඛිත ථෙරෙන ථෙරෙනාමරමොලිනා,
සිරිවිසුද්ධිවංසෙන ථෙරෙණාපි ච පත්ථිතා.

**සුගත විදත්ථිවිධානං නිට්ඨිතං**

---

තවද ඒ සංස්කාරයන්ගෙ නිරොධයපිණිස පිළිවෙත් පිරීම ඉතා මැනව එසේහෙයින් අර්ථකාමීන්විසින් නිතර නිතර සිතිය යුතුයි

යම්කෙනෙක් මෙයබලා දැකලා සෙව්වාහුද, ඔව්හුපෞරාණිකධර්මයෙහි පහන්යුක්තවාදී හුයි.

මේසුගත්වියත් කථාව අපවිසින් දෙසත්තෑවේඅවුරුද්දේ බිඟර මාසයෙහිදී කරණලද්දීය.

මටමේ අවුරුද්දත් මේමාසයත් චතුමඞ්ගලිකවේ, එකවරක් පවත්වන්නේය, පෙරත්නොවීය, මින්මතුත් නොවන්නේය.


මෙපමණක්වූම මේකථාතොමෝ නිරවශෙෂ වශයෙන් නිමිය, ඤාණරක්ඛිත නම් ස්ථවිරයන් විසින්ද අමරමොලි ස්ථවිරයන් විසින්ද සිරිවිසුද්ධිවංස ස්ථවිරයන් විසින්ද මිටආධාර කරණලද්දීය.

**සුගතවිදත්ථිවිධානය නිමියෙ.**

# ශෝධා පත්‍රය

| පිටේ | පෙළේ | වරද | නිවරද |
|---|---|---|---|
| 3 | 12 | මජ්ජිමස්ස, | මජ්ඣිමස්ස. |
| 4 | 9 | මජ්ජිමස්ස, | මජ්ඣිමස්ස, |
| 4 | 9 | හත්ථප්පමාණං, | හත්ථප්පමාණා. |
| 8 | 1 | සරීරප්පමාණන, | සරීරප්පමාණෙන. |
| 16 | 5 | මජ්ජිම, | මජ්ඣිම. |
| 18 | 3 | හවුදුරු, | හවුරුදු. |
| 20 | 18 | සතියෙක්, | සතිසෙක්. |
| 21 | 3 | විදත්ථිං' | විදත්ථි. |
| 21 | 17 | ඉස්ඹ | ඉස්බ. |
| 22 | 11 | අනුකා, | අනුකලා. |
| 22 | 24 | ගුණාකොට, | ගුණකොට. |
| 23 | 8 | සුත්තා, | සුත්තා. |
| 23 | 10 | අඞ්ගුලප්පමානිණො, | අඞ්ගුලප්පමාණො. |
| 23 | 11 | යට්ඨාලඩානී, | යට්ඨාලඩානි. |
| 24 | 26 | දඨාවෙ, | දඨාවේ. |
| 24 | 33 | රියනක් | රියනක්. |
| 27 | 7 | හත්ථංදියඩ්ඪ, | දියඩ්ඪහත්ථං. |
| 29 | 9 | වුත්තවචනෙ, | වුත්ත වචනෙන. |
| 31 | 18 | මහාපුරුෂයාන්, | මහාපුරුෂයානන්. |
| 32 | 24 | නොඑළබෙයි, | නොඑළඹෙයි. |
| 32 | 36 | ආසථානයෙහි, | අසථානයෙහි. |
| 33 | 20 | ආසථානයෙහි, | අසථානයෙහි. |
| 40 | 15 | විදත්ථ, | විදත්ථි. |
| 41 | 10 | තිගුණීකත, | තිගුණීකතා. |
| 41 | 13 | නිසීදන., | නිසීදනං. |
| 42 | 2 | ඉමං, | ඉමස්මිං. |
| 42 | 33 | පිළිකවක්, | පිළිකයක්. |
| 42 | 33 | නැඹින්, | නැබින්. |
| 44 | 8 | ඡෙදකං, | ඡෙදනකං. |
| 44 | 17 | තො, | ඉතො. |
| 44 | 35 | දිගපුලුලින්, | දිගපුලුලින් ඡට. |
| 46 | 7 | අනත්තතො, | අත්තතො. |
| 46 | 39 | නෙවන්නේය, | නොවන්නේය. |
| 47 | 7 | පරිභසිස්සන්ති, | පරිභාසිස්සන්ති. |
| 47 | 34 | ජීවන්වන, | ජීවත්වන. |
| 47 | 36 | ප්‍රඥජීවිතයෙන්, | ප්‍රඥජීවිතයෙන්. |
| 47 | 36 | ජීවත්වීම, | ජීවත් වීම. |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු